

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
හතලිස් තුන්වන වාර්ෂික වාර්තාව

பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
நாற்பத்து மூன்றாவது வருடாந்த அறிக்கை

UNIVERSITY GRANTS COMMISSION
FORTY THIRD ANNUAL REPORT

2021

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
හතලිස් තුන්වන වාර්ෂික වාර්තාව

2021

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු



දැක්ම

වඩාත් යහපත් ශ්‍රී ලංකාවක් / ලෝකයක් සඳහා දැනුමෙන් නායකත්වය සැපයීම



මෙහෙවර

සමාජ, පාරිසරික සහ මුල්‍යමය වශයෙන් ඉලක්ක ජය ගැනීමට උනන්දුවක් දක්වන දැනුමැති නායකයින් බිහිකිරීමට, රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ශක්තිමත් සම්බන්ධීකරණ පද්ධතියක් තුළින් ඉහළ බලපෑමක් ඇති පර්යේෂණ, ගුණාත්මක ඉගැන්වීම් සහ කර්මාන්ත කටයුතුවල නියැලීමට සහ උසස් තත්ත්වයේ ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි සහ වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීමට පහසුකම් සලසාදීමට අවශ්‍ය කළමනාකරණය සහ යහපාලනය ඇති කිරීම.



අරමුණු

- රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට ප්‍රවේශය සමානව වැඩි කිරීම.
- 21 වන සියවසේ පුරවැසියෙකු සඳහා අවශ්‍ය යැයි සැලකෙන සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීමෙන් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සඳහා පහසුකම් සැපයීම.
- ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙනුම් කටයුතු වල නියැලීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුලින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතින්වල විශිෂ්ඨත්වය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ගුණාත්මක මානව සම්පත්, විශිෂ්ඨ පහසුකම් සහ තිරසාර/හරිත සංකල්ප හරහා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කටයුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රමිතිය සහතික කිරීම.
- ආරක්ෂිත සහ ස්ථාවර පද්ධති සහ අන්‍යොන්‍ය ඵලදායී පාර්ශවකරුවන්ගේ සබඳතා හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

සභාපතිතුමාගේ පණිවුඩය



2021 වර්ෂයේ දී, කොමිෂන් සභාව විසින් ඇතැම් ප්‍රධාන කර්තව්‍යයන් අනාකූලනය කරනු පිණිස ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් ගෙන ඇති අතර සියලුම ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් පසුබිම සකස් කරන ලදී. මෙම වෙනස්කම් ජනාධිපති කාර්ය සාධක බලකාය සහ උසස් අධ්‍යාපනය පිළිබඳ අණු මණ්ඩලයේ මැදිහත් වීමෙන් කෙටුම්පත් කර ක්‍රියාත්මක කරමින් පවති. තවද මෙම ප්‍රතිසංස්කරණ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශය ප්‍රතිසංස්කරණය කිරීමේ 2020-2022 ක්‍රමෝපාය සැලසුම හා සමගාමී වන අතර රජයේ නව උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය ලබා දෙනු ලබයි.

උපක්‍රම 9කින් සමස්ථ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) 50කට යටත් කර ඉතාමත් සරල පසුබිමක සියලුම කාර්යයන් වසර 5ක් තුළ නිමා කිරීමට සැලසුම් සකස් කර ඇත.

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල සඳහා 2019/2020 අධ්‍යයන වර්ෂය යටතේ බඳවා ගත් සිසුන් ප්‍රමාණය 10,027කින් ඉහළ නැංවිය. එය මෙතෙක් අධ්‍යයන වර්ෂයකදී විශ්වවිද්‍යාල ප්‍රවේශයේ සිදු වූ වැඩිම ඉහළ නැංවීම වේ. තව ද ලාංකීය සිසුන්ට උසස් අධ්‍යාපනය ලබා ගැනීමට ඇති අවස්ථා තවදුරටත් පුළුල් කරමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලට අනුයුක්තව 'දන්ත වෛද්‍ය පීඨයක්' සහ 'නාගරික හා ජලජ ජෛවසම්පත් පීඨයක්' ස්ථාපනය කරන ලදී. මෙම වසර සඳහා නව පාඨමාලා 16 ක් අලුතෙන් හඳුන්වා දීමට ද කටයුතු කරන ලදී. මීට සමගාමීව විශ්වවිද්‍යාල ආචාර්යවරුන් 500ක් බඳවා ගැනීම සිදු කරනු ලැබූ අතර මෙය සෑම ඉදිරි වර්ෂ තුනකදීම අඛන්ඩව සිදු කිරීමට බලාපොරොත්තු වේ.

   තවද 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා යෝජිත සිසුන් බඳවා ගැනීමේ වැඩිවීම, පෙර 2019/2020 අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 1782 කි. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා නව අධ්‍යයන පාඨමාලා 16ක් හඳුන්වා දෙන ලදී. ඊට අමතරව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට දන්ත සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව, ඉංග්‍රීසි දෙවන භාෂාව ලෙස ඉගැන්වීම යන පාඨමාලා හඳුන්වා දෙන ලදී. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා පිළිවෙළින් යාපනය විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය තුළ ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය යන පාඨමාලා හඳුන්වා දෙන ලදී.

2. 2020 වසරේ විවෘත විශ්වවිද්‍යාලයට සිසුන් 10,000ක් ඇතුළත් කර ගැනීමටත්, ඉදිරියේදී සෑම වසරකම එවැනි සිසුන් ප්‍රමාණයක් බඳවා ගැනීමටත් යෝජනා විය. විවෘත විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පීඨය සඳහා සිසුන් බඳවා ගැනීම වැඩි කර පරිසණක පහසුකම් ලබා දෙන ලදී. පාඨමාලා ගාස්තුව හා ඇතුළත් වීමේ ගාස්තුව ණය මුදලක් වශයෙන් ලබා දීමට කටයුතු කරන ලදී. මෘදුකාංග ඉංජිනේරු උපාධි වැඩසටහන සඳහා සිසුන් 2400 ක් 2021 වසරේ ලියාපදිංචි වී ඇත.

3. 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ සිසුන් සඳහා සහනදායී ණය පහසුකම් යටතේ මහජන බැංකුවේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ලැප්ටොප් පරිසණක ලබා දීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු ආරම්භ කර ඇත.

4. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ පවතින බොහෝ ගැටළු නිරාකරනය කරනු වස් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා පියවර ගැනීම සිදු කරන ලදී.

5. හෙද විශ්වවිද්‍යාල පිහිටුවීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික හා පසුබිම සකසා අවසන් කොට ඇත. ඊට සමගාමීව විෂයමාලා සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කරයි.

6. ගුරු පුහුණු විශ්වවිද්‍යාල පිහිටුවීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික ලේඛන සකසා අවසන් කිරීම.

7. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලය ලෙස ස්ථාපනය කිරීම සහ ඊට අදාළ නව පාඨමාලා බොහොමයක් හඳුන්වා දීම.

8. වව්නියා මණ්ඩපය විශ්වවිද්‍යාලයක් ලෙස පරිවර්තනය කිරීමට අවශ්‍ය නෛතික ලේඛන හා ආර්ථික පසුබිම සකසා අවසන් කිරීම. වව්නියා මණ්ඩපය 2021 අගෝස්තු 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකාවේ වවුනියාව විශ්වවිද්‍යාලය ලෙස උසස් කරන ලදී.

9. ථේරවාද බෞද්ධ අධ්‍යයනය සඳහා ජාත්‍යන්තර පර්යේෂණ විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට ගෙන ඇති මුලපිරීම්.

10. මානව හා සමාජ විද්‍යා, කලා හා සෞන්දර්ය පීඨවල ඉගෙනුම ලබන සිසුන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහල නැංවීම උදෙසා රුපියල් මිලියන 400ක් වැය කොට අදාල විශ්වවිද්‍යාලයන් හී තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශ හා පරිසණක විද්‍යාගාර පිහිටුවා, එතුළින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිසණක අධ්‍යනායතනය (UCSC) මඟින් පිරිනමන තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව හැදෑරීමට අවකාශය සැලසීම. එමඟින් රැකියා වෙළඳපොළට පිවිසීමට අවස්ථාව උදාවේ.

11. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිසණක අධ්‍යයනායතනය (UCSC) හා එකතුව නවක සිසුන් සඳහා ඉංග්‍රීසි පාඨමාලාවක් මාර්ගගත ක්‍රමය ඔස්සේ හැදෑරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.

12. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිසණක අධ්‍යයනායතනය (UCSC) හා එකතුව නවක සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් මාර්ගගත ක්‍රමය ඔස්සේ හැදෑරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.

13. පුරවර විශ්වවිද්‍යාල (City Universities) පිහිටුවීම සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයනය අවසන් කොට එම ව්‍යාපෘතියෙහි ඉදිරි සැලසුම් සඳහා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීම.

    ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ මෙම නගර විශ්වවිද්‍යාල රජය සතු තනි කොටස් හිමි සමාගම් ලෙස ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. මෙම ආකෘතිය යටතේ 1 වන නගර විශ්වවිද්‍යාලය කෑගල්ලේ ස්ථාපිත කෙරේ.

14. මුළු විශ්වවිද්‍යාල පද්ධතියේම මානව සම්පත් කළමනාකරණය එක පද්ධතියකට ගෙන ඒම.

15. ශ්‍රී ලංකාවේ පළමු වතාවට සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල දේශන / වැඩමුළු හා විභාග මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීම.

පුළුල් සහභාගීත්වය සහ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් ඒ සඳහා පහසුකම් සැලසීමට දේශීය හා ගෝලීය වශයෙන් පිළිගත් නව හා නව්‍ය පාඨමාලා සහ උපාධි වැඩසටහන් හඳුන්වා දීමට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කරන ලදී. ඒ අනුව නව පාඨමාලා හඳුන්වා දෙන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යයන කාර්ය මණ්ඩලයට, විශේෂයෙන් නවක විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා අවස්ථා නිර්මාණය කර දීමට කටයුතු කරන ලදී.

විද්‍යාර්ථීන් ආචාර්ය උපාධි සඳහා විදේශ විශ්වවිද්‍යාලයන්හි හා හින්න ආචාර්ය උපාධි වැඩසටහන්වල ලියාපදිංචි වීමේ උනන්දුව ඉහළ නැංවීම පිණිස පර්යේෂණ සඳහා අරමුදල් සම්පාදනය ඉහළ නංවන ලදී. මෙය විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට උපකාරී වනු ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සිය විෂය පථයට අයත් උසස් අධ්‍යාපන ආයතනවල (HEIs) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සාමාජිකයින්ට ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීමට හැකියාව ලැබෙන පරිදි ඔවුන්ට මූල්‍ය ආධාර සපයයි. මෙම ප්‍රදාන යෝජනා ක්‍රමයේ පරමාර්ථය වනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා සියළුම විෂයන්වලට සම්බන්ධ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීමට මූල්‍යමය වශයෙන් සහාය වීම යි.

2020/2021 අධ්‍යයන වර්ෂයේ අධ්‍යයන පාඨමාලා සඳහා වන අවම ඉසෙඩ් අගයන්, අයදුම්පත් කැඳවූ දින සිට මාස තුනක් (03) ඇතුළත නිකුත් කරන ලදී.

2020 මාර්තු 13 වැනි දින සිට විශ්වවිද්‍යාල වසා දැමීමෙන් පසු ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN) හරහා විශ්වවිද්‍යාලවල සියලුම සිසුන් සහ ආචාර්ය මණ්ඩලය සඳහා නොමිලේ දත්ත ප්‍රවේශය ලබා දෙමින් මාර්ගගත අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක විය. ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය හරහා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මාර්ගගත අධ්‍යාපනය සඳහා අවශ්‍ය සියලු පහසුකම් සපයන ලදී. දැනට, LEARN.Zoom: හරහා දෛනික රැස්වීම් 5000ක් පමණ සමඟින් උපරිම මට්ටමින් දෛනික සහභාගිවන්නන් ගණන 250,000ක් (සමගාමී පරිශීලකයින් 100,000ක් පමණ සමඟ) වේ. විශ්වවිද්‍යාලවල තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කරන ලද අතර එක් එක් විශ්වවිද්‍යාලය සඳහා මධ්‍යගත ඉගෙනුම් කළමනාකරණ පද්ධති සහිත ආධාරක පද්ධතියක් සහතික කරන ලදී. විශ්වවිද්‍යාල පූර්ණ ධාරිතාවයෙන් මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් පරීක්ෂා කිරීම සඳහා සියලුම ආයතනවල සමීක්ෂණ සිදු කර සම්පත් අවශ්‍යතා හඳුනා ගන්නා ලදී. පවතින පහසුකම් ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතියට රුපියල් මිලියන 400ක් ලබාදී ඇත. අඛණ්ඩව පූර්ණ ධාරිතාවයෙන් යුතුව ඉගැන්වීම, ඉගෙනීම සහ විභාග කටයුතු සිදු කිරීමට වුවමනා වන අවශ්‍යතා හඳුනා ගැනීමට, විශේෂඥයන් අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් සිටි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

පටුන

		පිටු අංකය
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු	i
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය	ii
	පටුන	v
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව [UGC]	
	හැදින්වීම	vii
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය	vii
	විධායක සාරාංශය	viii
	වගු ලැයිස්තුව	xvii
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංවිධාන රූ සටහන	xix
01	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය	1
02	විශ්වවිද්‍යාල කළමනාකරණය	2
03	ආයතන	7
04	විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම	11
05	අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම	26
06	මූල්‍ය පරිපාලනය	37
07	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව	44
08	මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය	46
09	යටිතල පහසුකම් සංවර්ධනය	50
10	තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු(QAC)	52
11	තොරතුරු තාක්ෂණ සහාය	57
12	නීති කටයුතු	60
13	විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB).....	63
14	මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු	63
15	ප්‍රකාශන සහ වාර්තා / සංවර්ධන ක්‍රියාකාරකම් / විශේෂ පැවරුම්	66
16	ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය	67
17	විශ්වවිද්‍යාල සිසුන් සඳහා මූල්‍ය ආධාර ලබා දීම	70
18	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම	73
19	විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල	78
20	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	80
21	2021 වර්ෂය තුළ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි	82
22	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021.....	85
23	විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021.....	101
24	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021.....	111
25	තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව 2021.....	123

26 ඇමුණුම්

I. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ඨතාවයක් ඇති දැක් වූ සිසුන් සඳහා වන විශේෂ ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාන් සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව..... 149

II. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාවන් සඳහා තේරුණු ශිෂ්‍ය සංඛ්‍යාව
[දිස්ත්‍රික් සහ අධ්‍යයන පාඨමාලාවන් අනුව වර්ගීකරණය (නව සහ පැරණි විෂය නිර්දේශය)] 153

III. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාවන් සඳහා තේරුණු ශිෂ්‍ය සංඛ්‍යාව
[පීඨ වලට අනුව දීප ව්‍යාප්ත සහ දිස්ත්‍රික් කුසලතාවන්හි වර්ගීකරණය (නව සහ පැරණි විෂය නිර්දේශය)] 165

IV. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය ප්‍රවේශය හා විශේෂ ප්‍රවේශයන් යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාන් සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව..... 168

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC)

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ මගපෙන්වීම හා සම්බන්ධීකරණය සඳහා කටයුතු කරන ප්‍රධානතම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) 1978 දෙසැම්බර් 22 වන දින අංක 16 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් අතරට උසස් අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, උසස් අධ්‍යාපන ආයතනවලට මුදල් වෙන් කිරීම, උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම නියාමනය හා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් සියලුම රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රගතිය සහ සංවර්ධනය සඳහා සහාය වීම අයත් වේ.

සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන ගණුන් දීමේ නිලධාරියා වන අතර කොමිෂන් සභාවේ කටයුතු දෛනිකව පරිපාලනය කිරීම හා කොමිෂන් සභා රැස්වීම්වල සභාපතිත්වය දැරීම සිදු කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධීකරණය හා අනුකූලනය පිණිස වෙන් කරන ලද රාජකාරී හා කාර්යයන් සහිත දෙපාර්තමේන්තු, අංශ හා ඒකක ඇත. විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන අතරට විශ්වවිද්‍යාල 17ක්, පශ්චාත් උපාධි ආයතන 10ක්, ආයතන 8ක් හා 1ක් මධ්‍යස්ථානයක් ඇතුළත් වේ. පාලක සභාව එක් එක් විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන අතර සනාතන සභාව අධ්‍යයන කටයුතු සම්බන්ධ උත්තරීතර සභාව වේ. විශ්වවිද්‍යාලයක සහ ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා අනුපිළිවෙළින් උපකුලපති හා අධ්‍යක්ෂ වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධානයන් ප්‍රකාරව කොමිෂන් සභාව පහත අරමුණු සමඟ ස්ථාපනය කොට ඇත:

1. ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

2. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා අදාළව පාර්ලිමේන්තුව මඟින් වෙන් කරන ලද අරමුදල් උසස් අධ්‍යාපන ආයතන අතර බෙදා දීම සහ එවැනි එක් එක් උසස් අධ්‍යාපන ආයතනය මඟින් සිදු කරන වියදම් පාලනය කිරීම.

3. උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම.

4. උසස් අධ්‍යාපන ආයතනයන් හි පරිපාලනය නියාමනය කිරීම.

5. එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම නියාමනය කිරීම, සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් හෝ යටතේ කොමිෂන් සභාව වෙත පැවරූ ආරෝපිත හෝ වෙන් කරන ලද එවැනි බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

විධායක සාරාංශය

මෙම වාර්ෂික වාර්තාව, 2021 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ක්‍රියාවට නංවන ලද කාර්යයන් සමාලෝචනය කරයි. සමාලෝචිත වර්ෂයේ මූලික වැදගත් අවස්ථා සහ ජයග්‍රහණයන්, විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුලත් කර ගැනීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, කාර්ය මණ්ඩල සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තොරතුරු තාක්ෂණ සංවර්ධනය, තත්ත්ව සහතිකකරණය, මුල්‍යමය පරිපාලනය හා කළමනාකරණය සහ විදේශ විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන සහයෝගිත්වය හා පර්යේෂණ සහයෝගිත්වය යන ක්ෂේත්‍රයන් යටතේ සාරාංශ කර ඇත.

2019-2023 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලැස්ම සමඟ 2021 වාර්ෂික වාර්තාවෙහි දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී, 2019-2023 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලසුමෙහි දක්වා ඇති ඉලක්ක, අරමුණු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs), රට තුළ පැන නගින අපේක්ෂා හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කර ගත් ආර්ථිකයෙහි මානව අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සැලකිල්ලට ගන්නා ලදි.

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත් කරන ලද අතර 2020 ඔක්තෝම්බර් මාසයේදී පැවැත්වුණු අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව, 2021 මැයි 21 සහ 2021 ජූනි 11 අතර කාලය තුළ 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්ෂකයින්ගෙන් අන්තර්ජාලය හරහා අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව සාමාන්‍ය ප්‍රවේශය යටතේ එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම අවසන් කර ඇති අතර කඩඉම් ලකුණු 2021 ඔක්තෝබර් 29 දින නිකුත් කරන ලදී. විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීම තවමත් සිදු වෙමින් පවතින අතර 2022 දී අවසන් කිරීමට නියමිතය.

කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ, 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළ විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීම අවසන් කර ඇත.

2020/2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ ප්‍රධාන තොරතුරු පහත සාරාංශගත කර ඇත.

අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව 2020/2021 **අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ සංඛ්‍යාව**	**194,297**
2020/2021 **අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කර ගැනීමට යෝජිත සංඛ්‍යාව**	**41,755** *
තෝරාගත් / බඳවා ගත් සිසුන් සංඛ්‍යාව:	
(1) **සාමාන්‍ය ප්‍රවේශය**	**42,357** **
(2) **විශේෂ විධිවිධාන**:	241

සටහන : (*) ***අතිරේක ප්‍රවේශය ද ඇතුළුව***
(**)***අතිරේක ප්‍රවේශය සහ විශේෂ විධිවිධාන හැර***

විශ්වවිද්‍යාල ප්‍රවේශය වැඩි කිරීමේ අරමුණින් 2021 වර්ෂයේ දී 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා නව අධ්‍යයන පාඨමාලා දහසයක් (16) පහත පරිදි හඳුන්වා දෙන ලදී;

අංකය	පාඨමාලාවේ නම	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
1	වෘත්තීය චිකිත්සාව	කැලණිය විශ්වවිද්‍යාලය	50
2	ව්‍යවහාරික රසායන විද්‍යාව		60
3	ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව		80
4	ගිණුම්කරණ තොරතුරු පද්ධති		50
5	දෘෂ්ටිමිතිය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	60
6	කලා-තොරතුරු තාක්ෂණය		50
7	ජලජ ජෛවසම්පත්		50
8	නාගරික ජෛවසම්පත්		50
9	බුද්ධිමය යන්ත්‍ර විද්‍යාව	මොරටුව විශ්වවිද්‍යාලය	50
10	දේශීය ඖෂධ සම්පත්	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	50
11	සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය		50
12	සෞඛ්‍ය සංචාරක හා ආගන්තුක සත්කාරක කළමනාකරණය		50
13	ජීව වෛද්‍ය තාක්ෂණය		50
14	දේශීය ඖෂධ තාක්ෂණය		50
15	යෝග සහ පාරම්පරෝවිද්‍යාව		50
16	සමාජ අධ්‍යයන (දේශීය දැනුම)		50
	එකතුව		**850**

ඊට අමතරව, 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා පහත දැක්වෙන දැනට පවත්නා අධ්‍යයන පාඨමාලා වෙනත් විශ්වවිද්‍යාලවලට ද හඳුන්වා දෙන ලදී;

අංකය	පාඨමාලාවේ නම	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
1	දන්ත ශල්‍ය විද්‍යාව	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	30
2	ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	30
2	ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	කැලණිය විශ්වවිද්‍යාලය	50
4	ශාරීරික අධ්‍යාපනය	යාපනය විශ්වවිද්‍යාලය	50
	එකතුව		**160**

<u>අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය</u>

උසස් අධ්‍යාපනයට පුළුල් සහභාගීත්වයක් සහ සමාන ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින්, දේශීය හා ගෝලීය වශයෙන් පිළිගත් නව හා නව්‍යකරණය කරන ලද පාඨමාලා සහ උපාධි වැඩසටහන් හඳුන්වා දීමට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කරන ලදී. මෙම ප්‍රයත්නයට සහාය දැක්වීම සඳහා, 2021 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන ලදී;

- නව විශ්වවිද්‍යාල දෙකක් (02)
- නව පීඨ නවයක් (09)
- නව අධ්‍යයන දෙපාර්තමේන්තු තිස් පහක් (35)
- නව උපාධි පාඨමාලා දහසයක් (16)
- නව පශ්චාත් උපාධි වැඩසටහන් දහනවයක් (19)
- නව බාහිර උපාධි වැඩසටහන් හයක් (6)

තවද සිසුන්ට වැඩි රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් ලබා දීම සඳහා, රටේ වර්තමාන අවශ්‍යතාවන්ට සරිලන පරිදි නව දැනුම හා කුසලතා හඳුන්වා දෙමින් පවත්නා උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, 2021 වසරේ දී අධ්‍යයනාංශ නාම වෙනස්වීම් 02ක් සහ ප්‍රථම උපාධි පාඨමාලාවල නම් වෙනස් කිරීම 53ක් යෝජනා කරන ලදී.

2021 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ස්ථාවර කමිටු 24 ක් ක්‍රියාත්මක වූ අතර එමඟින් විවිධ විෂය ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනයට අදාළ කරුණු පිළිබඳව කොමිෂන් සභාවට වාර්තා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය (PTF) සහ උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව (CVCD) සමඟ පැවැත්වූ විවිධ රැස්වීම්වලදී අධ්‍යයන වැඩසටහන් සහ ඇගයීම් පැවැත්වීමේ විකල්ප ක්‍රමවල වැදගත්කම පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාකච්ඡා කරන ලදී. මෙම සාකච්ඡා මත පදනම්ව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අනුගමනය කළ යුතු විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් භාවිතා කිරීම පිළිබඳව මාර්ගෝපදේශ සකස් කර ඇත. වැඩසටහන් ඉදිරිපත් කිරීමේ සහ ඇගයීමේ මෙම විකල්ප ක්‍රම ගෝලීය වශයෙන් අනුගමනය කර ඇති අතර කෝවිඩ් -19 වසංගත කාල පරිච්ඡේදය තුළ මුහුණට මුහුණලා දේශන පැවැත්වීමට සහ සංවෘත ග්‍රන්ථ ලිඛිත විභාග පැවැත්වීමට ඇති නොහැකියාව හේතුවෙන් මෙම ප්‍රවණතාව සැලකිය යුතු ලෙස ප්‍රචලිත වෙමින් පවතී.

<u>මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉල්ලීම මත, රු.මිලියන 62,395 ක් 2021 වර්ෂය සඳහා වෙන් කරන ලද අතර එය භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලදි. මෙයට පුනරාවර්තන වියදම් ලෙස රු.මි. 53,995 ක් සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.මි.8,400 ක් අයත් වේ. 2021 වර්ෂය අවසන් වන විට, වෙන් කරන ලද අරමුදල්වලින් 97% ක් සහ 78% ක් පිළිවෙලින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා යොදවා ඇති අතර, එය 95% ක එනම් රු.මි.59,039 ක ඒකාබද්ධ උපයෝජනයකි.

භාණ්ඩාගාරය විසින් හඳුන්වා දී ඇති යහ කළමනාකරණ පිළිවෙත් අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි පරිපාලන හා මෙහෙයුම් කටයුතුවල සියලු වැදගත් අංශ අධීක්ෂණය කිරීමේ අරමුණින් 2021 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් පහක් පවත්වන ලදී. තවද, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නිසි පාලනයක් සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනයන් හි අභ්‍යන්තර විගණන අංශ සමඟ නිතිපතා සම්බන්ධීකරණය විය.

<u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල කටයුතු කළමනාකරණය</u>

විධායක හා විධායක නොවන කාර්ය මණ්ඩලය ද ඇතුළුව 2021 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සේවක සංඛ්‍යාව 325 ක් විය. 2021 දෙසැම්බර් 31 වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවය කළ කාර්යමණ්ඩලය 245 කි. 2021 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ නව පත්වීම් 09 ක් ලබා දී ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවකයින් 35 දෙනෙකුගේ සේවයේ ස්ථිර කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් (EB) අවශ්‍යතා ඇගයීමෙන් පසු සේවකයින් 09 දෙනෙකු උසස් කරන ලද අතර එක් පත් කිරීමක් සිදු කරන ලදී. තවද, නැවත රාජකාරි ආරම්භ කිරීම් 02 ක් සිදු වූ අතර, එක් සේවිකාවක් ඇයගේ පැවරුම් කාලය සම්පූර්ණ කිරීම හේතුවෙන් තනතුරේ කාලය අවසන් කරන ලදී.

2021 වසරේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් 12ක් පමණක් වාර්තා විය. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678, 696 සහ 893 හි විධිවිධාන යටතේ සේවකයින් 09 දෙනෙකු විශ්වවිද්‍යාල පද්ධතියට කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් සේවා සම්මාන ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර ඔවුන්ට ඒ වෙනුවෙන් මුදල් ත්‍යාගයන් ලබා දෙන ලදී.

2021 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන අතර ස්ථාන මාරු 14ක් සිදු කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ සුභද ස්ථාන මාරුවීම් 02ක්, විශ්‍රාම යාමට පෙර ලබා ගන්නා නිවාඩු 02ක්, විශ්‍රාම ගැන්වීම් 03ක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවයෙන් ස්ථිරව නිදහස් කිරීම් 01ක් සහ ඉල්ලා අස්වීම් 01ක් වාර්තා වී ඇත. තවද, 2021 වර්ෂය තුළ විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු 01 ක්, වැටුප් රහිත නිවාඩු 1 ක්, ප්‍රසූත නිවාඩු 10 ක් සහ නිවාඩු අහෝසි කිරීම් 10 ක් ද වාර්තා වී ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කුසලතා සහ වැඩ කරන දැනුම වැඩි දියුණු කිරීම සඳහා බොහෝ අවස්ථාවන් සලසා දෙන ලදී. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ, "zoom" තාක්ෂණය හරහා දේශීයව පවත්වන ලද පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා විධායක කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 02 දෙනෙකු සහ විධායක නොවන කාර්ය මණ්ඩල සාමාජිකයින් 04 දෙනෙකු සහභාගී විය.

2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සියලුම ස්ථිර සේවකයින් සඳහා ආකර්ශනීය හා සාධාරණ ගාස්තුවකට පුද්ගලික ගිණුමෙන්ම පවුල් ආවරණයක් ලබා ගැනීමේ විකල්පය සමඟ සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දී ඇත.

<u>විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය</u>

2021 දී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක සංඛ්‍යා තනතුරු 453ක් අනුමත කරන ලදී.

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පරිපාලන ශ්‍රේණියේ පත්වීම් / උසස්වීම් සිදු කිරීමට පැවරී ඇති වගකීම යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2021 දී පරිපාලන ශ්‍රේණියේ පත්වීම් 23 ක් සිදු කරන ලදී. මීට අමතරව, වසර තුළදී වෙනත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම්18 ක් සහ උසස්වීම් 22 ක් ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද අතර විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ථාන මාරුවීම් 188 ක් සඳහා ද පහසුකම් සලසන ලදී.

2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ක කාලය තුළ සහන කොන්දේසි මත මෝටර් වාහන බලපත්‍ර සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් අයදුම්පත් 224 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී තිබූ අතර එම කටයුතු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ක්‍රියාවට නැංවේ.

1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් පවරා ඇති බලතල, රාජකාරි හා කාර්යයන් ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේ දී කොමිෂන් සභා චක්‍රලේඛ 14ක් සහ ආයතන චක්‍රලේඛ ලිපි 19 ක් නිකුත් කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා කොමිෂන් සභාව ගත් තීරණ හා ප්‍රතිපත්තිවලට අදාළ උපදෙස් හා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙමින් මෙම චක්‍රලේඛ ලිපි නිකුත් කරන ලදී.

<u>විශ්වවිද්‍යාල සිසුන් සඳහා මූල්‍ය ආධාර</u>

ශිෂ්‍යත්ව යනු පරිත්‍යාගශීලීන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් එකඟ වන නියමයන් සහ කොන්දේසි මත පුද්ගලයන් හෝ සංවිධාන විසින් ස්ථාපිත කර ඇති සහ අනාගතයේදී ස්ථාපිත කළ හැකි ඒවා වේ. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන තෝරාගත් සිසුන්ට අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා මෙම මූල්‍ය ආධාර ලබාදේ. මුදල් අංශය සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශයේ සහාය ඇතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය විසින් දැනට ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කරයි.

<u>විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා සහාය සහ මූල්‍යාධාර ලබා දීම</u>

සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යයන කාර්ය මණ්ඩලයට, විශේෂයෙන් තරුණ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා අවස්ථා නිර්මාණය කිරීමට කටයුතු කළේය. මෙම කටයුතු මූලික වශයෙන් පර්යේෂණ හා ජාත්‍යන්තර සහයෝගිතා අංශය (DRIC) හරහා සිදු කරන ලද අතර ඒවා පහත පරිදි වේ;

උසස් අධ්‍යාපන ආයතනවල ස්ථීර සේවයේ නිරත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූල්‍යාධාර සපයයි. මෙම ප්‍රදාන යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ සියළුම අංශයන්හි අධ්‍යයන කටයුතුවල නියැලෙන්නන්ට ඔවුන්ගේ වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ධාරිතාවය ශක්තිමත් කිරීමයි.

ප්‍රදානයේ මුළු වටිනාකම විෂය, අධ්‍යයන වැඩසටහනේ ස්වභාවය සහ වැඩසටහන පවත්වන රට අනුව වෙනස් වේ. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ 2021 වසර සඳහා ශිෂ්‍යත්ව දහසයක් (16) ප්‍රදානය කරන ලදී.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් ඔවුන්ට ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයෙහි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සම අනුග්‍රහය දක්වන ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කරන ලදී.

- ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛ ස්ථානයක් උසුලන ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT) සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒකාබද්ධව විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා ඒකාබද්ධ / භින්න ආචාර්ය උපාධි වැඩසටහනක් දියත් කළේය.

- ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු (PhD) සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සම අනුග්‍රාහක ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කර තිබේ.

<u>උසස් අධ්‍යාපන ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු</u>

2021 වසරේ දී, නව ඉදිකිරීම් හා අඛණ්ඩව සිදු කෙරෙන ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත්කර ගැනීම්, මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සහ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 8,400ක මුදලක් වෙන් කරන ලදී. 2021 වසර අවසන් වන විට රු.මිලියන 6, 549ක් වන මුළු මුදල, භාණ්ඩාගාරය විසින් නිර්දේශ කර නිකුත් කරන ලදී.

වර්ෂය තුළදී, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් නව ව්‍යාපෘති යෝජනා 33 ක් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, එහි සෝදිසි කිරීම් හා ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව, 2021 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද්දේ ව්‍යාපෘති යෝජනා 17ක් පමණි. රේඛීය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ දී ව්‍යාපෘති යෝජනා 17 ම අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. 2021 වර්ෂයේ දී, භෞතිකව වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන 12ක් වන අතර විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වටිනාකම රු.මිලියන 62,202 වන වැඩ ආරම්භ කර සැලසුම් හා ඉදිකිරීම් ක්‍රියාවලියේ විවිධ මට්ටම්වල පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 80ක් පවතින අතර සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,131ක් වන ව්‍යාපෘති 05ක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දී ඇත.

<u>තොරතුරු තාක්ෂණ සහාය</u>

පැවරී ඇති වගකීම්වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවත් සහ අඛණ්ඩ පරිගණක පද්ධතික් සහතික කිරීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අංශය කළමනාකරණ සහාය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවල සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම, පවත්නා පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා / පිරිවිතරයන් සකස් කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය, පරිගණක, සන්නිවේදන පද්ධති හා ජාලයේ සමස්ත පරිපාලනය මෙන්ම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ 2021 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයකි.

- නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම සහ පවතින පද්ධති වෙත වැඩිදියුණු කිරීම, අවශ්‍යතා සහ පිරිවිතර සැකසීම, මෘදුකාංග ඇතුළු පරිගණක පද්ධතියේ සහ ජාලයේ සමස්ත පරිපාලනය, සන්නිවේදන පද්ධති, දත්ත සැකසුම් ක්‍රියාකාරකම් සහ සංවිධානයේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සැපයීම සඳහා හිතකර අඛණ්ඩ පරිගණක පද්ධතියක් කළමනාකරණය කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) සහ වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වන ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), ශ්‍රී ලංකා ටෙලිකොම්, LK Domain Registry සමඟ සම්බන්ධීකරණය කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නවතම තොරතුරු තාක්ෂණයන් හඳුන්වා දීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් ද්වාරයෙහි (UGC portal) වෙබ් අඩවි පරිපාලනය සහ නඩත්තු කිරීම.

- සාර්ථක ප්‍රතිඵල ලබා දීම සඳහා පහත ක්ෂේත්‍ර යටතේ ආවරණය වන යෙදවුම් සංවර්ධන කණ්ඩායම සහ සේවා සපයන්නන් සම්බන්ධීකරණය කිරීම.

    - 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා කඩඉම් ලකුණු වෙබ් අඩවිය ඔස්සේ නිකුත් කිරීම.

    - කෙටි පණිවුඩ සහ රජයේ තොරතුරු මධ්‍යස්ථානය (1919 ඇමතුම් මධ්‍යස්ථානය) විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ ක්‍රියාකාරකම්.

    - විශ්වවිද්‍යාල සඳහා මාර්ග ගත ශිෂ්‍ය ලියාපදිංචිය- (2020/2021 අධ්‍යයන වර්ෂය)

    - මාර්ගගත අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය - 2020/2021 අධ්‍යයන වර්ෂය

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) සමඟ සබැඳි ගෙවීම් ද්වාර ක්‍රියාවලිය පරිපාලනය සහ සම්බන්ධීකරණය.

- වෙබ් ද්වාරය, රැස්වීම් මණ්ඩල කාමර වෙන් කිරීමේ ක්‍රමය, සේවකයින්ගේ පැමිණීම සලකුණු කරන පුද්ගල අංශය සඳහා වන eHRM පද්ධතිය, සේවක උසස්වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ ක්‍රමය වැනි ව්‍යාපාරික යෙදවුම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

<u>විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍යාධාර ලබා දීම</u>

2021 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මුළු මුදල වූ රු.මිලියන 2,000 ක් විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍යාධාර ලෙස වෙන් කර / ලබාගෙන සහ ගෙවීම් සිදු කර ඇත. ඒ අනුව, රු.මිලියන1,138 ක් මහපොළ ශිෂ්‍යත්ව වශයෙන් හා රු.මිලියන 862 ක් ශිෂ්‍යාධාර ලෙස ලබා දෙන ලදී.

<u>කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ කටයුතු සහ සහාය</u>

2021 දී, කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන 2020 හා සම්බන්ධ වැදගත් ප්‍රකාශන/වාර්තා දෙකක් සහ විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ වෙබ් අඩවියේ (webometrics) හා QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යාවත්කාලීන කරන ලද ශ්‍රේණිගත කිරීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

<u>තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ (QAC) කටයුතු</u>

කොවිඩ්-19 වසංගතය සමඟ, විශේෂයෙන් බාහිර සමාලෝචන සහ ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම සම්බන්ධයෙන් 2021 වසර තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට වෙත ඉතා අභියෝගාත්මක විය. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ නව අධ්‍යක්ෂවරයා ලෙස මහාචාර්ය තිලක් ගමගේ මහතා 2021 මැයි 1 දින සිට පත් කරන ලද අතර, එතෙක් වැඩබලන අධ්‍යක්ෂ ලෙස (කොන්ත්‍රාත් පදනම මත) සම්මානිත මහාචාර්ය කල්‍යාණි පෙරේරා මිය පත් කරන ලදී. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින් විසින් සහාය දක්වන අතර තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් ද මෙහෙයවනු ලැබේ. ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව 2021 දෙසැම්බර් 31 වන විට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ ප්‍රගතිය පහත පරිදි වේ.

- විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම.
- දැනට පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශයන් සංවර්ධනය කිරීම.
- ආයතනික සමාලෝචන පැවැත්වීම (IRs)
- වැඩසටහන් සමාලෝචන පැවැත්වීම (PRs)

- ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ 2015 අනුව විශ්වවිද්‍යාලවල සුදුසුකම් සිතියම්ගත කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම.
- අධ්‍යයන වගවීම පිළිබඳ පොදු මාර්ගෝපදේශ සකස් කිරීම.
- සමකාලීන අධ්‍යයන දින දර්ශනයක් අනුව කටයුතු කිරීමට විශ්වවිද්‍යාලවලට සහාය වීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන සුදුසුකම් සඳහා ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම.

<u>ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය (GEE), ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන වල නවකවදය</u>

විවිධත්වයට සහ සමානාත්මතාවයට සංවේදී වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල හිතකර ඉගෙනුම් /සේවා පරිසරයක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. ඒ අනුව, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව / සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ප්‍රජාවන්හි අසමානතා අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරන විවිධ ක්‍රියාකාරකම් සමූහයක නිරත වෙමින් සිටී. 2021 ජූනි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මහාචාර්ය හේමමාලි ගුණතිලක (කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආචාර්ය උපාධිය, වෝර්වික් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරිය ලෙස පත් කරන ලද අතර 2021 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

පැමිණිලි ද්වාරය

රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රජාවේ සියලුම සාමාජිකයින්ට මාර්ගගත පැමිණිලි ද්වාරයට ප්‍රවේශ විය හැකි අතර නවක වදයට සම්බන්ධ නමුත් ප්‍රධාන වශයෙන් ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ලෙස වර්ගීකරණය කළ හැකි සිදුවීම් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. 2021 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව සාමාන්‍ය ප්‍රමාණයට වඩා අඩු අගයක් ගන්නා ලදී. එයට හේතුව වුයේ විශ්වවිද්‍යාල මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක වීමත් සිසුන් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ භෞතිකව නොසිටීමත් ය. කෙසේ වෙතත්, ලැබුණු පැමිණිලි කිහිපයක් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ විශ්වවිද්‍යාල වෙත යොමු කරන ලද අතර පවතින සමහර පැමිණිලි පිළිබඳව ක්‍රියාකර විසඳා ඇත (පැමිණිලි 17 ක් ලැබී ඒවා පිළිබඳව අදාළ කටයුතු සිදු කර ඇත.)

පර්යේෂණ මූල පිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාලවල නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ සහ නවක වදයට එරෙහිව සටන් කිරීමට උපාය මාර්ග යෝජනා කිරීම සහ පැතිරීම අවම කිරීම පිළිබඳව වන UNICEF විසින් අරමුදල් සපයන ලද ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාව 2021 ඔක්තෝම්බර් මාසයේදී මුද්‍රණය කරන ලදී.

2021 දී ගන්නා ලද මූලපිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ ප්‍රධාන වශයෙන් සිදු කරනු ලැබුවේ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය බහුලවීමට හේතු හඳුනා ගැනීම සහ එවැනි සිදුවීම් අවම කිරීම සඳහා උපාය මාර්ග යෝජනා කිරීම සඳහා ය. විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ව්‍යාප්ත වීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ විවිධත්වය සහ සමාන ප්‍රවේශය සම්බන්ධ ගැටළු විසඳීමට ඇති

නොහැකියාව බව අධ්‍යයන සොයාගැනීම්වලින් අනාවරණය විය. එවැනි සොයාගැනීම් මත පදනම්ව, මේ වන විට ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ සම්පත් දායකයින්ගේ සහාය ඇතිව 'විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම' නමින් පාඨමාලාවක් සකස් කර ඇත. මෙම පාඨමාලාව පහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සමපාත වේ:

ඉලක්කය 4 : ගුණාත්මක අධ්‍යාපනය
ඉලක්කය 5 : ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය
ඉලක්කය 10: අඩු කරන ලද අසමානතා
ඉලක්කය 11: තිරසාර නගර සහ ප්‍රජාවන්
ඉලක්කය 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගෝලීය සමුළුව

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගෝලීය සමුළුවක් සංවිධානය කිරීමටත් 2023 මාර්තු මාසයේදී එය පැවැත්වීමටත් ස්ථාවර කමිටුව යෝජනා කළේය. සමුළුව සංවිධානය කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලද අතර එය ස්ථාවර කමිටුවේ ස්වේච්ඡා සාමාජිකයින්ගෙන් සහ සියලුම විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රස්ථානවල අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය. මේ වන විට අනු කමිටුව රැස්වීම් වට දෙකක් පවත්වා ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල රැස්වීම සහ පුහුණුව

ප්‍රගතිය, ගැටලු සහ ඉදිරි ගමන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සෑම මසකම තුන්වන බදාදා දින කාර්ය මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට නියමිතය. එදිනම කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යක්ෂවරයා විසින් ලබා දෙන පුහුණුව පවත්වනු ලැබේ. මෙම පුහුණුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අසමානතාවයේ වෙනත් ආකාර, පුද්ගලික සංවර්ධනය, වෘත්තීය ප්‍රගතිය සහ අන්තර් පුද්ගල සහ සමාජ කුසලතා වැනි ක්ෂේත්‍ර ආවරණය කරයි.

වගු ලැයිස්තුව

වගුව		පිටු අංකය
වගුව 4.1.1	සාමාන්‍ය විධිවිධාන අනුව නව හා පැරණි විෂය නිර්දේශය යටතේ තෝරාගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	13-16
වගුව 4.2	2020/2021 වර්ෂයේදී හඳුන්වා දුන් නව අධ්‍යයන පාඨමාලා	17
වගුව 4.3	2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා අනෙකුත් විශ්වවිද්‍යාලවලට හඳුන්වා දුන් විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලා	17
වගුව 4.4.(අ)	අන්ධ හා කායික අශක්නුතාවන් ඇති සිසුන් ඇතුළත් කිරීම	18
වගුව 4.4.(ආ)	විෂය පරිභාහිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම	19-21
වගුව 4.4.(ඇ)	ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සුදුසුකම් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම	22
වගුව 4.4.(ඉ)	සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම	22
වගුව 4.4.(ඊ)	ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨ දක්ෂතාවත් දක්වා ඇති අයදුම්කරුවන්	22
වගුව 5.1	ස්ථාවර කමිටු සහ වෙනත් කමිටු විසින් 2021 දී පවත්වන ලද රැස්වීම්	26-27
වගුව 5.2.1	2021 වසරේ අනුමත විශ්වවිද්‍යාල	27
වගුව 5.2.2	2021 වර්ෂයේ අනුමත කරන ලද පීඨ	27
වගුව 5.2.3	2021 වර්ෂයේ අනුමත කරන ලද අධ්‍යයනාංශ	28
වගුව 5.2.4	2021 වර්ෂයේ අනුමත කරන ලද ප්‍රථම උපාධි පාඨමාලා	29
වගුව 5.2.5	2021 වර්ෂයේ අනුමත පශ්චාත් උපාධි වැඩසටහන්	30
වගුව 5.2.6	2021 වර්ෂයේදී අනුමත කරන ලද බාහිර උපාධි වැඩසටහන්	31
වගුව 5.3.1	2021 වර්ෂයේ අනුමත කරන ලද අධ්‍යයනාංශවල නම වෙනස් කිරීම්	31
වගුව 5.3.2	2021 වර්ෂයේ අනුමත කරන ලද ප්‍රථම උපාධි පාඨමාලාවල නම වෙනස් කිරීම්	32-34
වගුව 6.2	විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම/ භාවිතා කිරීම	37
වගුව 6.3.1	ප්‍රාග්ධන වියදම් ප්‍රදාන (CBG)	38
වගුව 6.3.2	අයවැය යෝජනා – 2021	38
වගුව 6.4.1	වසර තුළ නිම කරන ලද ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති	39
වගුව 6.4.2	වර්ෂය තුළ ආරම්භ කළ යටිතල පහසුකම් ව්‍යාපෘති	39-40
වගුව 6.5	විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම - භාවිතය /2016 සිට 2021 දක්වා	40

වගුව 6.6	විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම - 2021	41
වගුව 6.7	2021.12.31 දිනට මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන්නන් සංඛ්‍යාව	42
වගුව 6.8 (අ)	මහපොළ සහ ශිෂ්‍යාධාර පිළිබඳ මූලික තොරතුරු	43
වගුව 6.8. (ආ)	මහා භාණ්ඩාගාරය විසින් මහපොළ සහ ශිෂ්‍යාධාර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් සහ නිකුත් කිරීම්	43
වගුව 6.8 (ඇ)	මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් තත්ත්වය	43
වගුව 7.1	2021 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යා විස්තර	44
වගුව 7.4	පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ සේවකයින් සංඛ්‍යාව	46
වගුව 8.1.1	2021 දී විශ්වවිද්‍යාල උසස් / අධ්‍යාපන ආයතන සඳහා අනුමත කරන ලද නව සේවක තනතුරු සංඛ්‍යාව [කාණ්ඩය අනුව]	47
වගුව 8.1.2	විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල අනුමත සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු	47
වගුව 8.1.3	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තාවකාලික අධ්‍යයන සේවක සංඛ්‍යාව	48
වගුව 8.2	2021 වර්ෂයේ පරිපාලන ශ්‍රේණි සඳහා පත් කිරීම්	48
වගුව 8.3.1	අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් – 2021	49
වගුව 8.3.2	අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද උසස්වීම් - 2021	49
වගුව 9.1	නිම කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දුන් ව්‍යාපෘති	51
වගුව 14.4	ප්‍රගති වාර්තාව අභ්‍යන්තර විගණන අංශය	64-65
වගුව 17.1	මිටිෂුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව	70
වගුව 17.2	මහරාජා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය	71
වගුව 17.3	ශ්‍රී ලංකා පොලිස් මධ්‍යම සුභසාධන මණ්ඩලයේ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	72
වගුව 19.1	විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය	78
වගුව 20.1	අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය	80
වගුව 21.1	2021 දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ	82-83
වගුව 21.2	2021 දී නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි	83-84

අ.වි. - අභ්‍යන්තර විගණක
නි.ලේ. – නියෝජ්‍ය ලේකම
නි.ග.– නියෝජ්‍ය ගණකාධිකාරී
ජ්‍යෙ.ස.ලේ. – ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ජ්‍යෙ.ස.ග. – ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී
ජ්‍යෙ.ස.අ.වි. – ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
ස.ලේ. – සහකාර ලේකම්
ස.අ.ස. – සහකාර අභ්‍යන්තර විගණක
ස.ග. – සහකාර ගණකාධිකාරී
ම.ස.නි. – මහජන සම්බන්ධතා නිලධාරී
මා.ස. – මානව සම්පත්
ය.ප.ස.අ. – යටිතල පහසුකම් සංවර්ධන අංශය
ක.ආ.ක. – කන්ත්ව ආරක්ෂණ කවුන්සිලය
නී. හා ප්‍ර. – නීති හා ප්‍රලේඛණ
ප.සහ ජා.ස.අ.– පර්යේෂණ සහ ජාත්‍යන්තර සහයෝගිතා අංශය
සැ.හා.න. – සැපයුම් හා නඩත්තු
මා.ස.ස.ඒ. - මානව සම්පත් සංවර්ධන ඒකකය
වි.අ.අ. – විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
වි.සේ.අ.ම.– විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය
ස්. පු. සා. කේ. - ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංවිධාන රූ සටහන



1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත කළමනාකරණය සඳහා වගකිව යුතු කොමිෂන් සභාව 2021 වර්ෂයේ දී පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය;

සභාපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග** *බී.ඒ.ආර්ථික විද්‍යාව (විශේෂ) (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය); එම්.ඒ. ආර්ථික විද්‍යාව(කොළඹ); එම්.එස්.සී. ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ආර්ථික විද්‍යාව (සාගා, ජපානය); පී.එච්.ඩී (කගෝෂිමා , ජපානය)*
උප සභාපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ (2021.02.28 දක්වා)** *පී.එච්.ඩී.(එ.රා.), බී.එස්.සී. (ගෞරව), වරලත් රසායනඥ, වරලත් විද්‍යාඥ, රාජකීය රසායන විද්‍යා සංගමයේ සාමාජික, එෆ්එල්කෙම්සී (Flchemc)*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වන්දන පී උඩවත්ත (2021.03.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.) *බී.එස්.සී., දර්ශනශූරී, පී.එච්.ඩී., වරලත් රසායනඥ, රසායනික ඉංජිනේරු ඩිප්ලෝමාව (Dip.Chem. Eng), ජෛව තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (Dip.Bio.Tech)*
කොමිෂන් සභාවේ සාමාජිකයන්	**මහාචාර්ය පූජ්‍ය කේ සංඝරක්ඛිත හිමි (2021.03.02 දක්වා)** *බී.ඒ. (ගෞරව) (ශ්‍රී.ල) පී.එච්.ඩී, එම්.ඒ.(දිල්ලි)*
	පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි (2021.03.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී) *බී.ඒ (ගෞරව) එම්.ඒ., පී.එච්.ඩී., අග්ගමහාපණ්ඩිත*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. ඩබ්ලිව්. කේ. ජයවර්ධන *බී.එස්.සී. ඉංජිනේරු (ගෞරව) (මොරටුව), එම්.එස්.සී. ඉදිකිරීම් (ලෝබරෝ,එ.රා.), පී.එච්.ඩී. ඉදිකිරීම් කළමනාකරණය (ලෝබරෝ,එ.රා.), වරලත් ඉංජිනේරු, එෆ්.අයි.ඊ් (ශ්‍රී.ල) එම්.එස්.එස්.ඊ්.(ශ්‍රී.ල), Int.PE (ශ්‍රී.ල), එම්.එස්.එස්.ඊ්.(ශ්‍රී.ල), එෆ්.අයි.ජී.එම්.(ශ්‍රී.ල), එෆ්.එන්.ඒ.එස්.(ශ්‍රී.ල), ජී.එස්.එල්.අයි.ඩී.*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ති අරසරත්නම් *බී.එස්.සී, එම්.එස්.සී, පී.එච්.ඩී.(ජෛව රසායන විද්‍යාව)*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා *බී.ඒ., එම්.ඒ.(කොළඹ), එම්.එස්.සී. සහ පී.එච්.ඩී.(එඩින්බරෝ, එ.රා.)*
	පාලිත කුමාරසිංහ මහතා (ජනාධිපති නීතිඥ)
භාණ්ඩාගාර නියෝජිත	**ආර්.එච්. ඩබ්ලිව්. ඒ. කුමාරසිරි මහතා** *බී.ඒ. (ගෞරව)(කොළඹ),1991, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කයිරෝ), 1997, එම්.ඒ. (සංවර්ධන අධ්‍යයන), නෙදර්ලන්තය, 2002*
ලේකම්	**ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර** *බී.එස්.සී.(ගෞරව), එම්.බී.ඒ.(කොළඹ), පී.එච්.ඩී.(වුහාන්)*

2. විශ්වවිද්‍යාල කළමනාකරණය

2.1 කොළඹ විශ්වවිද්‍යාලය

කුලපති

අති උතුම් පූජ්‍ය ආචාර්ය ඔස්වල්ඩ් ගෝමිස් කොළඹ විශ්‍රාමික අගරදගුරු හිමිපාණෝ *(2021.11.16 දක්වා)*

ශාසන කීර්ති ශ්‍රී බුද්ධ ශාසන ශෝභන පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක හිමි *(2021.11.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

උප කුලපති
මහාචාර්ය සි. එන්. විජයරත්න

නියෝජ්‍ය උප කුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
කේ.ඒ.එස්. එඩිවඩ් මහතා

2.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය කේ. එම්. ද සිල්වා

උප කුලපති
මහාචාර්ය යූ.බී. දිසානායක *(2021.07.31 දක්වා)*
මහාචාර්ය එම්. ඩී. ළමාවංශ *(2021.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

නියෝජ්‍ය උප කුලපති
මහාචාර්ය එස්. එච්. පී. පී. කරුණාරත්න *(2021.08.30 දක්වා)*
මහාචාර්ය ඩබ්ලිව්. එම්. ටී. මධුජිත්*(2021.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

ලේඛකාධිකාරී
එම්. ජේ. ජී. ධර්මසේන මිය (*වැඩ බලන*)

2.3 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කුලපති

ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ, ශ්‍රී මහා විහාර වංශාලංකාර විමලකීර්ති ශ්‍රී ධම්මාලෝක සාහිත්‍යසූරී ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාරාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. ලියනගේ

ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එම්.ආර්.ඩබ්ලිව්.ඒ.බී.වැලිවිට මහතා

2.4 කැලණිය විශ්වවිද්‍යාලය

කුලපති

අග්‍රමහා සද්ධම්මජෝතික ධජ, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, උපාධ්‍යාය ධුරන්දර, මහෝපාද්‍යාය, පණ්ඩිත, අති පූජ්‍ය වැලමිටියාවේ ධර්මකීර්ති ශ්‍රී කුසල ධම්ම හිමි *(2021.10.27 දින අපවත් විය)*

පූජ්‍ය මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංගරක්ඛිත නායක ස්වාමීන් වහන්සේ (*2021.11.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා

ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා (*2021.07.01 දක්වා)*
කේ. කේ. කේ. ධර්මතිලක මහතා (*2021.07.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

2.5 මොරටුව විශ්වවිද්‍යාලය

කුලපති
විද්‍යාජෝති මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්ලිව්. පෙරේරා

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඩී. ගුණවර්ධන

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය පී. කේ. එස්. මහානාම

ලේඛකාධිකාරී
කේ.සී.එස්.පෙරේරා මිය (වැඩ බලන) (*2020.09.03 සිට ක්‍රියාත්මක වන පරිදි 2021.03.01 දක්වා*)

ඩබ්ලිව්.එම්.ඩී.පී.එම්. හුලුගල්ල මිය *(2021.03.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි සජ්ත වාර්ෂික නිවාඩුවෙන් පසු නැවත රාජකාරි ආරම්භ කරන ලදී)*

2.6 යාපනය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය එස්. පද්මනාදන්

උප කුලපති
මහාචාර්ය එස්. ශ්‍රීසත්ගුනරාජා

නියෝජ්‍ය උපකුලපති
පුරප්පාඩු වී ඇත.

ලේඛකාධිකාරී
වී. කන්දීපන් මහතා

2.7 රුහුණ විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය ආචාර්ය අකුරැටියේ නන්ද නායක හිමි

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.එස්.ඩී.අමරසේන

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය ඊ. පී. එස්. චන්දන

ලේඛකාධිකාරී
පී.එස්. කළුගම මිය

2.8 ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

කුලපති
ආචාර්ය වී. විවේකානන්දරාජා

උප කුලපති
මහාචාර්ය එෆ්.සී. රගෙල්

නියෝජ්‍ය උපකුලපති
පුරප්පාඩු වී ඇත.

ලේඛකාධිකාරී
ඒ. පහිරදන් මහතා

2.9 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය ඒ. එම්. ඉෂාක්

උප කුලපති
මහාචාර්ය එම්.එම්.එම්. නජීම් *(2021.02.08 දක්වා)*
මහාචාර්ය ඒ. රමීස් (*2021.08.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

ලේඛකාධිකාරී
එච්. ඒ. සත්තාර් මහතා

2.10 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය ඊතලවැටුනවැවේ ඥාණතිලක හිමි

උප කුලපති
ආචාර්ය බී. ඒ. කරුණාරත්න *(2021.11.16 දක්වා)*

මහාචාර්ය කේ. ජී. පී. බී. ජයතිලක (වැඩ බලන) (*2021.11.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2021.12.12 දක්වා*)

මහාචාර්ය ජී.ඒ.එස්. ගිනිගද්දර (*2021.12.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

ලේඛකාධිකාරී

ඒ.එම්.ජී.බී. අබේසිංහ මහතා (*2021.04.18 සිට සිට සජ්ත වාර්ෂික නිවාඩු ලබාගෙන ඇත.)*

එන්. සී. එස්. සේනක මහතා (වැඩබලන) (*2021.04.19 දින සිට ඒ. එම්. ජී. බී. අබේසිංහ මහතා සජ්ත වාර්ෂික නිවාඩු අවසන්ව ආපසු පැමිණෙන තෙක්)*

2.11 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය පූජ්‍ය කඹුරුගමුවේ වජිර නායක ස්වාමීන්වහන්සේ

උප කුලපති
මහාචාර්ය ආර්. එම්. යූ. එස්. කේ. රත්නායක

ලේඛකාධිකාරී
කේ. ගුණවර්ධන මහතා (වැඩබලන) *(2020.03.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2021.03.30 දක්වා)*

පී. රත්නායක මහතා (වැඩබලන) *(2021.03.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2021.07.28 දක්වා)*

එස්. උයන්ගොඩ මහතා *(2021.07.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි)*

2.12 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

කුලපති
දේශබන්දු මහාචාර්ය ටියුලේ ද සිල්වා

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ .එම් .යූ .කේ. ජයසිංහ *(2021.06.13 දක්වා)*

මහාචාර්ය ජේ. සී. එදිරිසිංහ (වැඩ බලන) (*2021.06.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි 26.10.2021 දක්වා*)

ආචාර්ය එස්. බෝවත්ත (වැඩ බලන) (*2021.11.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

ලේඛකාධිකාරී
ඩබ්ලිව්. ඒ. ඩී. චිත්‍රානන්ද මහතා

2.13 ශ්‍රී ලංකා උෆව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

කුලපති

ත්‍රිපිටකාචාර්ය ධර්ම කීර්ති ශ්‍රී සුමංගල රත්නපාල ධම්මරක්ඛිත අති පූජ්‍ය බෙන්ගමුවේ ශ්‍රී ධම්මදින්න නායක හිමි

උප කුලපති

මහාචාර්ය ජේ.එල්.රත්නසේකර

ලේඛකාධිකාරී

එම් .එෆ්.එච්. කරීම් මහතා

2.14 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කුලපති

සම්මානිත මහාචාර්ය ඩී. ඒ. තන්ත්‍රිගොඩ

උප කුලපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ඒ.ආරියදුරෙ *(2021.06.22 දක්වා)*

මහාචාර්ය පී. එම්. සී. තිලකරත්න (*2021.06.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

නියෝජ්‍ය උප කුලපති

ආචාර්ය ඒ. පී. මදුරප්පෙරුම

ලේඛකාධිකාරී

ඩබ්ලිව්. එල්. වී. ජයසේන මිය

2.15 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

කුලපති

සම්මානිත මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි *(2021.12.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත පත් කරන ලදී)*

උප කුලපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (ආචාර්ය) ආර්. පී. මහලියනාරච්චි

ලේඛකාධිකාරී

බී.එම්.දයාවංස මයා

2.16 ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM)

[1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ස්ථාපිත කරන ලදී]

කුලපති

සාහිත්‍ය චක්‍රවර්ති, මල්වතු පාර්ශ්වයේ අනුනායක, පූජ්‍ය ආචාර්ය නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි ස්වාමීන් වහන්සේ (*2021.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි*)

උප කුලපති

ජ්‍යෂ්ඨ මහාචාර්ය ජේ. ඒ. ලියනගේ (*2021.03.01 දින පත් කර 2021.09.30 දින විදේශ සේවය සඳහා මුදා හරින ලදී.*)

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලාංකික සිසුන් තම උසස් අධ්‍යාපන හදාරන ලද දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල පිළිගැනීමේ සහතිකය ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම් බොහෝ ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු දෙපාර්තමේන්තුව විසින් සපුරා දෙන ලදී. මෙම දේශීය හා විදේශීය පිළිගැනීම් කටයුතු මාර්ගගත ක්‍රමය හරහා සිදු කරනු ලබන අතර, මෙය කොවිඩ් -19 තත්ත්වය තුළ මහජනතාවට මහත් රුකුලක් වූ අතර, අධ්‍යයන කටයුතු අංශය විසින් අන්තර්ජාලය හරහා අදාළ ලේඛන හොඳින් පරීක්ෂා කිරීමෙන් පසු පිළිගැනීම් ලිපිය නිකුත් කිරීමට පහසුකම් සලසා ඇත. 1992 මාර්තු 13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/92 හි විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාල පිළිබඳ ජාත්‍යන්තර අත්පොතේ සහ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල විශ්වවිද්‍යාල පිළිබඳ වාර්ෂික සංග්‍රහයේ ලැයිස්තුගත කර ඇති විදේශ විශ්වවිද්‍යාල සඳහා පිළිගැනීමේ ලිපි නිකුත් කරනු ලැබේ.

5.5 බ්‍රිටිෂ් කවුන්සිලයේ "Going Global Partnerships" වැඩසටහන යටතේ විශ්වවිද්‍යාලවල (UNICYCLE) තරුණ හා සිවිල් නායකත්ව අධ්‍යාපනය සඳහා ඇති හැකියාව ශක්තිමත් කිරීම

"Going Global Partnership" වැඩසටහනේ අරමුණ වන්නේ ආර්ථික හා සමාජීය වර්ධනයට සහාය වන ශක්තිමත්, සියල්ල ඇතුළත්, ජාත්‍යන්තරව සම්බන්ධ උසස් අධ්‍යාපන සහ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන (TVET) පද්ධති ගොඩනැගීමයි. ඒ අනුව, මෙම බ්‍රිටිෂ් කවුන්සිලයේ වැඩසටහන හරහා, උසස් අධ්‍යාපන ආයතනවලට එක්සත් රාජධානියේ සහ ලොව පුරා තිබෙන විශ්වවිද්‍යාල, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයින් සහ අනෙකුත් හවුල්කරුවන් සමඟ සම්බන්ධ වීමට, සහයෝගයෙන් කටයුතු කිරීමට සහ නව්‍යකරණය කිරීමට හැකියාව ලැබේ.

මෙම නියමු ව්‍යාපෘතිය දැනට මෙම ව්‍යාපෘතිය යටතේ හඳුන්වා දී ඇති ක්‍රියාකාරී පුරවැසි ක්‍රමවේදය භාවිතා කරන (රාජ්‍ය විශ්ව විද්‍යාල තුනක්) යාපනය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සමඟ සම්බන්ධ වීමට අදහස් කරන අතර ඔවුන්ගේ හැකියාවන් තවදුරටත් ශක්තිමත් කිරීමට සහ එක්සත් රාජධානියේ විශ්ව විද්‍යාල සමඟ ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකාවේ මෙම විශ්වවිද්‍යාල තුනටම රු. මිලියන 1.5 බැගින් ප්‍රදාන ලබා දීමට නියමිතය.

5.6 උපාධිධාරී පත්වීම් 2021

දිස්ත්‍රික්ක 25ක් යටතේ 2021 උපාධිධාරී පත්වීම් සඳහා අයදුම් කළ අපේක්ෂකයින් තෝරා ගැනීමට අධ්‍යයන කටයුතු අංශය පහසුකම් සලසන ලද අතර එම කටයුතු වෙනුවන් ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

5.7 විශ්වවිද්‍යාල ආයතන: නව මුල පිරීම්

5.7.1 හෙද හා ගුරු විශ්වවිද්‍යාල පිහිටුවීම

වත්මන් රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව "සෞභාග්‍යයේ දැක්ම" යටතේ හෙද හා ගුරු වෘත්තීන්හි ගුණාත්මක බව ඉහළ නැංවීමේදී ඉහළ වෘත්තීය පිළිගැනීමක් සහ වෘත්තීයභාවයක් ඇති ගෝලීය වශයෙන් තරඟකාරී වෘත්තිකයන් බිහිකිරීමේ අවශ්‍යතාවය මත මෙම විශ්වවිද්‍යාල පිහිටු වීමේ හඳුනාගෙන ඇත. වර්තමාන තරඟකාරී ගෝලීය රැකියා වෙළෙඳපොළ තුළ හෙද සහ ගුරු වෘත්තිකයන් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

ඒ අනුව ගෝලීය තරඟකාරී රැකියා වෙළෙඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් ඇති හෙද වෘත්තිකයන් සහ ගුරු වෘත්තිකයන් බිහිකිරීමට ප්‍රමුඛත්වය දී ඇත.

එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය සහ නියාමනය යටතේ දැනට පවතින හෙද විද්‍යාල සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය හා නියාමනය යටතේ පවතින ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල දෙකක් ලෙස සංවර්ධනය කෙරේ. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අවශ්‍ය තොරතුරු ලබාගෙන සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කමිටුවක් නම් කරන ලදී. 2 වන වටයේ සාකච්ඡාව 2021 දෙසැම්බර් 27 වන දින පවත්වන ලද අතර 3 වන සාකච්ඡා වටය 2022 ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිතය.

5.7.2 ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු ක්‍රීඩා විශ්වවිද්‍යාලය පිහිටුවීම

වත්මන් රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව "සෞභාග්‍යයේ දැක්ම" යටතේ ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මූලිකත්වය ගෙන ඇත. ඒ අනුව, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ කටයුතු කිරීම සඳහා කමිටුවක් නම් කරන ලදී.

5.7.3 පරිගණක ඒකකය

කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපදේශකවරුන් (මහාචාර්ය ආරියදුරෙයි සහ මහාචාර්ය හේවාගමගේ) සමඟ සාකච්ඡා කර සකස් කරන ලද යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යැවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යවන ලදී.

5.7.4 අතථ්‍ය විශ්වවිද්‍යාලය

කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපදේශකවරුන් (මහාචාර්ය ආරියදුරෙයි සහ මහාචාර්ය හේවාගමගේ) සමඟ සාකච්ඡා කර සකස් කරන ලද යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යැවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යවන ලදී.

5.7.5 කෘෂිකර්ම හා තාක්ෂණ විශ්වවිද්‍යාලය

5.7.6

චීනයෙන් ලැබුණු අධ්‍යයන යෝජනාව මහාචාර්ය ආරියදුරෙයි සහ මහාචාර්ය හේවාගමගේ, මහාචාර්ය තන්තිරිගම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති මහාචාර්ය චන්දන පී උඩවත්ත විසින් සමාලෝචනය කර අරමුදල් අවශ්‍යතාවය පිළිබඳව චීනයේ තානාපති පාලිත කොහොන මහතා හරහා චීනයට දන්වා ඇත. මෙම යෝජනාව එම පාර්ශවයන් සහ චීනයේ "Greatywall industries" අතර සාකච්ඡා සිදු වෙමින් පවතී.

6 මූල්‍ය පරිපාලනය

6.1 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා වන 2020 අයවැය අනුමත කර ඇත. "රට හදන සෞභාග්‍යයේ දැක්ම" පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් 2020 අයවැය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

6.2 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම

ප්‍රදාන	2020 වර්ෂය			2021 වර්ෂය		
	මුළු අරමුදල් වෙන් කිරීම රු.මි	මුදා හරින ලද මුළු අරමුදල රු.මි	මුදා හැරීමේ / භාවිතා කිරීමේ අනුපාතය, මුළු වෙන්කිරීමේ ප්‍රතිශතයක් ලෙස	මුළු අරමුදල් වෙන් කිරීම රු.මි	මුදා හරින ලද මුළු අරමුදල රු.මි	මුදා හැරීමේ / භාවිතා කිරීමේ අනුපාතය, මුළු වෙන්කිරීමේ ප්‍රතිශතයක් ලෙස
පුනරාවර්තන	49,497	49,457	99%	53,995	52,490	97%
ප්‍රාග්ධන	9,545	9,545	100%	8,400	6,549	78%
එකතුව	**59,041**	**59,002**	**99%**	**62,395**	**59,039**	**95%**

වගුව 6.2 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම

6.2.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අරමුදල් ප්‍රතිපත්තිය මත පදනම්ව 2021 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන, පුනරාවර්තන වියදම් ප්‍රදාන (RBG) හා ප්‍රාග්ධන වියදම් ප්‍රදාන (CBG) ලෙස වෙන් කරන ලදී.

6.2.2 පුනරාවර්තන වියදම් ප්‍රදාන (RBG)

විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මත පදනම්ව 2021 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ප්‍රදාන, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වෙන් කර ඇත.

6.3 මූල්‍යයන ප්‍රතිපත්තිය - ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම (CG)

6.3.1 ප්‍රාග්ධන වියදම් ප්‍රදාන (CBG)

අරමුදල් පරිහරණය කිරීමේ ප්‍රගතිය සහ රාජ්‍ය ආයෝජන වැඩසටහන සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වෙන් කරන ලදී.

ඒ අනුව, විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන පහත සඳහන් කාණ්ඩ යටතේ අනුමත ප්‍රතිපාදන තුළ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන් කරන ලදී;

රු.මිලියන

ප්‍රාග්ධන වියදම් කාණ්ඩය	2021 වෙන් කිරීම	2021 වර්ෂයේ දී නිකුත් කරන ලද අරමුදල්
ඉදිකිරීම් ව්‍යාපෘති	3,313	5,482
ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	1,069	
ස්ථාවර වත්කම් අත් කර ගැනීම	1,446	
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති	540	
පර්යේෂණ හා සංවර්ධන	252	
අයවැය යෝජනා	1,780	1,067
එකතුව	**8,400**	**6,549**

වගුව 6.3.1 ප්‍රාග්ධන වියදම් ප්‍රදාන (CBG)

6.3.2 අයවැය යෝජනා - 2021

රු.මිලියන

ප්‍රාග්ධන වියදම් කාණ්ඩය	2021 වර්ෂයට අදාළ වෙන් කිරීම	2021 වර්ෂයේ දී නිකුත් කරන ලද අරමුදල්
විශ්වවිද්‍යාලවල තාක්ෂණ පීඨ පිහිටුවීම	1,363	800
විශ්වවිද්‍යාලවල පීඨ කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් සැලසීම	25	25
නව පාඨමාලා හඳුන්වාදීම සඳහා යටිතල පහසුකම්: වෛද්‍ය පීඨය (පළමු අදියර), ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	150	-
ජාත්‍යන්තර කීර්තියක් ඇති වෘත්තීය ආයතන සමඟ ප්‍රතිනතය දිරිමත් කිරීම	50	50
කොළඹ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යානය අධ්‍යයනාංශය විසින් ආරම්භ කරන ලද කටයුතු	150	150
වව්නියා මණ්ඩපයේ පුස්තකාල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම.	42	42
එකතුව	**1,780**	**1,067**

වගුව 6.3.2 අයවැය යෝජනා – 2021

6.4 යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති – 2021

6.4.1 වසර තුළ නිම කරන ලද ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති

රු.මිලියන

විශ්වවිද්‍යාලය	ව්‍යාපෘතිය	ප්‍රදානය කළ අගය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	සම සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා සේනක බිබිලේ ගොඩනැගිල්ල ඖෂධ විද්‍යාගාර සඳහා දීර්ඝ කිරීම	76.3
මොරටුව විශ්වවිද්‍යාලය	වාස්තු විද්‍යා අධ්‍යයනාංශය - IV අදියර	109.5
	පරිපාලන ගොඩනැගිල්ල දිගු කිරීම	222.7
රුහුණු විශ්වවිද්‍යාලය	ගොඩනැගිලි සංකීර්ණය, කළමනාකරණ හා මූල්‍ය පීඨය	227.7
වව්නියා විශ්වවිද්‍යාලය	ව්‍යවහාරික විද්‍යා පීඨය	338.0
එකතුව		**974.2**

වගුව 6.4.1 වසර තුළ නිම කරන ලද ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති

6.4.2 වර්ෂය තුළ ආරම්භ කළ යටිතල පහසුකම් ව්‍යාපෘති

රු.මිලියන

විශ්වවිද්‍යාලය	ව්‍යාපෘතිය	ප්‍රදානය කළ අගය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු ගොඩනැගිල්ල	127.9
	මීවතුර නේවාසිකාගාර පරිශ්‍රයේ නව ආපන ශාලාව	36.8
	විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශය, ඉංජිනේරු පීඨය	316.2
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	කාය ව්‍යවච්ඡේද ගොඩනැගිල්ල දිගු කිරීම - වෛද්‍ය විද්‍යා පීඨය	151.0
කැලණිය විශ්වවිද්‍යාලය	අක්මා රෝග සහ බද්ධ කිරීමේ මධ්‍යස්ථානය - වෛද්‍ය පීඨය	248.0
මොරටුව විශ්වවිද්‍යාලය	ද්‍රව්‍ය විද්‍යාව හා ඉංජිනේරු අධ්‍යයනාංශය සඳහා වන ගොඩනැගිල්ල	332.2
රුහුණු විශ්වවිද්‍යාලය	ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිල්ලේ ප්‍රධාන ප්‍රතිසංස්කරණ කටයුතු- කාර්ය මණ්ඩල නිල නිවාස	83.1
	ශිෂ්‍ය ආපන ශාලාව	44.1
නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ මහාචාර්ය ඒකකය සඳහා වන ගොඩනැගිලි සංකීර්ණය	140.0

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	කෘෂි තාක්ෂණ උද්‍යානයේ යටිතල පහසුකම් සංවර්ධනය	138.4
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	විකල්ප ජල සැපයුම් පද්ධතිය	35.8
ගම්පහ වික්‍රමආරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	ශේෂ වැඩ අඛණ්ඩව කරගෙන යාම - අධ්‍යයන ගොඩනැගිල්ල	86.2
එකතුව		**1,739.7**

වගුව 6.4.2 වර්ෂය තුළ ආරම්භ කළ යටිතල පහසුකම් ව්‍යාපෘති

6.5 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතය - 2016 සිට 2021 දක්වා

රු.මිලියන

	2016	2017	2018	2019	2020	2021
1. රජයේ ප්‍රතිපාදන						
පුනරාවර්තන	29,029	30,597	36,786	46,076	49,497	53,995
ප්‍රාග්ධන	19,797	11,540	19,454	13,980	9,545	8,400
2. වියදම						
පුනරාවර්තන	27,999	29,874	35,935	45,544	49,457	52,490
ප්‍රාග්ධන	15,162	10,478	14,098	10,820	9,545	6,549
3. ශිෂ්‍ය මූල්‍ය ආධාර						
මහපොල	912	859	1,305	1,257	1,420	1,138
ශිෂ්‍යාධාර	832	539	521	707	705	862

වගුව 6.5 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතය - 2016 සිට 2021 දක්වා

සටහන I : *අයවැය යෝජනාව මගින් වෙන් කරන ලද අරමුදල් වාර්ෂික ප්‍රතිපාදනවලට ඇතුළත් කර ඇත.*

සටහන II: *භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අරමුදල් පුනරාවර්තන, ප්‍රාග්ධන සහ ශිෂ්‍ය මූල්‍ය ආධාර වියදම් ලෙස සටහන් කර ඇත.*

6.6 මහපොළ සහ ශිෂ්‍යාධාර වියදම් 2021

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	මහපොළ	ශිෂ්‍යාධාර	එකතුව
1	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	96.75	37.97	134.72
2	කොළඹ විශ්වවිද්‍යාලය	157.70	15.83	173.53
3	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	158.13	51.92	210.05
4	කැලණිය විශ්වවිද්‍යාලය	146.81	98.63	245.45
5	මොරටුව විශ්වවිද්‍යාලය	73.44	14.38	87.82
6	රුහුණ විශ්වවිද්‍යාලය	79.22	58.34	137.56
7	යාපනය විශ්වවිද්‍යාලය	109.26	105.02	214.28
8	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	30.44	63.00	93.44
9	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	48.31	75.09	123.40
10	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	55.85	57.52	113.36
11	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	34.71	60.42	95.13
12	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	52.46	38.27	90.73
13	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	25.23	23.85	49.08
14	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	14.25	23.42	37.67
15	කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය	5.32	4.90	10.22
16	ගම්පහ වික්‍රමආරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	1.62	9.72	11.34
17	වව්නියාව විශ්වවිද්‍යාලය	7.73	27.27	35.01
18	ත්‍රිකුණාමලය මණ්ඩපය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	9.40	24.04	33.44
19	ශ්‍රීපාලි මණ්ඩපය	5.15	5.58	10.73
20	ස්වාමී විපුලානන්ද සෞන්දර්ය විශ්වවිද්‍යාලය	5.62	13.36	18.98
21	දේශීය වෛද්‍ය ආයතනය	9.75	18.68	28.42
22	තාක්ෂණ විද්‍යා ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය	10.30	34.50	44.80
එකතුව		**1138.00**	**862.00**	**2000.00**

වගුව 6.6 විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම - 2021

6.7 2021.12.31 දිනට මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන්නන් සංඛ්‍යාව

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	මහපොළ	ශිෂ්‍යාධාර	එකතුව
1	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	6,951	977	7,928
2	කොළඹ විශ්වවිද්‍යාලය	6,811	466	7,277
3	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	9,311	1,264	10,575
4	කැලණිය විශ්වවිද්‍යාලය	7,323	1,906	9,229
5	මොරටුව විශ්වවිද්‍යාලය	4,402	496	4,898
6	රුහුණ විශ්වවිද්‍යාලය	4,829	2,672	7,501
7	යාපනය විශ්වවිද්‍යාලය	5,504	3,566	9,070
8	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	1,846	2,920	4,766
9	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	2,162	2,651	4,813
10	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	3,362	2,447	5,809
11	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	2,752	2,385	5,137
12	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	2,568	1,129	3,697
13	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	1,228	792	2,020
14	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	1,151	1,234	2,385
15	කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය	407	66	473
16	ගම්පහ වික්‍රමආරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	154	221	375
17	වවිනියාව විශ්වවිද්‍යාලය	428	882	1,310
18	ත්‍රිකුණාමලය මණ්ඩපය	432	896	1,328
19	ශ්‍රීපාලි මණ්ඩපය	238	211	449
20	ස්වාමී විපුලානන්ද සෞන්දර්ය විශ්වවිද්‍යාලය	356	651	1,007
21	දේශීය වෛද්‍ය ආයතනය	498	394	892
22	තාක්ෂණ විද්‍යා ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය	316	956	1,272
එකතුව		**63,029**	**29,182**	**92,211**

වගුව 6.7 2021.12.31 දිනට මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන්නන් සංඛ්‍යාව

6.8 මහපොළ සහ ශිෂ්‍යාධාර සාරාංශය

අ) මූලික තොරතුරු

විස්තරය	මහපොළ	ශිෂ්‍යාධාර
ශිෂ්‍යත්ව වාරිකය (රු.)	5,000/-	4,000/-
මහපොළ භාරකාර අරමුදලේ දායකත්වය (රු.)	2,550/-	-
භාණ්ඩාගාරය - දායකත්වය (රු.)	2,450/-	4,000/-
වසරකට වාරික ගණන	10	10
මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන සිසුන් සංඛ්‍යාව	63,029	29,182

වගුව 6.8 (අ) මහපොළ සහ ශිෂ්‍යාධාර පිළිබඳ මූලික තොරතුරු

ආ) මහා භාණ්ඩාගාරය විසින් කළ මුදල් වෙන් කිරීම සහ නිකුත් කිරීම් (රු. මිලියන)

වර්ගය	මුළු ප්‍රතිපාදන 2021	හා. මෙ. දෙ. විසින් නිකුත් කරන ලද අරමුදල්	අරමුදල් භාවිතා කර ඇත
මහපොළ සහ ශිෂ්‍යාධාර	2,000	2,000	2,000

වගුව 6.8 (ආ) මහා භාණ්ඩාගාරය විසින් මහපොළ සහ ශිෂ්‍යාධාර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් සහ නිකුත් කිරීම්

ඇ) ගෙවීම් තත්ත්වය

විස්තරය	මහපොළ	ශිෂ්‍යාධාර
අධ්‍යයන වර්ෂ (02, 03, 04 සහ 05 වසර)	2021 නොවැම්බර් දක්වා ගෙවා ඇත.	2021 දෙසැම්බර් දක්වා ගෙවා ඇත.
පළමු වසර	අධ්‍යයන වර්ෂයේ ආරම්භය පදනම් කරගෙන ගෙවීම් සිදු කර ඇත.	

වගුව 6.8 (ඇ) මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් තත්ත්වය

7. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව

2021 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා විවිධ සේවක කාණ්ඩ 5ක් යටතේ අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 325ක් වූ අතර 2021 දෙසැම්බර් 31 වන විට සේවයේ නියුක්ත සංඛ්‍යාව 245 ක් විය පුරවා නොමැති පුරප්පාඩු ගණන 79 කි. තොරතුරු 7.1 වගුවේ දක්වා ඇත.

කාර්ය මණ්ඩල කාණ්ඩය		වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
ප්‍රාථමික මට්ටම	නුපුහුණු	U-PL 1	44	36	8
	අර්ධ පුහුණු	U-PL 2	3	1	2
	පුහුණු	U-PL 3	18	15	3
ද්විතියික මට්ටම	කළමනාකරණ සහකාර	U-MN 1	151	114	37
	කළමනාකරණ සහකාර (IT)	U-MT 1	4	2	2
	සහකාර නිලධාරී කාණ්ඩය b	U-MN 2	8	6	2
	සහකාර නිලධාරී කාණ්ඩය a	U-MN 3	6	2	4
	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර	U-MN 4	18	18	0
තෘතීයික මට්ටම	අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය කාණ්ඩය. 2	U-AS 1	3	1	2
	අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය කාණ්ඩය. 1	U-AS 2	6	5	1
	විධායක (කණිෂ්ඨ මට්ටම)	U-EX 1	18	10	8
	විධායක (මධ්‍යම මට්ටම)	U-EX 2	33	27	6
ජ්‍යෙෂ්ඨ මට්ටම	විධායක (ජ්‍යෙෂ්ඨ මට්ටම)	U-EX 3	6	4	2
	අධ්‍යයන කාර්ය මණ්ඩලය	U-AC 1 සිට U-AC 2	7	4	2
	අධ්‍යයන කාර්ය මණ්ඩලය (ජ්‍යෙෂ්ඨ මට්ටම)	U-AC 3සිට U-AC 5	**325**	**245**	**79**

වගුව 7.1 2021 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යා විස්තර

7.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයන්ගේ පත්වීම්, උසස්වීම්, සේවය ස්ථීර කිරීම්

2021 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත විධායක ශ්‍රේණි පත්වීම් දෙකක් (02), ලිපිකරු ශ්‍රේණි පත්වීම් තුනක් (03), කොන්ත්‍රාත් පදනම මත එක් (01) පත්වීමක් - සප්ත වාර්ෂික නිවාඩු මත සහ කොන්ත්‍රාත් පදනම මත පත්වීම් තුනක් (03) ඇතුළුව නව පත්වීම් නවයක් (09) සිදු කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවකයින් 35 දෙනෙකු සේවයේ ස්ථීර කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් (EB) අවශ්‍යතා සඳහා ඇගයීමෙන් පසු සේවකයින් නව දෙනෙකු (09) උසස් කරන ලද අතර එක් (01) පත්කිරීමක් සිදු කරන ලදී. තවද, නැවත රාජකාරි ආරම්භ කිරීම් දෙකක් (02) සිදු වූ අතර, එක් සේවිකාවක් (01) ඇයගේ පැවරුම් කාලය සම්පූර්ණ කිරීම හේතුවෙන් එම තනතුරෙන් ඉවත් වන ලදී.

7.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයින්ගේ අභ්‍යන්තර මාරුවීම්, සේවා සම්මාන සහ විශේෂ අරමුණු නිවාඩු

2021 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර මාරුවීම් දොළහක් (12) වාර්තා විය. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678, 696 සහ 893 හි විධිවිධාන යටතේ සේවකයින් නව (09) දෙනෙකු විශ්වවිද්‍යාල පද්ධතියට කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් සේවා සම්මාන ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර ඔවුන්ට ඒ වෙනුවෙන් මුදල් ත්‍යාගයන් ලබා දෙන ලදී.

7.3 සේවකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලය හැරයාම්

2021 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන අතර ස්ථාන මාරු දාහතරක් (14) සිදු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ සුහද ස්ථාන මාරු දෙකක්(02), විශ්‍රාම යාමට සූදානම් වීමේ නිවාඩු දෙකක් (02), විශ්‍රාම ගැන්වීම් තුනක් (03), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවයෙන් ස්ථිරව නිදහස් කිරීම් එකක් (01) සහ එක් (01) ඉල්ලා අස්වීමක් වාර්තා කර ඇත. තවද, 2021 වර්ෂය තුළ විභාගවලට පෙනී සිටීම සඳහා නිවාඩු හතරක් (04), වැටුප් රහිත නිවාඩු එකක් (01), ප්‍රසූත නිවාඩු දහයක් (10) සහ නිවාඩු අහෝසි කිරීම් දහයක් (10) ද වාර්තා වී ඇත.

7.4 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ලබා දෙන පුහුණු හා සංවර්ධන අවස්ථා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන වෙනම කාර්ය මණ්ඩල පුහුණු අරමුදලක් යටතේ සෑම වසරකදීම එහි කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ රාජකාරිවලට අදාළ වන වැඩමුළු / පුහුණු වැඩසටහන් වලට සහභාගී වීමට අවස්ථාව සලසා දෙන අතර එමඟින් ඔවුන්ගේ කුසලතා හා වැඩ කිරීමේ දැනුම වැඩි දියුණු කර ගැනීමට හැකියාව සැලසේ. මෙම වැඩමුළු / පුහුණු වැඩසටහන් සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල, ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), මිලෝඩා මූල්‍ය අධ්‍යයන ඇකඩමිය, ප්‍රොෆෙෂනල් ඩාර්ටිස් කෝපරේෂන් (PDC), ජාතික මානව සම්පත්

සංවර්ධන කවුන්සිලය, ශ්‍රී ලංකා ප්‍රාග් පුහුණු ආයතනය (PRAG), මැක්වයිර් රෙන්ස් ඇන්ඩ් ජෝන්ස් ආයතනය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS), ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (CIPM), RH පුහුණු සහ සංවර්ධන ආයතනය (RH Training & Development) සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය වැනි පිළිගත් ආයතන විසින් පවත්වනු ලැබීය.

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ විධායක, ලිපිකරු සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් පහත සඳහන් පරිදි පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා "zoom" තාක්ෂණය හරහා සහභාගී විය;

සේවක මට්ටම	සේවකයින් සංඛ්‍යාව
විධායක	03
ලිපිකරු	03
එකතුව	**06**

වගුව 7.4 පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ සේවකයින් සංඛ්‍යාව

7.5 සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සියලුම ස්ථීර සේවකයින් සඳහා සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දී ඇත.

7.6 සේවය අගය කිරීම හා සේවයට පිළිගැනීම

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවයෙන් ඉවත්වූ සේවකයන් ඉටු කරන ලද සේවය අගය කිරීමත්, සේවයට එක් වූ අය පිළිගැනීමටත් කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

8. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය ලබා දීමේ වගකීමට අනුකූලව මානව සම්පත් අංශය 2021 දී ස්ථාවර ප්‍රගතියක් ලබා ඇත. මානව සම්පත් අංශයට පවරා ඇති කාර්යයන් යටතේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

8.1. සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක තනතුරු 453 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.මෙම තනතුරු 453 හි විස්තර 8.1.1 වගුවේ දක්වා ඇත.

සේවක කාණ්ඩය	සේවක තනතුරු සංඛ්‍යාව
අධ්‍යයන කාර්ය මණ්ඩලය	154
අධ්‍යක්ෂ	03
පීඨාධිපති තනතුරු	02
තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය	52
පරිපාලන සහ අනෙකුත් කාර්ය මණ්ඩලය	29
වෛද්‍ය කාර්ය මණ්ඩලය	02
අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	19
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන /	66
කළමනාකරණ සහකාර තාක්ෂණික /	19
ප්‍රාථමික (පුහුණු නුපුහුණු / අර්ධ පුහුණු /)	107
එකතුව	**453**

වගුව 8.1.1 2021 දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා අනුමත කරන ලද නව සේවක තනතුරු සංඛ්‍යාව [කාණ්ඩය අනුව]

විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන	අනුමත තනතුරු ගණන
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	38
කැලණිය විශ්වවිද්‍යාලය	04
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	02
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	23
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	02
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	29
වව්නියා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	341
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ	07
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	06
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01
එකතුව	**453**

වගුව 8.1.2 විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල අනුමත සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා අමතර සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් පහත සඳහන් තාවකාලික අධ්‍යයන සේවක තනතුරු (70) අනුමත කරන ලදී.

විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන	අනුමත තනතුරු ගණන
කොළඹ විශ්වවිද්‍යාලය	04
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	08
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	04
කැලණිය විශ්වවිද්‍යාලය	02
මොරටුව විශ්වවිද්‍යාලය	13
යාපනය විශ්වවිද්‍යාලය	04
රුහුණ විශ්වවිද්‍යාලය	14
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	01
ත්‍රිකුණාමලය මණ්ඩපය	02
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	04
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	04
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	04
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	02
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	02
වව්නියාව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	01
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	01
එකතුව	**70**

වගුව 8.1.3 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තාවකාලික අධ්‍යයන සේවක සංඛ්‍යාව

8.2 පරිපාලනමය ශ්‍රේණි සඳහා පත් කිරීම / උසස් කිරීම

සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71 (2) වගන්තියේ (ii) ඡේදය සහ විශ්වවිද්‍යාල පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා පරිපාලන ශ්‍රේණියේ පත්වීම් / උසස්වීම් පිළිබඳ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඒ අනුව, 2021 වර්ෂය තුළ සිදු කරන ලද පත්වීම් සහ උසස්වීම් පිළිවෙලින් 8.2 වගුවේ සාරාංශ කොට ඇත.

පත් කරන ලද සේවක කාණ්ඩය	පත්වීම් ගණන
සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී තනතුර	21 (බාහිර කාණ්ඩය)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර (නීති හා ප්‍රලේඛන)	01
සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී තනතුර (නීති හා ප්‍රලේඛන)	01

වගුව 8.2 2021 වර්ෂයේ පරිපාලන ශ්‍රේණි සඳහා පත් කිරීම්

8.3 වෙනත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද පත්වීම් /උසස්වීම්

1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 71 (2) වගන්තියේ (iii) ඡේදයට අනුව, 2021 වර්ෂය තුළ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් දහ අටක් (18) සහ උසස්වීම් විසි දෙකක් (22) ලබා දී ඇත. මේ පිළිබඳ විස්තර 8.3.1 සහ 8.3.2 වගුවල දක්වා ඇත.

අංකය	පත් කළ තනතුර	පත්වීම් ගණන
01	චිත්‍රණ ශිල්පී II ශ්‍රේණිය	02
02	වැඩ ඉංජිනේරු (සිවිල්) III ශ්‍රේණිය	01
03	වැඩ ඉංජිනේරු (සිවිල්) II ශ්‍රේණිය	01
04	වෛද්‍ය නිලධාරී	05
05	සහකාර මුද්‍රණ ශිල්පී	01
06	ප්‍රධාන ආරක්ෂක නිලධාරී II ශ්‍රේණිය	03
07	පාලක (උද්‍යාන) III ශ්‍රේණිය	01
08	අධ්‍යක්ෂ/ මහජන සම්බන්ධතා	01
09	සංඛ්‍යාලේඛන නිලධාරී II ශ්‍රේණිය	01
10	ව්‍යාපෘති කළමනාකරු - ඉදිකිරීම් කටයුතු	01
11	කර්මාන්තශාලා ඉංජිනේරු ශ්‍රේණිය III	01
	එකතුව	**18**

වගුව 8.3.1 අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් – 2021

අංකය	තනතුර	උසස්වීම් ගණන
01	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික තාක්ෂණික නිලධාරි	07
02	ප්‍රධාන තාක්ෂණික නිලධාරි	05
03	පාලක (උද්‍යාන) Iශ්‍රේණිය	01
04	ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී	02
05	ප්‍රධාන ආරක්ෂක නිලධාරී I ශ්‍රේණිය	01
06	ගොවිපල කළමනාකරු I ශ්‍රේණිය	01
07	ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ නිලධාරි (ඉහළ ශ්‍රේණිය)	02
08	වැඩ ඉංජිනේරු (සිවිල්) II ශ්‍රේණිය	01
09	නියෝජ්‍ය විනයාරක්ෂක	01
10	ගොවිපල කළමනාකරු II ශ්‍රේණිය	01
	එකතුව	**22**

වගුව 8.3.2 අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද උසස්වීම් - 2021

8.4. කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන් පත් කිරීම

1979.11.27 දිනැති අංක 50 දරන කොමිෂන් සභා චක්‍රලේඛය, 1996.10.18 දිනැති 692 කොමිෂන් සභා චක්‍රලේඛය, 1998.09.15 දිනැති 742 කොමිෂන් සභා චක්‍රලේඛය සහ 2019.10.18 දිනැති 10/2019 කොමිෂන් සභා චක්‍රලේඛය සහ ලිපිකරු III ශ්‍රේණියේ තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන අනුව 2021.11.13 දින කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් පත් කිරීම සඳහා මාර්ගගත අයදුම් කිරීමේ ක්‍රමය හරහා අයදුම්පත් කැඳවනු ලැබීය.

8.5. විශ්වවිද්‍යාල අතර ස්ථාන මාරු 2021

විශ්වවිද්‍යාල පනතේ 78 වන වගන්තියට අනුව, 2021 වර්ෂය තුළ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ථාන මාරුවීම් 188ක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පහසුකම් ලබා දී ඇත;

- පරිපාලන කාර්ය මණ්ඩලය - 28
- අනධ්‍යයන / පරිපාලනමය නොවන කාර්ය මණ්ඩලය - 160

8.6 වෘත්තීය සමිති රැස්වීම්

අධ්‍යයන කාර්ය මණ්ඩල සංගමය සමඟ රැස්වීම් තුනක් (03), පරිපාලන මාණ්ඩලික සංගමය සමඟ රැස්වීම් දෙකක් (02) සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංගම් සමඟ රැස්වීම් හයක් (06) 2021 වර්ෂය තුළ පවත්වන ලදී.

8.7 කළමනාකරණ කමිටුව

2021 වර්ෂය තුළ කළමනාකරණ කමිටුවේ රැස්වීම් විසිහතරක් (24) පැවැත්විණි.

8.8 සහනදායී කොන්දේසි මත මෝටර් රථ වාහන බලපත්‍ර සඳහා අයදුම්පත්

2021 ජනවාරි 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සහන කොන්දේසි මත මෝටර් වාහන බලපත්‍ර සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් අයදුම්පත් 224 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී තිබේ.

සංශෝධිත 2016.07.14 දිනැති අංක 01/2016 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයට අනුව මෙම අයදුම්පත් ලැබුණු අතර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම අයදුම්පත් වසර පුරාම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබේ.

9. යටිතල පහසුකම් සංවර්ධනය

2021 වසරේ දී, නව ඉදිකිරීම් හා අඛණ්ඩව සිදු කෙරෙන ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත් කර ගැනීම්, මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සහ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු. මිලියන 8,400 ක මුදලක් වෙන් කරන ලදී. 2021 වසර අවසන් වන විට රු.මිලියන 6,549 ක මුළු මුදලක් භාණ්ඩාගාරය විසින් නිර්දේශ කර නිකුත් කරන ලදී.

වර්ෂය තුළදී, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් නව ව්‍යාපෘති යෝජනා 33 ක් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, එහි සෝදිසි කිරීම් හා ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව, 2021 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද්දේ ව්‍යාපෘති

යෝජනා* 17 ක් පමණි. රේඛිය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ දී ව්‍යාපෘති යෝජනා 17 ම අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාධන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදි. 2021 වර්ෂයේ දී භෞතිකව වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන 12 ක් වන අතර විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වටිනාකම රු. මිලියන 62,202 ක් වන වැඩ ආරම්භ කර සැලසුම් හා ඉදිකිරීම් ක්‍රියාවලියේ විවිධ මට්ටම්වල පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 80 ක් පවතින අතර සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,131 ක් වන ව්‍යාපෘති 5 ක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දී ඇත. විස්තර පහත දැක්වේ.

	2018		2019		2020		2021	
	ව්‍යාපෘති සංඛ්‍යාව	මූළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මූළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මූළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මූළු වටිනාකම (රු.මි)
වි.ප්‍ර.කොා. ස. වෙත ලැබුණු ව්‍යාපෘති යෝජනා ගණන	48	28,979.42	39	18,906.75	34	8,857.79	33	16,598.11
වි.ප්‍ර.කොා.ස මඟින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	*26	24,719.24	19	6,331.26	16	7,630.97	17	7,003.71
ජාතික ක්‍රමසම්පාදන දෙ. වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	*26	24,719.24	14	6,382.96	16	7,630.97	22	14,288.69
ජාතික ක්‍රමසම්පාදන දෙ. විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	*14	14,213.46	11	2,845.80	1	182.45	1	132.00
අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	*19	22,846.03	21	14,544.20	-	-	-	-
වර්ෂය තුළ දී ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන	#*11	7,117.00	16	3,581.70	9	6,794.90	**12**	1.739.70
දැනට සිදුකරගෙන යන ව්‍යාපෘති ගණන (සිදු කෙරෙමින් පවතින)	#*90	47,783.00	179	28,323	91	30.865.0	**80**	62.202.0
අවසන් කර ඇති ව්‍යාපෘති ගණන	#*98	30,248.00	17	5,723	21	6,521.0	**5**	1.131.0

* *පෙර වර්ෂවල ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ද ඇතුළත්ව*

\# *ව්‍යාපෘතියේ භෞතික තත්ත්වය පමණක් සලකනු ලැබිණි*

වගුව 9.1 **නිම කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දුන් ව්‍යාපෘති**

10. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු (QAC)

ශක්තිමත් තත්ත්ව ආරක්ෂණ (QA) පද්ධතියක සහයෝගයෙන්, උසස් අධ්‍යාපනයේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය (QAC) ආරම්භ කරන ලදී .

2021 වර්ෂය තුළ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයෙහි කාර්යභාරය සහ කටයුතු පහත දැක්වේ;

කොවිඩ් - 19 වසංගතය සමඟ විශේෂයෙන් බාහිර සමාලෝචන සහ ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම ආදිය සම්බන්ධව 2021 වර්ෂය තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට ඉතා අභියෝගාත්මක විය. මහාචාර්ය තිලක් ගමගේ, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ නව අධ්‍යක්ෂක ලෙස 2021 මැයි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලද අතර එතෙක් වැඩබලන අධ්‍යක්ෂ ලෙස (කොන්ත්‍රාත් පදනම මත) සම්මානිත මහාචාර්ය කල්‍යාණි පෙරේරා පත් කරන ලදී. තත්ත්ව ආරක්ෂණය කවුන්සිලය වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් විසින් සහාය දක්වන අතර තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙන ලදී. ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව 2021 දෙසැම්බර් 31 වන විට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ ප්‍රගතිය පහත පරිදි වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්මේ ඉලක්ක අංක 3: ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නවෝත්පාදන හරහා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.

අරමුණ අංක 08 - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතන සහ ඔවුන් විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් ගෝලීයව සහ දේශීයව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වන බව තහවුරු කිරීම පිණිස අඛණ්ඩ පරීක්ෂණය, අධීක්ෂණය සහ සංවර්ධනය කිරීම.

10.1. විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම

අලුතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල දෙක (2) හැර, රාජ්‍ය විශ්වවිද්‍යාල 15 හි සියලුම අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකවලින් කාර්තුමය ප්‍රගති වාර්තා නිතිපතා ලබා ගන්නා ලදී. 2021 වර්ෂයේ තුන්වන කාර්තුව (Q3) වන විට CQA 14/15 ක් ලබා, කාර්ය සාධන ලකුණු කාඩ්පතේ 80% කට වඩා වැඩි අගයක් ලබා ඇති අතර ඒ අනුව, එය උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියේ ඉලක්කය සපුරා ගෙන ඇත. 2020 වර්ෂයේ අවසානය වන විට, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂ විසින් විශ්වවිද්‍යාල 12/15 වෙත ගොස් ඇති අතර කෙසේ වෙතත්, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් භෞතික සංචාර තාවකාලිකව අත්හිටුවන ලදී. රට වසා දමා තිබූ කාල සීමාව තුළ ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලියට විශේෂ අවධානයක් යොමු කරමින් අදාළ විශ්වවිද්‍යාලවල තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සාකච්ඡා කිරීමට, 2021 දෙසැම්බර් 10 වන දින තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂවරුන් සමඟ සැසියක් පවත්වන ලදී.

10.2. පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශයන් සංවර්ධනය කිරීම

විෂය ඉම් ලකුණු ප්‍රකාශන සංවර්ධන ක්‍රියාවලිය සහ නව විෂය ඉම් ලකුණු ප්‍රකාශන ඇති කිරීමේ යාන්ත්‍රණය සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය 2015 අනුවාදයට අනුකූල වන පරිදි පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශන සංශෝධනය කිරීම සම්බන්ධයෙන් දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විශාල ප්‍රයත්නයක් දැරීය. 2020 දී, විෂය ඉම් ලකුණු ප්‍රකාශන සංශෝධන සඳහා ඉල්ලීම් විද්‍යාව, වෛද්‍ය විද්‍යාව සහ දන්ත වෛද්‍ය විද්‍යා තුලින් ලැබුණු අතර එක් එක් විෂය ලකුණු කාඩ්පත් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ සහාය ලබා දෙන ලදී. කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව 2021 දෙසැම්බර් මස වන විට සංශෝධිත විෂය ඉම් ලකුණු ප්‍රකාශන හයක් (6) සම්පූර්ණ කර ඇත. තවද, නව විෂය ඉම් ලකුණු ප්‍රකාශන දෙකක (2) සංවර්ධන කටයුතු සිදු වෙමින් පවතී.

10.3. ආයතනික සමාලෝචන පැවැත්වීම (IRs)

සමාලෝචනවල දෙවන වටය 2017-2021 කාලසීමාව සඳහා සැලසුම් කර ඇති අතර අපේක්ෂිත ප්‍රතිඵලය වූයේ රාජ්‍ය විශ්වවිද්‍යාල 15 ක සමාලෝචන වාර්තා ප්‍රකාශයට පත් කිරීමයි. කොවිඩ් - 19 හේතුවෙන්, සමාලෝචන ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවන ලද අතර, කැලණිය විශ්වවිද්‍යාලයේ සහ රුහුණු විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂය සඳහා වන සමාලෝචන 2021 වර්ෂය දක්වා කල් දැමීමට සහ නව මාර්ගගත ක්‍රමවේදයක් පිහිටුවීමට කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව, සමාලෝචන ක්‍රියාවලියේ කොටසක් මාර්ගගත ක්‍රියාවලියක් බවට පරිවර්තනය විය. මාර්ගගත ක්‍රියාවලිය භාවිතා කරමින්, සාක්ෂි තහවුරු කර ගැනීම (verification of evidence) සහ කැලණිය සහ රුහුණ විශ්වවිද්‍යාලවල සමාලෝචන දෙකක් ආරම්භ කරන ලදී. ආයතනික සමාලෝචන සඳහා වන ක්ෂේත්‍ර චාරිකා සිදු කිරීම දින දෙකකට සීමා කරන ලද අතර 2021 වර්ෂය අවසාන වන විට කැලණිය සහ රුහුණු විශ්වවිද්‍යාලවල ආයතනික සමාලෝචන දෙකක් සම්පූර්ණ කරන ලදී. (2021 වර්ෂය වන විට සමස්ත ප්‍රගතිය- විශ්වවිද්‍යාල 12/15 ක් සමාලෝචනය කරන ලදී).

2021 දී පැවැත්වීමට නියමිත සමාලෝචන (ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාල, කොළඹ විශ්වවිද්‍යාල, පේරාදෙණිය විශ්වවිද්‍යාල) පවතින ආයතනික සමාලෝචන අත්පොත සංශෝධනය කිරීමෙන් පසුව පවත්වනු ලැබේ. 2021 දී අත්පොත සංශෝධනය කිරීම සඳහා මණ්ඩලයක් පත් කරන ලද අතර සංශෝධිත අත්පොත 2022 පෙබරවාරි වන විට භාවිතා කිරීමට හැකි වනු ඇත. සංශෝධිත අත්පොත ක්‍රියාත්මක කිරීමත් සමඟ තෙවන සමාලෝචන වටය (2022- 2026) ද ආරම්භ කෙරේ.

2018 වසරේ පවත්වන ලද සියලුම ආයතනික සමාලෝචන සඳහා පසු විපරම් ක්‍රියාකාරී සැලසුම් ලැබී ඇති අතර 2019 වසරේ ආයතනික සමාලෝචන පැවැත්වූ වූ විශ්වවිද්‍යාල හතරට ඉහත පරිදි ක්‍රියාකාරී සැලසුම් ලබා දෙන මෙන් ඉල්ලීම් සිදු කර ඇත. එම විශ්වවිද්‍යාල හතරෙන් දෙකක් 2021 අවසන් වන විට ක්‍රියාකාරී සැලසුම් එවා ඇත.

සමාලෝචකයින් සහ ස්වයං ඇගයීම් වාර්තා සකස් කරන්නන් සඳහා පුහුණු වැඩමුළු 2019 සහ 2020 දී අඛණ්ඩව පවත්වන ලදී. කෙසේ වෙතත්, කොවිඩ් 19 සංචරණ සීමාවන්

හේතුවෙන් 2020 සමාලෝචන වටයේ සමාලෝචකයින් සඳහා පූර්ව-සමාලෝචන වැඩමුළුව 2021 වර්ෂයේදී ZOOM තාක්ෂණය හරහා පවත්වන ලදී.

10.4. වැඩසටහන් සමාලෝචන පැවැත්වීම (PRs)

2020 සමාලෝචන යටතේ, විද්‍යා, ඉංජිනේරු, වාස්තු විද්‍යා සහ භූ විඥාපන පීඨවල වැඩසටහන් සමාලෝචන 59ක් තවමත් අවසන් කර නොමැත. කොවිඩ් 19 හේතුවෙන්, 2020 වසරට අදාළ සමාලෝචන, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව 2021 වර්ෂය දක්වා කල් දමන ලදී. වැඩසටහන් සමාලෝචන මාර්ගගත තාක්ෂණය ඔස්සේ නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. 2020 වැඩසටහන් සමාලෝචන සඳහා ලැබෙන ප්‍රතිචාරත් සමඟ, මෙම මාර්ගගත ක්‍රමවේදය සංවර්ධනය කෙරේ.

2019 පැවැත්වූ වැඩසටහන් සමාලෝචන 40 හි, සමාලෝචන නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා ක්‍රියාකාරී සැලසුම් අදාළ සමාලෝචිත පීඨවලින් ලැබී ඇත.

කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන්, 2021 වසරේ බාහිර උපාධි වැඩසටහන්වලට අදාළ ආචාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා වන ස්වයං ඇගයීම් වාර්තා ලේඛකයින්ගේ වැඩමුළුව සහ 2020 වැඩසටහන් සමාලෝචනයේ සමාලෝචකයින් සඳහා වන පූර්ව සමාලෝචන වැඩමුළුව පමණක් පවත්වන ලදී. 2020 සමාලෝචන චක්‍රයේ වැඩසටහන් සමාලෝචකයන්ගේ ඇගයීම් වාර්තා ලැබී ඇති අතර ඒවා ග්‍රන්ථනය කරන ලදී.

වැඩසටහන් සමාලෝචන දෙවන චක්‍රය යටතේ, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් 2022 දී පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය කිරීමට සැලසුම් කළේය. AHEAD ව්‍යාපෘතියේ මූල්‍ය සහ තාක්ෂණික සහාය ඇතිව ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් සමාලෝචනය සඳහා වන අත්පොත සකස් කිරීම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව විද්වත් කමිටුවක් පත් කරන ලදී. ‘පශ්චාද් උපාධි අධ්‍යයන වැඩසටහන් සමාලෝචනය සඳහා වූ අත්පොත සැකසීම සඳහා පත් කරන ලද විද්වත් කමිටුව විසින් සම්පූර්ණ කරන ලද අත්පොත කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. අත්පොතේ පිටපත් 500ක් මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

බාහිර උපාධි වැඩසටහන් සමාලෝචනය 2021 වර්ෂයේදී පැවැත්වීමට නියමිතව පැවතුණි. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් නිර්දේශ කරන ලද පරිදි, ස්වයං ඇගයීම් වාර්තා ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාලවලට ලබා දී තිබූ කාලය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් බාහිර උපාධි පාඨමාලා පවත්වන රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් ස්වයං ඇගයීම් වාර්තා ලබා ගත්තේය. සමාලෝචක පුහුණුව සහ සමාලෝචකයින් පත් කිරීම 2022 පළමු කාර්තුව වන විට අවසන් වනු ඇත.

10.5 ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය 2015 ට අනුකූලව සුදුසුකම් නිර්ණය කිරීම සඳහා විශ්වවිද්‍යාලවලට සහාය වීම

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) 2015 වෙත එක් එක් විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන සුදුසුකම් සිතියම්ගත කිරීමේ ක්‍රියාවලියක් සඳහා සැලසුම් කරන ලදී. 2020 දී ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ

සහතිකකරණය සඳහා සංකල්ප පත්‍රිකාවක්, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් සකස් කරන ලද අතර එය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. 2021 දී සහතිකකරණ කමිටුවේ සාමාජිකයින් පත් කරන ලද අතර, කමිටුව මේ වන විට සහතිකකරණ ක්‍රියාවලිය විධිමත් කිරීමට අවශ්‍ය කටයුතුවලට සම්බන්ධ වෙමින් එම කටයුතු සිදු කරමින් පවතී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2021.07.22 දින පැවති 1059 වැනි සභාවාරයේ දී පිහිටුවන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ සහතිකකරණ කමිටුව එහි දෙවන රැස්වීමේදී, සියලුම පාර්ශවකරුවන්ගේ පරිශීලනය සහ දැනුවත් වීම සඳහා ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ සහතිකකරණ ක්‍රියාවලි අත්පොතක් සකස් කිරීමට නිර්දේශ කරන ලදී. එම රැස්වීමේදීම, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ සහතිකකරණ ක්‍රියාවලිය, වැඩසටහන් සමාලෝචන ක්‍රියාවලිය සමඟ ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලද අතර ඒ අනුව, වැඩසටහන් සමාලෝචන සඳහා වන අත්පොතට අදාළ ප්‍රමිතීන් ඇතුළත් කරමින් සංශෝධනය කළ යුතුවේ.

කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව පහත සඳහන් නව නිරන්තරයෙන් අසන ප්‍රශ්න ස්ථාපනය කරන ලදී.

- උපාධියක් සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධියක් සඳහා අවශ්‍ය අධ්‍යයන වසරවල අවම කාලය කොපමණද?

- ලලිත කලා/දෘෂ්‍ය කලා සහ ප්‍රාසංගික කලා පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේ SLQF මට්ටමේ තත්ත්වය කුමක්ද?

- අධ්‍යයන සම්භාර අනුව MPhil සහ PhD අධ්‍යයන වැඩසටහන් සඳහා අදාළ අවම ඉගෙනුම් පරිමාව කොපමණද?

- යුරෝපීය අධ්‍යයන සම්භාර හුවමාරු පද්ධතිය (ECTS) සහ එක්සත් රාජධානියේ අධ්‍යයන සම්භාර අනුව ඔබ SLQF අධ්‍යයන සම්භාර අර්ථකථනය කරන්නේ කෙසේද?

10.6. අධ්‍යයන වගවීම පිළිබඳ පොදු මාර්ගෝපදේශ සකස් කිරීම

වැඩ සම්මතයන් අධීක්ෂණය කිරීම වෙනම පරිපාලන ක්‍රියාවලියක් හරහා සිදු කළ යුතු බව තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව තීරණය කරන ලදී. ඒ අනුව රුහුණු විශ්වවිද්‍යාලය මගින් ක්‍රියාත්මක කරන අන්තර්ජාල දත්ත ගබඩා කළමණාකරණ පද්ධතිය පිළිබඳව තත්ත්ව ආරක්ෂණ කවුන්සිලවල අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමට හා 2019 වර්ෂයේදී ඔවුන්ගේ විශ්වවිද්‍යාල තුළ ද එවැනි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට උපදෙස් කිරීම සඳහා සැසියක් පවත්වන ලදී.

10.7. පොදු අධ්‍යයන කාලසටහනක් (Academic Calender) සඳහා ක්‍රියා කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම

2020 දී පොදු අධ්‍යයන කාලසටහනක් පවත්වා ගැනීමට සංකල්ප පත්‍රිකාවක් තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් සකස් කරන ලද අතර එය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. පළමු පියවර ලෙස, 2018 ඔක්තොම්බර් 1 සිට 2019 සැප්තැම්බර් 30 දක්වා මාස 12ක කාලයක් සඳහා සෑම පීඨයකම, අවසන් වරට ලියාපදිංචි වූ කණ්ඩායම, දැනට

ලියාපදිංචි වී ඇති කණ්ඩායම්, එම කාල සීමාව තුළ සමත් වූ කණ්ඩායමට අදාළව ඔවුන් උපාධිය ලබා ගැනීමට කොපමණ කාලයක් ගත වූවාද යන්න විශේෂයෙන් කාලසටහන කඩ වීමට හේතු පිළිබඳ ප්‍රශ්නාවලියක් මඟින් දත්ත එක්රැස් කරන ලදි. කෙසේ වෙතත්, වසංගත තත්ත්වය හේතුවෙන්, සියලුම විශ්වවිද්‍යාලවල සියලුම අධ්‍යයන කාල සටහන් සංශෝධනය කර ඇති අතර, එම ක්‍රියාවලිය මුල සිට නැවත ආරම්භ කිරීම සඳහා 2021 දී නැවත තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් නව දත්ත එකතු කිරීමක් සිදු කරන ලදී.

10.8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ සුදුසුකම් සඳහා වූ ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ සුදුසුකම් සඳහා වූ ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ සංකල්ප පත්‍රිකාවේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් විසින් ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳ දළ සටහනක් දක්වා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2021.03.25 දින පැවති 1051 වැනි සභාවාරයේ දී මෙම මධ්‍යස්ථානයේ ඇති වැදගත්කම සහ රටෙහි පවතින අවශ්‍යතාව හඳුනා ගනිමින් මෙය අනුමත කරන ලදී. එසේම, 2021 මාර්තු මස 10 වන දින පැවති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය උපකුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ 36 වන ඒකාබද්ධ රැස්වීමේදී මෙම කාරණය සාකච්ඡාවට ගෙන ඇති අතර, මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය වෙත වගකීම පවරන ලදී.

ඉහත අවශ්‍යතා සහ යෝජිත මධ්‍යස්ථානය විසින් ඉටු කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් සැලකිල්ලට ගෙන, තවදුරටත් ඉදිරියට යා යුතු ආකාරය පිළිබඳව උපදෙස් දෙන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිනු ඇත.

2021 කාලය තුළ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් අනෙකුත් අංශවලට අදාලව සිදු කර ඇති වැඩ කටයුතුවලට පහත සඳහන් දෑ අයත් වේ:

- නව උපාධි හා පශ්චාද් උපාධි වැඩසටහන්, අධ්‍යයනාංශ සහ පීඨ අනුමත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීම;

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකම් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන උපාධිවල SLQF මට්ටම සහ මහජනතාව සිදු කරන වෙනත් විමසීම්වලට අදාළව පැහැදිලි කිරීම් සැපයීම,

- විශ්වවිද්‍යාලවල තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම්වල ශිෂ්‍ය සහභාගිත්වය;

- අධ්‍යයන වගවීම සක්‍රීය කිරීමේ යාන්ත්‍රණ

මේ සඳහා වන වෙබ් අඩවියක් මඟින් පුහුණු වැඩමුළු, බාහිර සමාලෝචන පිළිබඳ වාර්තා, කොමිෂන් සභා චක්‍රලේඛ සහ තත්ත්ව ආරක්ෂණය සම්බන්ධ ප්‍රකාශන සහ අනෙකුත් අදාළ ප්‍රවෘත්ති සහ සිදුවීම් පිළිබඳ වාර්තා සමඟින් නිතිපතා යාවත්කාලීන වේ.

11. තොරතුරු තාක්ෂණ සහාය

පැවරී ඇති වගකීම්වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවත් සහ අඛණ්ඩ පරිගණක පද්ධතින් සහතික කිරීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අංශය කළමනාකරණ සහාය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවල සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම, පවත්නා පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා / පිරිවිතරයන් සකස් කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය, පරිගණක, සන්නිවේදන පද්ධති හා ජාලයේ සමස්ත පරිපාලනය මෙන්ම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ 2021 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයකි.

- නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම සහ පවතින පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා සහ පිරිවිතරයන් සැකසීම, මෘදුකාංග ඇතුළු පරිගණක පද්ධතියේ සහ ජාලයේ සමස්ත පරිපාලනය, සන්නිවේදන පද්ධති, දත්ත සැකසුම් ක්‍රියාකාරකම් සහ ආයතනයේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සැපයීම සඳහා සෞඛ්‍ය සම්පන්න අඛණ්ඩ පරිගණක පද්ධතියක් කළමනාකරණය කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) සහ වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වන ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), ශ්‍රී ලංකා ටෙලිකොම්, LK Domain Registry සමඟ සම්බන්ධීකරණය කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නවතම තොරතුරු තාක්ෂණයන් හඳුන්වා දීම.

- වෙබ් අඩවි පරිපාලනය සහ නඩත්තු කිරීම;
  - නිල වෙබ් අඩවිය : https://www.ugc.ac.lk/
  - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් ද්වාරය: https://www.eugc.ac.lk/

ඉ.වෙන්කරවා ගැනීම් - රැස්වීම් ශාලා වෙන් කිරීම් කළමනාකරණය කිරීම

ඉ.ලේඛන - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රයෝජනවත් අභ්‍යන්තර ලේඛන එකතු කිරීම

ඉ.අධ්‍යයන - අධ්‍යයන කටයුතු සම්බන්ධ තොරතුරු

eHRMS - සේවක පැමිණීම / රක්ෂණ, සේවක පරිපාලනය සම්බන්ධ තොරතුරු

ඉ.ගබඩාව - ගබඩාවලින් අයිතම ඉල්ලීමට අදාළ ද්‍රව්‍ය ඉල්ලීම් යෙදවූම

- සාර්ථක ප්‍රතිඵල ලබා දීම සඳහා පහත ක්ෂේත්‍ර යටතේ ආවරණය කිරීමට, යෙදවුම් සංවර්ධන කණ්ඩායම සහ සේවා සපයන්නන් සම්බන්ධීකරණය කිරීම

    - 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළ අවම කඩඉම් ලකුණු වෙබ් අඩවිය ඔස්සේ නිකුත් කිරීම.

    - කෙටි පණිවුඩ සහ රජයේ තොරතුරු මධ්‍යස්ථානය (1919 ඇමතුම් මධ්‍යස්ථානය) විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ ක්‍රියාකාරකම්.

    - විශ්වවිද්‍යාල සඳහා මාර්ගගත ශිෂ්‍ය ලියාපදිංචිය - 2020/2021 අධ්‍යයන වර්ෂය

    - මාර්ගගත අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය - 2020/2021 අධ්‍යයන වර්ෂය

- ICTA සමඟ එක්ව මාර්ගගත ගෙවීම් ද්වාරයේ ක්‍රියාවලිය පරිපාලනය සහ සම්බන්ධීකරණය:

    - විදේශීය විශ්වවිද්‍යාල සහ දේශීය රාජ්‍ය නොවන ආයතන සඳහා පිළිගැනීමේ සහතික නිකුත් කිරීම.

- වෙබ් ද්වාරය, රැස්වීම් ශාලා වෙන්කිරීමේ පද්ධතිය, පිරිස් අංශය සඳහා සේවකයින්ගේ පැමිණීම සලකුණු කිරීම සඳහා වන eHRM පද්ධතිය, සේවක උසස් වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ පද්ධතිය වැනි ව්‍යාපාරික යෙදවුම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

ඉහත විෂය පථයට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවෙන් නිසි ක්‍රියාකාරිත්වයෙන් යුතු තොරතුරු තාක්ෂණ පරිසරයක් කළමනාකරණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විවිධ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් සිදු කරන අතර මෙම වාර්තාවේ දැක්වෙන්නේ 2021 වර්ෂයේ සිදු කරන ලද විශේෂිත ක්‍රියාකාරකම්වල සාරාංශයක් පමණි.

11.1 මෘදුකාංග සංවර්ධන

i. උසස්වීම් සඳහා මාර්ගගතව අයදුම්පත් කැඳවීම සහ එක ක්‍රියාවලිය හැසිරවීමේ පද්ධතිය

කළමනාකරණ සහකාර තනතුරට උසස් කිරීම සහ ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්ව කළමනාකරණ සහකාර III ශ්‍රේණියට පත් කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි.

ii. මාර්ගගත ප්‍රේරණ පුහුණු වැඩසටහන සහ වැඩසටහන් හැසිරවීමේ පද්ධතිය

විශ්වවිද්‍යාල පරිපාලන හා මූල්‍ය නිලධාරීන්ගේ තොරතුරු රැස් කිරීම සහ ප්‍රේරක පුහුණු වැඩසටහන හැසිරවීම සඳහා මාර්ගගත පෝරමය සකස් කිරීම.

iii. ගබඩා කළමනාකරණ පද්ධතිය

ගබඩා කළමනාකරණ පද්ධතිය මඟින් ගබඩාවල ඇති සියලුම අයිතම පිළිබඳ තොරතුරු දත්ත ගබඩාවකට එක්රැස් කරන අතර සියලුම අංශවලට ඔවුන්ගේ ද්‍රව්‍ය ඉල්ලීම් පෝරමය පහසුවෙන් ඉදිරිපත් කිරීමට සබැඳි යෙදවුමක් හරහා මෙම දත්ත ගබඩාවට ප්‍රවේශ විය හැකිය.

iv. නීති සහ ප්‍රලේඛන අංශය සඳහා ගොනු බෙදා හැරීමේ පද්ධතිය

මෙම අංශයට ලැබෙන ලිපි හැසිරවීමට සහ අංශයේ වඩාත් ආරක්ෂිත සහ සුමට ක්‍රියාකාරිත්වය සඳහා ලිපිවල ස්කෑන් පිටපත් තබා ගැනීමට මෙම යෙදවුම භාවිතා වේ.

11.2 ජාල සහ දෘඩාංග වැඩිදියුණු කිරීම

තොරතුරු තාක්ෂණ අංශය විසින් සුමට තොරතුරු තාක්ෂණ පරිසරයක් සහතික කිරීම සඳහා දෘඩාංග හා ජාල ආශ්‍රිත මෙහෙයුම් ක්‍රියාකාරකම් සිදු කරයි.

- දැනට පවතින දුරකථන පද්ධතියේ ගැටලු හඳුනාගෙන ඒවා විසඳීමට කටයුතු කිරීම.
- ඉල්ලීම් අනුව තාක්ෂණික පිරිවිතර සැපයීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රාදේශීය ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- අංශවල ප්‍රාදේශීය ජාලය (local area network) උසස් කිරීම සහ උසස් කිරීමෙන් පසු පැන නගින ගැටලු නිරාකරණය කිරීම.

i. ඩිජිටල් දුරකථන පද්ධතිය (PABX) ප්‍රතිව්‍යුහගත කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීම සහ ඵලදායී රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා, ඔවුන්ගේ අභ්‍යන්තර දුරකථන මාර්ග සඳහා අභිරුචිකරණය කළ හැකි විශේෂාංග සහිත මිල අඩු විකල්ප ලබා දෙන PABX පද්ධතියක් සකස් කරන ලදී.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ පුංචි බොරැල්ල පරිශ්‍රයේ ෆයර්වෝල් (Firewalls) ක්‍රියාත්මක කිරීම

ෆයර්වෝල් පූර්ව නිශ්චිත ආරක්ෂක නීති මත පදනම්ව පැමිණෙන සහ පිටතට යන ජාල ගමනාගමනය නිරීක්ෂණය සහ පාලනය කරන ජාල ආරක්ෂාව සහතික කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පරිශ්‍රයේ සහ පුංචි බොරැල්ල පරිශ්‍රයේ ඇති ෆයර්වෝල් දෙක Site to Site VPN හරහා එකිනෙකට සම්බන්ධ වේ.

iii. "Eduroam" රැහැන් රහිත සේවා වැඩිදියුණු කිරීම

ලංකා අධ්‍යාපන සහ පර්යේෂණ ජාලය (LEARN) විසින් කළමනාකරණය කරනු ලබන Eduroam රැහැන් රහිත සේවාව 2021 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ක්‍රියාත්මක කර අවසන් කරන ලදී.

12. නීති කටයුතු

12.1. නව ව්‍යවස්ථා

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් නියෝග 09ක් සහ නියමාවලීන් 04 ක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදී.

- **2021 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද නියමයන්**

i. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2021 මාර්තු 01 දිනැති අංක 2217/02 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයෙන් ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය ඉවත් කර එම අධ්‍යයනාංශය නර්තන හා නාට්‍ය පීඨයේ නව අධ්‍යයන අංශයක් ලෙස පිහිටුවීමේ නියමය.

ii. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2021 පෙබරවාරි 23 දිනැති අංක 2216/11 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි, ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ "Faculty of Humanities and Social Sciences" යන නාමයේ සිංහල පරිවර්තනය ‘‘මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය’’ යන නාමය වෙනුවට ‘‘මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය’’ ලෙස නිවැරදි කිරීමේ නියමය.

iii. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2021 මාර්තු 03 දිනැති අංක 2217/25 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි, ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලයේ කලා හා සංස්කෘතික පීඨයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය නමින් නව අධ්‍යයන අංශයක් පිහිටුවීමේ නියමය.

iv. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2021 පෙබරවාරි 03 දිනැති අංක 2216/11 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පහත අධ්‍යයනාංශ දෙක නැවත නම් කිරීමේ නියමය.

- "කාය ව්‍යාවඡේද විද්‍යා අධ්‍යයනාංශය " "කාය ව්‍යාවඡේද විද්‍යා, ජාන විද්‍යාව සහ ජෛව වෛද්‍ය තොරතුරු අධ්‍යයනාංශය" ලෙස

- "ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය" "වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යා හා ප්‍රතිශක්ති විද්‍යා අධ්‍යයනාංශය" ලෙස

v. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2021 මාර්තු 03 දිනැති අංක 2217/24 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි, ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ, කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පැවති ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යයනාංශය, නව අධ්‍යයනාංශ දෙකක් එනම් ගිණුම්කරණ අධ්‍යයනාංශය සහ මූල්‍ය අධ්‍යයනාංශය ලෙස වෙන් කිරීමේ නියමය .

vi. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2021 මාර්තු 22 දිනැති අංක 2220/20 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ, වවිනියා මණ්ඩපයේ ව්‍යාපාර අධ්‍යයන පීඨයේ නව අධ්‍යයන අංශ පහක් පිහිටුවීමේ නියමය.

vii. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2021 මාර්තු 22 දිනැති අංක 2220/19 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි, ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ, කලා හා සංස්කෘතික පීඨයේ දෙමළ අධ්‍යයනාංශය නමින් නව අධ්‍යයනාංශයක් පිහිටුවීමේ නියමය.

viii. විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2021 ජුනි 08 දිනැති අංක 2231/05 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි, ශ්‍රී ලංකාවේ වවිනියා විශ්වවිද්‍යාලය පිහිටුවීමේ නියමය.

ix. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2021 දෙසැම්බර් 21 දිනැති අංක 2257/28 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නව අධ්‍යයන අංශ නවයක් සමඟින් නව දන්ත වෛද්‍ය විද්‍යා පීඨයක් පිහිටුවීමේ නියමය.

- **2021 දී ප්‍රකාශයට පත් කරන ලද නියමාවලීන්**

i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 18 වන වගන්ති යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලදුව 2021 පෙබරවාරි 02 දිනැති අංක 2213/9 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 2020 අංක 04 දරන විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල් නියමාවලිය.

ii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 140 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 18 වන වගන්ති යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලදුව 2021 පෙබරවාරි 02 දිනැති අංක 2213/10 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 2020 අංක 01 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය.

iii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 48 අ වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 18 වන වගන්ති යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලදුව 2021 පෙබරවාරි 02 දිනැති අංක 2113/11 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 2020 අංක 05 දරණ උපාධි අධ්‍යයන පීඨ නියමාවලිය.

iv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 140 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 18 වන වගන්ති යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලදුව 2021 මාර්තු 16 දිනැති අංක 2219/35 දරන රජයේ

අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 2020 අංක 01 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය.

12.2. අධිකරණ නඩු

2021 වර්ෂය තුළ විවිධ පාර්ශවයන් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව අධිකරණ හා විනිශ්චය සභාවල ගොනු කර තිබූ පහත සඳහන් නඩු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අංශය විසින් මෙහෙයවන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය	-	නඩු 54
අභියාචනාධිකරණය	-	නඩු 59
විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය	-	නඩු 30
දිස්ත්‍රික් අධිකරණය	-	නඩු 05
කම්කරු විනිශ්චය සභාව	-	නඩු 04

12.3. වෙනත් ක්‍රියාකාරකම් වලට ලබා දෙන ලද දායකත්වය

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සිදු කළ ක්‍රියාකාරකම්**

i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අදාළ සංශෝධන ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවට සහාය වීම.

ii. ආයතන සංග්‍රහය ප්‍රතිශෝධනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවට සහාය ලබා දීම.

iii. අධ්‍යයන නිවාඩු සඳහා යාමට පෙර විශ්වවිද්‍යාල පද්ධතියේ ගුරුවරුන්/ නිලධාරීන් / අනෙකුත් සේවකයන් විසින් අත්සන් කළ යුතු බැඳුම්කර සහ ගිවිසුම් සම්බන්ධයෙන් අංක 920 දරන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රතිශෝධනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ සභාපතිත්වය දැරීම.

iv. පවතින පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩල (BoM) සංයුතිය ප්‍රතිව්‍යුහගත කරමින් කෙටුම්පත් කරන ලද සංශෝධන.

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පිටත සිදු කළ ක්‍රියාකාරකම්**

i. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතීතන තත්ත්ව ආරක්ෂණ (SCAQA) පිළිබඳ ස්ථාවර කමිටුව.

ii. ජාතික අධ්‍යාපන ආයතන පනතට සංශෝධන යෝජනා කිරීමට පත් කළ කමිටුව.

iii. හෙද විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාළ නීති කෙටුම්පත් කිරීමට සහාය වීම.

iv. ගුරු විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාළ නීති කෙටුම්පත් කිරීමට සහාය වීම.

v. නගර විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාළ නීති කෙටුම්පත් කිරීමට සහාය ලබා දීම.

vi. 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන (SLIAT) පනත ප්‍රතිශෝධනය කිරීම සඳහා සහාය ලබා දීම.

13. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB)

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය 2021.01.01 සිට 2021.12.31 දක්වා කාලය තුළ වාර 20ක් රැස්වී ඇත. 2021 වර්ෂයේ දී අභියාචනා මණ්ඩලය තුළ අභියාචනා 16ක් ලියාපදිංචි කොට ඇත. අභියාචනා 2ක් සම්බන්ධයෙන් මූලික නියෝග ලබා දී ඇති අතර දෙකම නිෂ්ප්‍රභා කරන ලදි. අභියාචනා 14 ක් සම්බන්ධයෙන් නියෝග නිකුත් කරන ලද අතර ඉන් 06 ක් නිෂ්ප්‍රභා කර 05 ක් පිළිගෙන ඇති අතර ඉන් අභියාචනා 03 ක් නිෂ්ප්‍රභා කර හෝ පිළිගෙන නොමැත. බඹරුම් කිරීම් හේතුවෙන් අභියාචනා 09ක නඩු කටයුතු අවසන් විය. කිසිඳු අතුරු නියෝගයක් ද නිකුත් කර නොමැත. නියෝග 07 ක් 2021 වර්ෂය අවසාන වන විට ලේඛණ ගත කර ඇත. නියෝග ලබාදුන් අභියාචනා 03ක් තවමත් විභාගවෙමින් පවතී. 2021 අවසන් වන විට අභියාචනා 25ක් විභාග වෙමින් පැවතුණි.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් දෙන ලද නියෝගයන්ට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ අභියාචන 03ක් ඉදිරිපත් කර ඇති අතර එක් නඩුවකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනාවක් ඉදිරිපත් කරන ලදී.

14. මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු

මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ 3 වන ඡේදයේ, 1 වන පරිච්ඡේදය මගින් පවරා ඇති බලය යටතේ ස්ථාපිත කරන ලදී.

අභ්‍යන්තර විගණන අංශයේ මූලික පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙන්ම අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන පැවරුම් සහ පරීක්ෂණ පැවැත්වීමයි.

14.1 විගණන වැඩසටහන

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ, කළමනාකරණ සහ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද F.R.133 සහ විගණන සහ කළමනාකරණ චක්‍රලේඛ අංක DMA/2009(1) හි ඇමුණුම 2 ට අනුකූලව වසර සඳහා අදාළ වන විගණන වැඩසටහන සකස් කර ඇත.

14.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

කොමිෂන් සභාවේ භාණ්ඩාගාර නියෝජිතයින් විසින් විගණන කමිටුවේ සභාපතිත්වය දැරූ අතර එය කොමිෂන් සභාවේ අනුකමිටුව ලෙස විධිමත් ලෙස පිහිටුවන ලද තවත් කොමිෂන් සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය. ජාතික විගණන කොමිෂන් සභාවේ විගණන අධිකාරීවරයා නිරීක්ෂකයකු ලෙස රැස්වීමට සහභාගි වූ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් හා ගණකාධිකාරී සහ අනෙකුත් නිලධාරීන් ආරාධිතයන් ලෙස සහභාගී විය.

2021 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් සහ විශේෂ විගණන කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී.

වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සංසරණය විය යුතු ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් විගණන කමිටුව කළමනාකරණ කමිටුවට හෝ කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කරයි. විගණකාධිපති විසින් නිකුත් කරන ලද වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා ද සාකච්ඡාවට බඳුන් කෙරේ.

14.3 පවත්වන ලද පූර්ව විගණනයන්

සේවකයින්ට නිකුත් කරනු ලබන ගෙවීම්වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන් හි පූර්ව විගණනයක් සිදු කරන ලදී.

- අර්ථසාධක අරමුදල නිදහස් කිරීම
- පාරිතෝෂික ගෙවීම
- විශ්‍රාම වැටුප් නිදහස් කිරීම

14.4 ප්‍රගති වාර්තාව - අභ්‍යන්තර විගණන අංශය 2021

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශයේ හි කාර්ය මණ්ඩලය, 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ විගණන පරීක්ෂණ සඳහා උසස් අධ්‍යාපන ආයතන සහ ආයතන වෙත ගොස් ඇත. ඒවා ඔවුන්ගේ විගණන කමිටු වෙත ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති හරහා අදාළ උසස් අධ්‍යාපන ආයතන/ආයතනවල උපකුලපතිවරුන් / මණ්ඩපාධිපතිවරුන් / අධ්‍යක්ෂවරුන් වෙත එම වාර්තා යවන ලදී.

අභ්‍යන්තර විගණන වාර්තා වල සාරාංශය – 2021

	විෂය	විශ්වවිද්‍යාලය/ ආයතනය	යොමු අංකය	වාර්තාව ඉදිරිපත් කළ දිනය	ගත් ක්‍රියාමාර්ග
1	2020 වසරේදී සෞන්දර්ය කලා වි.වි. වෙත ලබා දී තිබූ ඩේවිඩ් පේන්ටර් මහතාගේ චිත්‍ර සම්බන්ධ විමර්ශනය	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	UGC/CIA/F/IAR/21-01	2021.02.01	2021.02.09 දින වාර්තාව සාකච්ඡා කරන ලදි
2	අභ්‍යන්තර විගණන වාර්තාව - අහඹු මුදල් සත්‍යාපනය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-02	2021.02.10	සාකච්ඡා කරන ලදි
3	වි.වි.ප්‍ර.කොා. සභාවේ 2020/2021 සඳහා පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් සිදු කල ප්‍රසම්පාදනය පිලිබඳ විගණන පරීක්ෂාව	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-03	2021.03.01	ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ.
4	අභ්‍යන්තර විගණන වාර්තාව - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	UGC/CIA/F/IAR/21-04	2021.02.12	වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විගණන කමිටුව සමඟ සාකච්ඡා කරන ලදී

5	අභ්‍යන්තර විගණන වාර්තාව - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගෙවීම් වවුචර	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-05	2021.03.09	2021.12.07 දින පිළිතුරු දෙන ලදී විශේෂ විගණන කමිටුව 2021.12.16
6	රුහුණ වි.වි. කෘෂිකර්ම පීඨයේ ගොවිපොළ සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂාව-2021	රුහුණ විශ්වවිද්‍යාලය	UGC/CIA/F/IAR/21-06	2021.03.15	ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ.
7	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ ආයෝජන පිළිබඳ විගණන පරීක්ෂණය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-07	2021.04.07	2021.12.03 දින පිළිතුරු දෙන ලදී විශේෂ විගණන කමිටුව 2021.12.16
8	කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ විගණන පරීක්ෂාව 2021	කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය	UGC/CIA/F/IAR/21-08	2021.04.19	කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ කමිටුව සමඟ සාකච්ඡා කරන ලදී
9	ප්‍රවේශ වීමට දුරකථන මාර්ග	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-09	2021.05.05	80 වැනි විගණන කමිටු රැස්වීම 2021.02.09 දින පැවැත්විණි
10	අභ්‍යන්තර විගණන වාර්තාව- දකුණු ආසියානු විශ්වවිද්‍යාලය (SAU) සඳහා ගෙවීම්	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-10	2021.10.06	2021.08.03 දින 82 වැනි විගණන කමිටු රැස්වීම
11	අභ්‍යන්තර විගණන වාර්තාව- මූල්‍ය බලතල පැවරීම 2021	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-11	2021.05.19	2021.12.07 දින 83 වැනි විගණන කමිටු රැස්වීම
12	අභ්‍යන්තර විගණන වාර්තාව- අහඹු මුදල් සත්‍යාපනය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-12	2021.11.08	අවසන් කර ඇත
13	අභ්‍යන්තර විගණන වාර්තාව- ගබඩා සහ ගබඩා ක්‍රියා පටිපාටිය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-13	2021.11.23	වැඩ අවසන් කර පිළිතුර බලාපොරොත්තුවෙන් සිටී
14	කොළඹ විශ්වවිද්‍යාලය පිළිබඳ විගණන වාර්තාව	කොළඹ විශ්වවිද්‍යාලය	UGC/CIA/F/IAR/21-14	2021.11.22	වැඩ අවසන් කර පිළිතුර බලාපොරොත්තුවෙන් සිටී
15	අභ්‍යන්තර විගණන වාර්තාව – ගෙවීම් වවුචර්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-15	2021.11.29	වැඩ අවසන් කර පිළිතුර බලාපොරොත්තුවෙන් සිටී
16	අභ්‍යන්තර විගණන වාර්තාව - අත්තිකාරම් සහ පියවීම්	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	UGC/CIA/F/IAR/21-16	2021.12.16	ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ.

වගුව : 14.4 ප්‍රගති වාර්තාව - අභ්‍යන්තර විගණන අංශය

15. ප්‍රකාශන සහ වාර්තා / සංවර්ධන ක්‍රියාකාරකම් / විශේෂ පැවරුම්

15.1 ප්‍රකාශන සහ වාර්තා

2021 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ පහත සඳහන් වැදගත් ප්‍රකාශන සහ වාර්තා මඟින් විශ්වවිද්‍යාල පද්ධතියට අවශ්‍ය පරිපාලනමය සහාය ලබා දෙන ලදී;

1. 'ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන 2020' ප්‍රකාශන මාලාවේ 19 වන වෙළුම 2020 ජූලි මාසයේ දී ප්‍රකාශයට පත් කිරීම.

2. විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ වෙබ් අඩවියේ (webometrics) හා QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යාවත්කාලීන කරන ලද ශ්‍රේණිගත කිරීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම.

15.2 සංවර්ධන කටයුතු

1. 2021 මැයි මස අවසානයේ දී කොවිඩ් -19 තුන් වන රැල්ල ශ්‍රී ලංකාවට බලපෑවේය. එබැවින්, 2021 ජුනි 21 වන දින සිට, වසංගතය හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වසා තැබීමට සිදු විය.

   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වසා දැමූ කාලය තුළ, කළමනාකරණ තොරතුරු පද්ධති අංශය 2021 අගෝස්තු 02 දක්වා නිවසේ සිට රාජකාරිවලට සහභාගී විය.

   නැවතත්, කොවිඩ් -19 වසංගතය හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2021 අගෝස්තු 20 සිට 2021 ඔක්තෝබර් 01 දක්වා වසා දමන ලදී. මුළු රටටම ඇඳිරි නීතිය පනවා තිබූ බැවින් කළමනාකරණ තොරතුරු පද්ධති අංශයට නිවසේ සිට රාජකාරි කිරීමට සිදු විය. ඔක්තොම්බර් 04 වන දින සිට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සියලුම සේවකයින් වැඩ මුර පදනම මත සේවයට වාර්තා කළ අතර 2021 දෙසැම්බර් 01 වන දින සිට සියලුම කාර්ය මණ්ඩලය සාමාන්‍ය පරිදි රාජකාරි ආරම්භ කරන ලදී.

2. සයන්ස් ලැන්ඩ් IT (PVT) Ltd විසින් සංවර්ධනය කරන ලද වෙබ් පාදක කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා උත්පාදනය පරීක්ෂා කිරීමේ අදියරේ පවතී. ඒ අනුව, ශ්‍රී ජයවර්ධනපුර සහ කොළඹ විශ්වවිද්‍යාලවල දත්ත ඇතුළත් කර වාර්තා පරීක්ෂා කරමින් පවතී.

15.3 විශේෂ පැවරුම්

2021 වර්ෂය තුළ පහත සඳහන් විශේෂ පැවරුම් සිදු කරන ලදී.

1. ජාතික පර්යේෂණ සහ සංවර්ධන (R&D) සමීක්ෂණය 2020 සඳහා විශ්වවිද්‍යාල වලින් එකතු කරන ලද දත්ත පරීක්ෂා කර අවසන් කරන ලදී.

2. උසස් අධ්‍යාපන ආයතනයන් හි බැඳුම්කර ගිවිසුම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් (2020 දෙසැම්බර් 31 දින වන විට) කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පිළිබඳව තොරතුරු රැස් කොට, අභ්‍යන්තර විගණන අංශය වෙත ලේඛනය ඉදිරිපත් කරන ලදී.

3. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉල්ලා සිටි පරිදි 2021 ජුනි මාසය වන විට බැඳුම්කර ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු එක්රැස් කර ඒවා පරීක්ෂා කරමින් පවතී.

4. කොවිඩ් -19 වසංගතය අතරතුරදී සිදුකළ මාර්ගගත ඉගැන්වීම් සහ ඉගෙනීම් පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන විසින් කරන ලද සමීක්ෂණවල ප්‍රතිඵල වාර්තාවක් ලෙස සාරාංශ ගත කිරීම.

5. අවසාන එම්.බී.බී.එස් (ප්‍රධාන) විභාගය මත පදනම්ව එම්.බී.බී.එස් උපාධිධාරීන්ගේ පොදු කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව සම්පාදනය කිරීම සහ සීමාවාසික පුහුණු ස්ථානගත කිරීම් සඳහා එය සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම;

    i. 2012/13 පුනර් පරීක්ෂණ විභාගය සඳහා කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව

    ii. 2013/14 ප්‍රධාන විභාගය සඳහා කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව

6. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉල්ලා සිටි පරිදි දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල සියලුම ඉඩම්/ඉඩම් අත් කර ගැනීම් සහ හිමිකම් ඔප්පු පිළිබඳ දත්ත රැස් කිරීම ආරම්භ කර ඇත.

7. මහ බැංකුවේ වාර්ෂික වාර්තාව සහ 2021 මෑතකාලීන ආර්ථික සංවර්ධන විශේෂ අවස්ථා සහ 2022 සඳහා සපුරා ගැනීමට නියමිත අපේක්ෂාවන්, සම්පූර්ණ කර මහ බැංකුව වෙත ඉදිරිපත් කර ඇත.

8. 2020 වසර සඳහා පීඨය විසින් උපාධි අපේක්ෂකයින්ගේ ඒකක පුනරාවර්තන පිරිවැය පිළිබඳ වාර්තාව විශ්ලේෂණය කර සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

9. පහත පාර්ශ්වකරුවන්ගේ දත්ත ඉල්ලීම් සපුරාලමින් සම්පූර්ණ දත්ත ලබා දෙන ලදී;
    - යුනෙස්කෝ
    - මහ බැංකුව
    - ජනලේඛන දෙපාර්තමේන්තුව
    - AHEAD ව්‍යාපෘතිය
    - වෙනත් රජයේ ආයතන

16. ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය

විවිධත්වයට සහ සමානාත්මතාවයට සංවේදී වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල හිතකර ඉගෙනුම්/සේවා පරිසරයක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. ඒ අනුව, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ප්‍රජාවන්හි අසමානතා අවම කිරීම

කෙරෙහි අවධානය යොමු කරන විවිධ ක්‍රියාකාරකම් සමූහයක නිරත වෙමින් සිටී. 2021 ජූනි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මහාචාර්ය හේමමාලි ගුණතිලක (කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආචාර්ය උපාධිය, වෝර්වික් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරිය ලෙස පත් කරන ලද අතර 2021 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

16.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙ හි මධ්‍යගත දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය

- 2021 වර්ෂයේ දී නවක සිසුන්ගෙන් හෝ ඔවුන්ගේ දෙමව්පියන්ගෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයන්ගෙන් නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ පැමිණිලි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් යටතේ ස්ථාපිත කර ඇති පහත මාර්ග ඔස්සේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී ඇත.

- නවක වදය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත ද්වාරය www.ugc.ac.lk/rag/හෝ https://www.eugc.ac.lk/rag/

- ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත ද්වාරයwww.ugc.ac.lk/sgbv/

- 0112123700 දුරකථන අංකය

- විද්‍යුත් ලිපිනය ragginghelp@ugc.ac.lk සහ helpme@ugc.ac.lk

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත ඇමතුම් ලබා දීම, පෞද්ගලිකව හෝ ලිඛිතව පැමිණිලි ඉදිරිපත් කිරීම, විද්‍යුත් ලිපිනය ඔස්සේ දැනුම් දීම.

16.2 පැමිණිලි ද්වාරය

රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රජාවේ සියලුම සාමාජිකයින්ට මාර්ගගත පැමිණිලි ද්වාරයට ප්‍රවේශ විය හැකි අතර නවක වදයට සම්බන්ධ නමුත් ප්‍රධාන වශයෙන් ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ලෙස වර්ගීකරණය කළ හැකි සිදුවීම් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. 2021 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව සාමාන්‍ය ප්‍රමාණයට වඩා අඩු අගයක් ගන්නා ලදී. එයට හේතුව වුයේ විශ්වවිද්‍යාල මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක වීමත් සිසුන් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ භෞතිකව නොසිටීමත්ය. කෙසේ වෙතත්, ලැබුණු පැමිණිලි කිහිපයක් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ විශ්වවිද්‍යාල වෙත යොමු කරන ලද අතර පවතින සමහර පැමිණිලි පිළිබඳව ක්‍රියාකර විසඳා ඇත. (පැමිණිලි 17 ක් ලැබී ඒවා පිළිබඳව අදාළ කටයුතු සිදු කර ඇත.)

16.3 පර්යේෂණ මුල පිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාලවල නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ සහ නවක වදයට එරෙහිව සටන් කිරීමට උපාය මාර්ග යෝජනා කිරීම සහ පැනිරීම අවම කිරීම පිළිබඳව වන UNICEF

විසින් අරමුදල් සපයන ලද ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාව 2021 ඔක්තෝම්බර් මාසයේදී මුද්‍රණය කරන ලදී.

16.4 2021 දී ගන්නා ලද මූලපිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ ප්‍රධාන වශයෙන් සිදු කරනු ලැබුවේ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය බහුලවීමට හේතු හඳුනා ගැනීම සහ එවැනි සිදුවීම් අවම කිරීම සඳහා උපාය මාර්ග යෝජනා කිරීම සඳහා ය. විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ව්‍යාප්ත වීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ විවිධත්වය සහ සමාන ප්‍රවේශය සම්බන්ධ ගැටළු විසඳීමට ඇති නොහැකියාව බව අධ්‍යයන සොයාගැනීම්වලින් අනාවරණය විය. එවැනි සොයාගැනීම් මත පදනම්ව, මේ වන විට ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ සම්පත් දායකයින්ගේ සහාය ඇතිව 'විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම' නමින් පාඨමාලාවක් සකස් කර ඇත. මෙම පාඨමාලාව පහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සම්පාත වේ:

ඉලක්කය 4 : ගුණාත්මක අධ්‍යාපනය
ඉලක්කය 5 : ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය
ඉලක්කය 10: අඩු කරන ලද අසමානතා
ඉලක්කය 11: තිරසාර නගර සහ ප්‍රජාවන්
ඉලක්කය 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

16.5 ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගෝලීය සමුළුව

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගෝලීය සමුළුවක් සංවිධානය කිරීමටත් 2023 මාර්තු මාසයේදී එය පැවැත්වීමටත් ස්ථාවර කමිටුව යෝජනා කළේය. සමුළුව සංවිධානය කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලද අතර එය ස්ථාවර කමිටුවේ ස්වේච්ඡා සාමාජිකයින්ගෙන් සහ සියලුම විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රස්ථානවල අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය. මේ වන විට අනු කමිටුව රැස්වීම් වට දෙකක් පවත්වා ඇත.

16.6 ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල රැස්වීම සහ පුහුණුව

ප්‍රගතිය, ගැටලු සහ ඉදිරි ගමන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සෑම මසකම තුන්වන බදාදා දින කාර්ය මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට නියමිතය. එදිනම කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යක්ෂවරයා විසින් ලබා දෙන පුහුණුව පවත්වනු ලැබේ. මෙම පුහුණුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අසමානතාවයේ වෙනත් ආකාර, පුද්ගලික සංවර්ධනය, වෘත්තීය ප්‍රගතිය සහ අන්තර් පුද්ගල සහ සමාජ කුසලතා වැනි ක්ෂේත්‍ර ආවරණය කරයි.

17. විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍යාධාර ලබා දීම

ශිෂ්‍යත්ව යනු පරිත්‍යාගශීලීන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් එකඟ වන නියමයන් සහ කොන්දේසි මත පුද්ගලයන් හෝ සංවිධාන විසින් ස්ථාපිත කර ඇති සහ අනාගතයේදී ස්ථාපිත කළ හැකි ඒවා වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය, දැනට මුදල් අංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශයේ සහාය ඇතිව පහත සඳහන් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කරනු ලබයි;

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේ දී කළමනාකරණය සහ පහසුකම් සපයන ශිෂ්‍යත්ව වැඩසටහන්වල වර්තමාන තත්ත්වය

ශිෂ්‍යත්වයේ නම	මිට්සුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව
ශිෂ්‍යත්ව කාලය	2019 අගෝස්තු 1 සිට 2020 ජූලි 31 දක්වා
ශිෂ්‍යත්වයෙන් පිරිනමන මුදල් ප්‍රමාණය	එක් ශිෂ්‍යත්වලාභියෙක්ට රු.55,000/- බැගින්
සුදුසුකම් නිර්ණායක	කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණ පීඨයේ හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ වාණිජ්‍යය පීඨයේ අධ්‍යයන පාඨමාලා හැදෑරීමට තෝරාගෙන ඇති සිසුන්
ශිෂ්‍යත්ව ප්‍රදානය කළ සිසුන් සංඛ්‍යාව	කොළඹ විශ්වවිද්‍යාලය - 15 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 15

වගුව 17.1. මිට්සුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව

ශිෂ්‍යත්වයේ නම	මහරාජා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය
ශිෂ්‍යත්ව කාලය	2018/2019 අධ්‍යයන වර්ෂය
ශිෂ්‍යත්වයෙන් පිරිනමන මුදල් ප්‍රමාණය	ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 25,000/-
සුදුසුකම් නිර්ණායක	i. 2018 අ.පො.ස උසස් පෙළ විභාග ප්‍රතිඵල මත පදනම්ව 2018/2019 අධ්‍යයන වර්ෂයේ සිටින සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථය යටතේ පවතින විශ්වවිද්‍යාලයක ලියාපදිංචි වී උපාධි පාඨමාලාවක් හදාරන සිසුන් ii. දෙමව්පියන්ගේ වාර්ෂික ආදායම (අයදුම්කරුගේ දෙමාපියන්ගේ වැටුප් තොරතුරු සහතික කරමින් සේවායෝජකයාගෙන් ලබා ගත් ලිපියක් හෝ රැකියා විරහිත මාපියන් සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ ස්ථිර පදිංචිය සහ ආදායම ඇති ප්‍රදේශයේ ග්‍රාමසේවා නිලධාරියාගේ නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ලබාගත් ලිපියක් හෝ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.) iii. අ.පො.ස උසස් පෙළ විභාගයේ දී දක්වා ඇති දක්ෂතා. (අයදුම්කරුට අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී ඔහුගේ / ඇයගේ ප්‍රථම උත්සාහයේදී 'ඒ' සාමාර්ථ තුනක් තිබිය යුතුය.) iv. අයදුම්කරු, තේරීම් කමිටුව තෘප්තිමත් වන ආකාරයේ ජාතික / ජාත්‍යන්තර මට්ටමේ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ඔහුගේ / ඇයගේ දායකත්වය ලබා දී තිබිය යුතුය. v. මහපොළ, ශිෂ්‍යාධාර හෝ වෙනත් ශිෂ්‍යත්වයක් මගින් විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් ආයතනයකින් මූල්‍ය ආධාර නොලබන සිසුන්.
ශිෂ්‍යත්ව ප්‍රදානය කළ සිසුන් සංඛ්‍යාව	කොළඹ විශ්වවිද්‍යාලය - 01 යාපනය විශ්වවිද්‍යාලය - 01

වගුව 17.2. මහරාජා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය

ශිෂ්‍යත්වයේ නම	ශ්‍රී ලංකා පොලිස් මධ්‍යම සුභසාධන මණ්ඩලයේ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
ශිෂ්‍යත්ව කාලය	2016/2017 අධ්‍යයන වර්ෂය
ශිෂ්‍යත්වයෙන් පිරිනමන මුදල් ප්‍රමාණය	ශිෂ්‍යත්වයේ වටිනාකම වසරකට රු .20,000/- කි
සුදුසුකම් නිර්ණායක	i. එක් විෂයයකට එක් ශිෂ්‍යත්වයක් පමණක් පිරිනමනු ලබන අතර අධ්‍යයන විෂයයන් සඳහා පහත පරිදි ප්‍රමුඛතාවය ලබා දේ; • ඉංජිනේරු • වෛද්‍ය විද්‍යාව • කෘෂිකර්මය • දන්ත වෛද්‍ය විද්‍යාව • පශු වෛද්‍ය විද්‍යාව • භෞතික විද්‍යාව • ජීව විද්‍යාව • වාණිජ්‍යය • කලා ii. සිසුන් තෝරා ගන්නා විට ඔහුගේ/ඇයගේ දෙමාපියන්ගේ මුළු ආදායම සලකා බලන බව අංක 94 දරන ශ්‍රී ලංකා පොලිස් ගැසට් පත්‍රයේ II කොටසෙහි අංක 7 සඳහන් වේ.
ශිෂ්‍යත්ව ප්‍රදානය කළ සිසුන් සංඛ්‍යාව	මොරටුව විශ්වවිද්‍යාලය - 01 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 01 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 01

වගුව 17.3. ශ්‍රී ලංකා පොලිස් මධ්‍යම සුභසාධන මණ්ඩලයේ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

ඉහත ශිෂ්‍යත්ව හැරුණු විට, අදාළ ආයතන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සහාය ඉල්ලා සිටින විට පහත ශිෂ්‍යත්ව සඳහා පහසුකම් සැලසේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අරමුදල් ගිණුම් පවත්වාගෙන නොයයි;

- සුජාතා ගුරුගේ ශිෂ්‍යත්ව වැඩසටහන
- පල්ස්ගාඩ් උපාධි අපේක්ෂක අධ්‍යයන ශිෂ්‍යත්ව වැඩසටහන
- ඩයලොග් තාක්ෂණ කුසලතා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය
- මිට්සුබිෂි ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය

ඊට අමතරව, 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා හොඳම විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යත්වය සඳහා අයදුම්පත් කැඳවීමට සහ ශිෂ්‍යත්ව හයක් (6) ප්‍රදානය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එහි 1037 වන සභා වාරයේදී තීරණය කරන ලදී.

18. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම

අධ්‍යයන කාර්ය මණ්ඩලයට විශේෂයෙන්ම තරුණ විද්‍යාර්ථීන්ට මෙරට මෙන් ම පිටරට උසස් අධ්‍යාපන අවස්ථා හිමිකර ගැනීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ පද්ධතිය තවදුරටත් පෝෂණය කිරීම සහ ශක්තිමත් කිරීම යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපත්තියට අනුකූලව යමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පර්යේෂණ හා අන්තර්ජාතික සහයෝගිතා අංශය මඟින් ඒ වෙනුවෙන් 2021 වසර තුළ දැඩි උත්සාහයක් දැරුවේය. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සිදුකළ කාර්යයන් පහත පරිදි වේ;

18.1 උසස් අධ්‍යාපනය සඳහා ප්‍රදාන ලබා දීම

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය - 2021**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ ආචාර්ය මණ්ඩලයේ ස්ථීර සාමාජිකයින්ට සිය වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා මූල්‍යමය වශයෙන් සහයෝගය දැක්වීම මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ හැකියාව ශක්තිමත් කිරීමයි.

ප්‍රදාන ලබා දෙනු ලබන්නේ දේශීය/විදේශීය ආචාර්ය උපාධි සහ ආචාර්ය උපාධිය දක්වා වන දර්ශනපති උපාධි හා ඊට සමාන අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ ආචාර්ය උපාධි අධ්‍යයනය වෙනුවෙන් උපරිම වශයෙන් වසර 03ක් සඳහා සහ දර්ශනපති/ ශාස්ත්‍රපති උපාධි සඳහා උපරිම වශයෙන් වසර 02ක් සඳහා පමණක් මූල්‍ය ආධාර සපයයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමයේ සමස්ත ප්‍රදාන සීමාව, ආයතනික සහ ජීවන වියදම් යන දෙකම ඇතුළුව එක් අපේක්ෂකයෙකුට වසරකට රුපියල් මිලියන 2 කි. විදේශයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන සිදු කරන අපේක්ෂකයෙකුට ජීවන වියදම් සඳහා ලැබෙන ප්‍රදානයේ උපරිම සීමාව වසරකට රුපියල් මිලියන 1.5 ක් වේ. තනි අපේක්ෂකයෙකුට ජීවන වියදම් යටතේ අදාළ වන සීමාව රට අනුව වෙනස් වන අතර එය ඉහත දක්වා ඇති උපරිම සීමාවට යටත්ව වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා මූල්‍ය ආධාර උපරිම වසර 3 ක කාලයක් සඳහා සපයනු ලබන අතර එහි උපරිම සීමාව වසරකට රු. මිලියන 2 කි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ 2021 වසර සඳහා ශිෂ්‍යත්ව 16ක් ප්‍රදානය කරන ලදී.

- **විදේශීය විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් සිදු කරන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම - 2021**

  i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව (GU) පූර්ණ / ඒකාබද්ධ ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන

  ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය (GU) සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) අධ්‍යයන අන්තර් ක්‍රියා, සංස්කෘතික හුවමාරුව, සාමූහික පර්යේෂණ සහ වෙනත් ආකාරයේ ශාස්ත්‍රීය සහයෝගීතාවයන්ගෙන් අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමකට එළැඹෙන ලදී.

  ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම යටතේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් වසර 03ක් දක්වා වූ කාලසීමාවක් සඳහා සම්පූර්ණ පන්ති ගාස්තුව ආවරණය කරනු ලබන අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඕස්ට්‍රේලියාව සඳහා අනුමත කරන ලද සීමාවන්ට යටත්ව අපේක්ෂකයින්ට වසර 3 ක කාලයක් සඳහා ජීවන වියදම් දීමනාවක් සහ විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණය (OSHC) ලබා දෙනු ඇත. ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් වසරකට ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව 12 ක් දක්වා ලබා දෙනු ඇත.

  ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය

  සියලුම පාර්ශ්වයන්ගේ අවසාන අනුමැතියට යටත්ව පහත සඳහන් විශ්වවිද්‍යාල හතරින් සහ අනෙකුත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලින් ඕනෑම එකකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහාය දක්වන අපේක්ෂකයින් සඳහා ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් අධීක්ෂණ විධිවිධාන ද දිරිමත් කරනු ලැබේ:

  - කොළඹ විශ්වවිද්‍යාලය
  - කැලණිය විශ්වවිද්‍යාලය
  - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
  - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

  මෙම යෝජනා ක්‍රමය යටතේ **2021** වර්ෂය තුළ ශිෂ්‍යත්ව තුනක් **(03)** ප්‍රදානය කරන ලදී.

  ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ (QUT) ඒකාබද්ධ / භින්න ආචාර්ය උපාධි වැඩසටහන

  ඕස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයක් වන ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT), ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සමඟ සම්බන්ධ වෙමින් ප්‍රාථමික සහ මධ්‍ය මට්ටමේ සිටින ශ්‍රී ලාංකීය වෘත්තීය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ උසස් උපාධි පර්යේෂණ (HDR) වැඩසටහන් සහ පර්යේෂණ පුහුණුව සඳහා සහාය වීම සිදු කරයි. මෙම

ක්‍රියාවලිය තුළ, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල දේශීය අධ්‍යයන අධීක්ෂකවරුන් සමඟ ආචාර්ය උපාධි අධීක්ෂණය, පර්යේෂණ පුහුණුව සහ හවුල් අධීක්ෂණය ඇතුළු ඒකාබද්ධ පර්යේෂණ ප්‍රයත්නයන් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල විවිධ විෂයයන් සඳහා අපේක්ෂකයින් 10 - 12 ක් ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මණ්ඩපයන් හි අවම වශයෙන් මාස 12 ක ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සිදු කරන අතර ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය මඟින් ආචාර්ය උපාධි අධීක්ෂණ සමූහ ආකෘතියකට (cohort model) සහාය දක්වනු ලබයි.

පහත දැක්වෙන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමවල ආකෘති දෙකකි;

i. ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය

- ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගිතා ආචාර්ය උපාධි වැඩසටහන්වලට කොළඹ විශ්වවිද්‍යාලය (CMB), පේරාදෙණිය විශ්වවිද්‍යාලය (PDN) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (SJP) සමඟ එක්ව ආරම්භ කරන ලද ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය ඇතුළත් වේ.

- ඒකාබද්ධ ආචාර්ය උපාධි සිසුන්, ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු, කොළඹ, පේරාදෙණිය හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවල එක් ආචාර්ය මණ්ඩල සාමාජිකයෙක් සහ අදාළ අපේක්ෂකයාගේ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයෙක් විසින් (අදාළ නම්) සම-අධීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ.

ii. භින්න/ බාහිර ආචාර්ය උපාධි ආකෘතිය

භින්න ආචාර්ය උපාධි සිසුන්ට, ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධීක්ෂකවරුන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් ඕනෑම විශ්වවිද්‍යාලයක දේශීය අධීක්ෂකවරයෙකු සිටී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සුදුසුකම් අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලාංකික අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට වසරක කාලයක් සඳහා කුවීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලට ගොස් පර්යේෂණ සිදු කරන අතරතුර වියදම් පියවා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මූල්‍ය සහාය ලබා දෙනු ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව අවශ්‍ය පරිදි ජීවන වියදම් දීමනාවක්, විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණය (OSHC) සහ ඒ ආශ්‍රිත අනෙකුත් වියදම් මෙම

ආධාරයට ඇතුළත් වේ. උපරිම ප්‍රදාන සීමාව වසර 03ක් සඳහා එක් අපේක්ෂකයෙකුට රුපියල් මිලියන 3.5 කි.

ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් ආචාර්ය උපාධි අපේක්ෂකත්ව කාල සීමාව සඳහා (වසර තුනක් දක්වා) සම්පූර්ණ පන්ති ගාස්තු සඳහා ශිෂ්‍යත්වයක් (ආසන්න වශයෙන් AUD 100,000 අගයක්) ලබා දෙනු ඇත.

මෙම යෝජනා ක්‍රමය යටතේ 2021 වර්ෂය තුළ ශිෂ්‍යත්ව තුනක් (03) ප්‍රදානය කරන ලදී.

iii. ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය (IUJ) සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයට ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීමට සම අනුග්‍රහය සහිත ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් එකඟතා ලිපියට අනුව, ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය පන්ති ගාස්තුවෙන් 50% අරමුදල් සපයනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පන්ති ගාස්තුවෙන් ඉතිරි 50% (ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙන පරිදි) සහ ජපාන යෙන් 90,000ක මාසික ජීවන වියදම් දීමනාවක් සඳහා අරමුදල් සපයනු ඇත. අධ්‍යයන නිවාඩු මත විදේශගත වන අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගුවන් ගමන් සඳහා ගෙවනු ලබන ප්‍රදාන ද හිමිවනු ඇත.

මෙම යෝජනා ක්‍රමය යටතේ එක් (01) ශිෂ්‍යත්වයක් 2021 වර්ෂය තුළ ප්‍රදානය කරන ලදී.

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රම විධිමත් කිරීම සහ ශක්තිමත් කිරීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන යෝජනා ක්‍රම සඳහා වන මාර්ගෝපදේශ සංශෝධනය කිරීමට සහ ප්‍රදානලාභීන්ගේ ප්‍රගතිය ඵලදායී ලෙස නිරීක්ෂණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.

18.2 විදේශ හවුල්කරුවන් සමඟ රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් (MoU) /ගිවිසුම්

i. විදේශීය හවුල්කරුවන් සමඟ රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් (MoU)/ ගිවිසුම් අත්සන් කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම

මෙය 2018.06.05 දිනැති ලිපි අංක UGC/CH/7/1, 2018.08.03 දිනැති ලිපි අංක UGC/S/PA/111, 2019.01.22 දිනැති UGC/S/PA/111 හා ඉහත විෂය

සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2019.12.19 දිනැති අංක PS/SP/SB/Circular/06/2019 චක්‍රලේඛය හා බැඳේ.

ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සියලුම උපකුලපතිවරුන්ට දැනුම් දුන්නේ විදේශීය ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් (MoU) / ගිවිසුම්වලට එළඹීමට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සමඟ රේඛීය අමාත්‍යාංශයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතු බවයි. තවද, විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත සියලුම අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අමාත්‍ය මණ්ඩලය හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට 2018.07.03 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි.

ඒ අනුව, 2021 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සහ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ඇතුළු රාජ්‍ය විශ්වවිද්‍යාල සහ විදේශීය විශ්වවිද්‍යාල අතර අත්සන් කිරීමට නියමිත අවබෝධතා ගිවිසුම් 64ක් පමණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්බන්ධීකරණය කර ඇත.

ii. විදේශ පාර්ශව සහ රාජ්‍ය විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අත්සන් කිරීමේදී දැනට පවතින අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම

රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් / ගිවිසුම් බොහොමයක් අප රටට බෙහෙවින් ප්‍රයෝජනවත් වන අතර ශිෂ්‍යත්ව / පර්යේෂණ ප්‍රදාන මගින් හෝ අපගේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ක්ෂේත්‍ර / උසස් අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම සඳහා හෝ විදේශ රටවල පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා ඉගැන්වීම් අවස්ථා ලබා දීම මගින් විදේශ අරමුදල් හා අවස්ථා විශාල ප්‍රමාණයක් විශ්වවිද්‍යාල පද්ධතියට ලබාදේ. බොහෝ රාජ්‍ය විශ්ව විද්‍යාල ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් විදේශීය ආයතන සමඟ ගැඹුරු සහයෝගීතාවයකට අවතීර්ණ වී ඇති අතර එමඟින් දැනුමේ ප්‍රගමනයට සහ ධාරිතා වර්ධනයට මග පාදයි. අවාසනාවකට මෙන්, අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අත්සන් කිරීමේදී අනුමැතිය ලබා ගැනීමේ දීර්ඝ ක්‍රියා පටිපාටිය හේතුවෙන් බොහෝ විශ්වවිද්‍යාල එවැනි දිගුකාලීන පර්යේෂණ සහයෝගීතාවයන් දිගටම කරගෙන යාමට අපොහොසත් වී ඇත. දැනට පවතින ක්‍රියා පටිපාටියට අනුමැතිය ලබා ගැනීමට සහ අත්සන් කිරීමට අවම වශයෙන් මාස 5 - 6ක් ගත වන බව නිරීක්ෂණය වී ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විදේශීය පාර්ශවයන් සහ රාජ්‍ය විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් අත්සන් කිරීමේදී අනෙකුත් අදාළ පාර්ශ්ව / පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීමට සහ අනුමැතිය ලබා ගැනීමේ පවතින ක්‍රියාදාමයන් සරල කිරීමට මූලික පියවර ගෙන ඇත.

19. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 1999 ජුනි 10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 ප්‍රකාරව විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවන ලද අතර එය1999 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක විය.

19.1 ප්‍රධාන මූල්‍ය තොරතුරු

- **සාමාජිකයින්ගේ දායකත්වය**

ප්‍රධාන මූල්‍ය තොරතුරු							
විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල							
			2017	2018	2019	2020	2021
1	සාමාජිකයන්						
		ක්‍රියාකාරී සාමාජිකයන්	12,586	13,945	14,922	15,211	16,062
		අක්‍රිය සාමාජිකයන්	1,856	1,928	2,025	2,023	2,139
	මුළු සාමාජිකයන් ගණන		14,442	15,873	16,947	17,234	18,201
2	මුළු සාමාජිකත්වය		17,779	19,733	21,275	21,951	23,449
3	විශ්‍රාම වැටුප් ලබන සාමාජිකයන් ගණන		252	279	314	351	402
4	එකවර මුදල් ආපසු ගෙවන සාමාජිකයන් ගණන		886	965	1,082	1,186	1,287
5	අරමුදලේ ශේෂය (රු.මි)						
		දායකයින්ගේ අරමුදල	7043	8,722	10906	13473	16,238
		විශ්‍රාමිකයන්ගේ අරමුදල සහ සංචිත	708	744	815	855	914
		මුළු අරමුදල (රු. මිලියන)	7751	9,466	11721	14328	17,152
		අරමුදලේ වර්ධනය %	21%	22%	24%	22%	19.71%
6	මුළු ආයෝජනය (රු.මි)		6969	9078	11,060	13,347	15,967
7	මුළු ආයෝජන ආදායම (රු.මි)		733	924	1,168	1,333	1,444
8	ආදායම් බදු (රු.මි)		22	138	166	189	206
9	ආයෝජන මත ප්‍රතිලාභ (%)		10.50%	10.18%	10.56%	9.98%	9.04%
10	සාමාජිකයන්ට ප්‍රකාශිත පොලිය		10%	10%	10%	9.60%	8.4%
11	විශ්‍රාම වැටුප් ගෙවීම් (රු.මි)		51	58	75	93	107
12	විශ්‍රාම වැටුප් ගෙවීමේ වර්ධනය (%)		31%	14%	29%	24%	15%

වගුව 19.1 විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය





- **ආයෝජන සහ ආයෝජන ආදායම**

රාජ්‍ය බැංකු සහ රජයේ භාණ්ඩාගාර බැඳුම්කර සහ ණයකරවල ස්ථාවර තැන්පතු සඳහා ආයෝජන සිදු කර ඇත.





20. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයින් සඳහා විශ්‍රාම වැටුපක් සහතික කිරීමේ සැලැස්මක් ලෙස 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 89 - 96 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල පිහිටුවා ඇත. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ පරමාර්ථය වන්නේ සාමාජිකයින්ට විශ්‍රාම යාමේදී හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමේදී වඩා හොඳ ප්‍රතිලාභයක් සහතික කිරීම සඳහා අරමුදල දූරදර්ශීව කළමනාකරණය කිරීමයි.

මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය

ප්‍රධාන මූල්‍ය තොරතුරු								
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල								
			දිනය වන විට	**2017**	**2018**	**2019**	**2020**	**2021**
1.	සාමාජිකත්වය							
		සක්‍රිය සාමාජිකයන්ගේ ගිණුම්	දෙසැ.31	**34,614**	**36,851**	**38,842**	**40,105**	**42,353**
		අක්‍රිය සාමාජිකයන්ගේ ගිණුම්	දෙසැ.31	**5,208**	**5,202**	**5,196**	**5,193**	**5,191**
2.	මුදල් ආපසු ගෙවීම්							
		ආපසු ගෙවීම් කළ ගණන	දෙසැ.31	**2,881**	**2,798**	**3,143**	**2,717**	**2,872**
		සිදුකළ ආපසු ගෙවීම්වල වටිනාකම (රු.මි)	දෙසැ.31	**2,259**	**2,141**	**2,456**	**2,712**	**3,293**
3.	අරමුදල් ශේෂය (රු.මි)		දෙසැ.31	**37,027**	**42,254**	**48,729**	**56,059**	**63,026**
4.	ණය ශේෂය (රු.මි)		දෙසැ.31	**5,274**	**6,304**	**7,047**	**7,432**	**7,715**
5.	සාමාන්‍ය සංචිතය (රු.මි)		දෙසැ.31	**279**	**6**	**121**	**65**	**145**
7.	වර්ෂය තුළ දී ලබා දුන් ණය (රු.මි)		දෙසැ.31	**1,414**	**1,963**	**1,897**	**1,471**	**1,678**
8.	මුළු ආයෝජනය (රු.මි)		දෙසැ.31	**27,028**	**34,651**	**38,275**	**45,585**	**51,991**
9.	ආයෝජන ආදායම (රු.මි)		දෙසැ.31	**3,157**	**3,653**	**4,393**	**4,741**	**4,932**
10.	ආදායම් බදු (රු.මි)		දෙසැ.31	**113**	**690**	**622**	**674**	**703**
11.	ආයෝජන මත ප්‍රතිලාභ (බදුවලට පෙර)		දෙසැ.31	**11.68%**	**10.54%**	**11.48%**	**10.40%**	**9.49%**
12.	ප්‍රකාශිත පොළිය - ආරම්භක ශේෂය සඳහා		ජන. 01	**10.50%**	**10.00%**	**10.00%**	**9.60%**	**8.40%**

වගුව 20.1 අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය


විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වර්ධනය
රු.මිලියන
80.0
60.0
40.0
20.0
0.0
2017
2018
2019
2020
2021
අරමුදල් වටිනාකම


මුදල් ආපසු ගෙවීම
මුදල් ආපසු ගෙවීම් කළ ගණන
3,200
3,100
3,000
2,900
2,800
2,700
2,600
2,500
3,500
3,000
2,500
2,000
1,500
1,000
500
-
2017
2018
2019
2020
2021
ආපසු ගෙවූ මුදල්වල වටිනාකම(රු.මී)
මුදල් ආපසු ගෙවීම් කළ ගණන


වාර්ෂික ආයෝජන ආදායම
රු.මිලියන
6,000.0
5,000.0
4,000.0
3,000.0
2,000.0
1,000.0
-
2017
2018
2019
2020
2021
වර්ෂය
මුළු ආයෝජන ආදායම
බැඳුම්කර
ස්ථාවර කැම්පතු
වෙනත්


ආදායමේ සංයුතිය
වෙනත්
0.38%
භාණ්ඩාගාර
බැඳුම්කර
29.64%
ණයකර
ආදායම
41.09%
ස්ථාවර
කැම්පතු
28.90%

21. 2021 වර්ෂය තුළ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි

අදාළ රජයේ ආයතන විසින් කරන ලද නියෝගයන් සමඟ සමාලෝචිත කාල සීමාව තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා කොමිෂන් සභාව ගත් තීරණ හා ප්‍රතිපත්තිවලට අදාළ උපදෙස් හා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ 14 ක් සහ ආයතන චක්‍රලේඛ ලිපි 19 ක් නිකුත් කර ඇත.

මේවා පිළිබඳ විස්තර 21.1 වගුවේ සහ 21.2 වගුවේ දක්වා ඇත;

අංකය	චක්‍රලේඛ අංක	විෂය	චක්‍රලේඛයේ දිනය
1	01/2021	විශ්වවිද්‍යාල පනත යටතේ විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීම	2021.01.15
2	02/2021	සහකාර සංඛ්‍යාලේඛනඥ තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	2021.02.21
3	03/2021	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයාගේ පුද්ගලික ලේකම් තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	2021.03.22
4	04/2021	පවතින උපාධි / පශ්චාද් උපාධි අධ්‍යයන වැඩසටහනකින් කලින් ඉවත්වීමකදී හෝ පසුව ඉවත්වීමකදී අදාළ සුදුසුකම් හඳුන්වාදීම	2021.04.07
5	05/2021	ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය 2015 සන්දර්භය තුළ පෙර ඉගෙනීම, අධ්‍යයන සම්භාර හුවමාරුව සහ පාර්ශ්වීය ප්‍රවේශය හඳුනා ගැනීම	2021.04.07
6	06/2021	අනධ්‍යයන පරිපාලන නොවන ශ්‍රේණිවල සේවකයන්ට ආරක්ෂිත පාවහන් ලබාදීම	2021.04.22
7	08/2016 (iii)	කථිකාචාර්ය තනතුර (පරිවාස), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය -(වෛද්‍ය / දන්ත වෛද්‍ය) සහ [(වෛද්‍ය / දන්ත වෛද්‍ය)-නොවන] තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කිරීම	2021.06.02
8	12/2020 (i)	විශ්වවිද්‍යාල ආචාර්යවරුන් රාජ්‍ය ආයතනවල සේවයට බඳවා ගැනීම	2021.06.02
9	07/2021	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ (සංශෝධිත) 46(2) වගන්තියේ අර්ථ නිරූපණය	2021.06.16
10	08/2021	වැඩ ඉංජිනේරු (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	2021.09.14

11	09/2021	උපාධි සහතිකයේ ලිවිය යුතු නම	2021.11.05
12	10/2021	විශ්වවිද්‍යාල ප්‍රජාවන් අතර සමාජ සංහිඳියාව: සමාජ ප්‍රතිසන්ධාන මධ්‍යස්ථාන පිහිටුවීම	2021.12.21
13	11/2021	විශ්වවිද්‍යාල පද්ධතියේ ගුරුවරුන් හැර අනෙකුත් සේවකයන්ගේ විශ්‍රාම යන වයස	2021.12.21
14	12/2021	සම්මානිත මහාචාර්ය ධූරය පිළිබඳ මාර්ගෝපදේශ	2021.12.21

වගුව 21.1 2021 දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ

අංකය	ආයතන චක්‍රලේඛ ලිපි අංක	විෂය	චක්‍රලේඛයේ දිනය
1	01/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 23/2020 අදාළ කර ගැනීම - රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2021 වසර	04.01.2021
2	02/2021	රජයේ ආයතනවල අනුමත තනතුරු සඳහා බඳවා ගැනීම සහ පුරප්පාඩු පිරවීම	11.01.2021
3	03/2021	රසායනාගාර උපස්ථායක තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	19.02.2021
4	04/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2021 අදාළ කර ගැනීම - රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම	06.03.2021
5	05/2021	2021 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම.	19.04.2021
6	06/2021	ගුරුවරුන්ට සහ නිලධාරීන්ට සප්ත වාර්ෂික නිවාඩු ලබා දීම	19.04.2021
7	07/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2021(I) අදාළ කර ගැනීම - රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම	28.04.2021
8	08/2021	දැන්වීම් / උසස් කිරීම මගින් පත් කරන ලද මහාචාර්යවරුන් හඳුනා ගැනීම	28.04.2021
9	09/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2021(II) අදාළ කර ගැනීම - රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම	11.05.2021
10	10/2021	සහාය මහාචාර්ය / මහාචාර්ය තනතුර සඳහා බඳවා ගැනීමේ /උසස් කිරීමේ පරිපාටි	13.07.2021

11	11/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 02/2021 (III) අදාළ කර ගැනීම - රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම	30.07.2021
12	08/2021 (i)	දැන්වීම් / උසස් කිරීම මගින් පත් කරන ලද මහාචාර්යවරුන් හඳුනා ගැනීම	29.07.2021
13	12/2021	කථිකාචාර්ය (පරිවාස), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය [(වෛද්‍ය / දන්ත වෛද්‍ය) - නොවන] යන තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි - කලා / මානව ශාස්ත්‍ර / සමාජ විද්‍යා / දෘශ්‍ය හා රංග කලා පීඨවල තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශ සඳහා අදාළ වේ	29.07.2021
14	13/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 02/2021 (IV) අදාළ කර ගැනීම - රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම	06.08.2021
15	14/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 02/2021 (V) අදාළ කර ගැනීම - රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම	01.10.2021
16	15/2021	තාවකාලිකව නිදහස් කර හෝ වෙනත් ආකාරයක නිවාඩුවක් ලබා සිටියදී දැන්වීමක් මඟින් පල කරන ලද මහාචාර්ය/ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සේවක මණ්ඩල සභාපති) තනතුරේ රාජකාරී භාර ගැනීම	26.10.2021
17	16/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2021 අදාළ කර කිරීම- 2022 වසර - රාජකාරී කටයුතු ඇරඹීම	22.12.2021
18	17/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2021 අදාළ කර ගැනීම - රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2022 වසර	28.12.2021
19	18/2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 02/2021 (VI) අදාළ කර ගැනීම - රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම	31.12.2021

වගුව 21.2 2021 දී නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

රු

	සටහන්	2021	2020
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	**1**	393,419,453	517,346,263
ලැබිය යුතු ගිණුම්	**2**	77,890,969	84,352,955
තොග		11,957,389	11,463,447
ඉදිරියට කල ගෙවීම්/තැන්පතු	**3**	7,170,278	2,825,836
මුළු ජංගම වත්කම්		**490,438,089**	**615,988,501**
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	**4**	166,509,968	76,883,610
ඉඩම් හා ගොඩනැගිලි	**4**	591,988,833	602,658,363
අස්පර්ශ්‍ය වත්කම් - පරිගණක මෘදුකාංග	**5**	10,342,433	3,848,906
කරගෙන යන වැඩ-පරිගණක මෘදුකාංග	**6**	1,413,500	12,271,750
ආයෝජන	**7**	53,094,860	49,701,691
බැදුම්කර අධිමිල	**8**	4,139,060	4,703,829
පරිත්‍යාග/ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජන	**9**	38,689,500	36,787,225
මුළු ජංගම නොවන වත්කම්		**866,178,154**	**786,855,374**
මුළු වත්කම්		**1,356,616,243**	**1,402,843,875**
ස්කන්ධය හා වගකීම			
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	**10**	185,440,026	94,780,735
ඉදිරියට ලද ගෙවීම්/තැන්පතු	**11**	36,782,022	40,901,140
මුළු ජංගම වගකීම්		**222,222,049**	**135,681,875**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම්	**12**	103,400,442	100,266,049
පරිත්‍යාග අරමුදල්	**13**	40,603,952	38,914,914
මුළු ජංගම නොවන වගකීම්		**144,004,394**	**139,180,963**
මුළු වගකීම්		**366,226,443**	**274,862,838**
ශුද්ධ වත්කම්		**990,389,800**	**1,127,981,037**
ඒකාබද්ධ අරමුදල් සහ සංචිත			
විශේෂ අරමුදල්	**14**	1,795,825	1,708,840
විලම්භිත ප්‍රාග්ධන ලැබීම්	**15**	191,836,157	188,429,760
වියදම් නොකළ 2017 අයවැය යෝජනා ප්‍රදාන	**16**	80,600,195	306,824,678
ත්‍යාග සහ ප්‍රදාන		1,214,167	759,665
සේවක සංවර්ධන අරමුදල		25,233,454	25,402,237
UGC සංවර්ධන අරමුදල		36,154,376	36,154,376
විලම්භිත ආදායම්- භූවමාරු ලාභය		41,242,466	-
නැවත අගය කිරීමේ අතිරික්තය-ඉඩම් හා ගොඩනැගිලි		509,313,767	509,313,767
නැවත අගය කිරීමේ අතිරික්තය-මෝටර් වාහන		41,451,699	-
සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)		61,547,695	59,387,714.00
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය		**990,389,800**	**1,127,981,037**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමෂන් සභා සාමාජිකයින් වගකීමෙන් බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සාමාජිකයින් විසින් අනුමත කොට කරන ලද අතර කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලද්දේ,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග	මහාචාර්ය ඒ.කේ.ඩබ්. ජයවර්ධන	ආර්.ඒ.යූ රණවීර
සභාපති	කොමිෂන් සභා සාමාජික	ගණකාධිකාරී

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු

	2021	2020
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ලැබීම්		
අතිරික්තය/(ඌනතාවය)	**9,518,666**	**29,882,647**
ගැලපීම්		
සේවක සංවර්ධන අරමුදල වෙත මාරු කිරීම්	(9,518,666)	-
ක්ෂය වීම්	44,730,070	34,655,997
ක්‍රමක්ෂය	(43,642,361)	(34,655,997)
බැදුම්කර අධිමිල	(564,769)	(564,769)
ආදායම් සහ වියදම්-අරමුදල් ගිණුම	(9,687,449)	(8,971,395)
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම	5,978,381	13,641,856
අරමුදල් කළමනාකරණ ගිණුම් පොළිය-ශිෂ්‍යත්ව අරමුදල	(158,223)	(46,049)
පෙර වර්ෂ සඳහා ගැලපීම්	2,159,980	5,445,624
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	**(1,184,371)**	**39,387,914**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
තොගවල වැඩිවීම්	(493,942)	(3,217,090)
ගෙවීම්වල අඩුවීම්	84,980,256	48,687,022
පාරිතෝෂිකය සඳහා පොළිය	3,569,217	3,568,467
ඉදිරියට කළ ගෙවීම්/තැන්පතු වල අඩුවීම්	(4,344,442)	2,126,005
අයවීම්වල වැඩිවීම්	6,461,986	54,592,934
පාරිතෝෂික ගෙවීම්	(5,848,436)	(4,025,241)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ලැබීම්	**83,140,266**	**141,120,011**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපළ පිරියත උපකරණ මිලට ගැනීම්	(31,323,578)	(21,815,869)
ස්ථාවර තැන්පතු /භාණ්ඩාගාර බැදුම්කර වල ආයෝජනය	(5,295,445)	(6,624,758)
කරගෙන යන වැඩවල වැඩිවීම් - UGC ගොඩනැඟිල්ල සහ UGC මූල්‍ය අංශය, මෘදුකාංග	10,858,250	(588,000)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(25,760,773)**	**(29,028,627)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
මූලධන ආධාර ලැබීම්	33,500,000	21,000,000
පුනරුත්ථාපන ආධාර ලැබීම්	13,000,000	3,000,000
මූලධන ආධාර (අඩුවීම්)/වැඩිවීම්	(3,406,397)	12,705,887
විශේෂ අරමුදල් අඩුවීම්	86,985	135,475
ශිෂ්‍යත්ව අරමුදල් ලැබීම්/(ගෙවීම්)	1,689,038	5,956,088
කාර්යය මණ්ඩල සංවර්ධන අරමුදලේ වැඩිවීම්/(අඩුවීම්)	(168,783)	(8,397,895)
UGC සංවර්ධන අරමුදලේ වැඩිවීම්	-	(2,975,001)
වියදම් නොකළ මානව සම්පත් සංවර්ධන අරමුදලේ වැඩිවීම්/(අඩුවීම්)	(226,224,483)	306,824,678
ත්‍යාග හා පරිත්‍යාග (අඩුවීම්)/වැඩිවීම්	217,334	134,241
මූල්‍ය ක්‍රියාකාරම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(181,306,306)**	**338,383,473**
මුදල් සහ මුදල් සමාන වත්කම් වල වැඩිවීම්/(අඩුවීම්)	**(123,926,810)**	**450,474,857**
	517,346,263	**66,871,406**
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් නොවන වත්කම්	**393,419,453**	**517,346,263**
සටහන-1		
UGC A/C 2323284 - ලංකා බැංකුව	(56,924,186)	(258,892,745)
ලංකා බැංකුව-විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව අරමුදල	6,027,364	3,133,245
රාත්‍රී කාලීන තැන්පතු	444,000,000	650,000,000
අරමුදල් කළමනාකරණ ගිණුම්	-	122,954,013
මහජන බැංකුව	316,275	151,750
	393,419,453	**517,346,263**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

විස්තරය	විලම්භීත ප්‍රදාන	වියදම් නොකළ ප්‍රදාන	රඳවාගත් ලාභ/අලාභ	UGC සංවර්ධන අරමුදල	නැවත අගය කිරීමේ අතිරික්තය	නැවත අගය කිරීමේ අතිරික්තය- මෝටර් වාහන	විලම්භීත ආදායම්- භුවමාරු ලාභය	කාර්යය මණ්ඩල සංවර්ධන අරමුදල	ත්‍යාග සහ ප්‍රදාන	ත්‍යාග සහ ප්‍රදාන- මෝටර් වාහන	එකතුව
2019.12.31 දිනට ශේෂය	201,135,647	-	24,059,443	39,129,377	509,313,767	-	-	33,800,132	893,906	-	**808,332,272**
වියදම් නොකළ 2019 අයවැය යෝජනා ප්‍රදාන		3,577				-	-	-	-	-	**3,577**
පෙරවර්ෂ සඳහා ගැලපීම්	-	-	5,445,624	-	-	-	-	-	-	-	**5,445,624**
රජයෙන් ලැබුණු ප්‍රදාන	-	440,000,000	-	-	-	-	-	-	-	-	**440,000,000**
අතිරික්තය/ඌනතාවය	-	-	29,882,647			-	-			-	**29,882,647**
වියදම් නොකළ අරමුදලට මාරු කිරීම- අත්පත් කර ගැනීම	21,000,000	(21,000,000)	-	-	-	-	-	-	-	-	**-**
පුනරුත්ථාපන වියදම් ක්‍රමක්ෂය කිරීම්	-	(2,881,725)	-	-	-	-	-	-	-	-	**(2,881,725)**
ක්ෂයවීම් ක්‍රමක්ෂය කිරීම්	(34,655,997)	-	-	-	-	-	-	-	-	-	**(34,655,997)**
මානව සම්පත් සංවර්ධන වියදම් නොකළ අරමුදලෙන් මාරු කිරීම්	697,594	(697,594)	-	-		-	-			-	**-**
වියදම් නොකළ පුනරුත්ථාපන අරමුදලෙන් මාරු කිරීම්	118,275	(118,275)	-	-	-	-	-	-	-	-	**-**
Best University ශිෂ්‍යත්ව අරමුදලට මාරු කිරීම	-	-	-	(2,000,000)	-	-	-	-	-	-	**(2,000,000)**
මානව සම්පත් සංවර්ධන වියදම් ක්‍රමක්ෂය කිරීම්	-	(108,481,304)	-	-	-	-	-	-	-	-	**(108,481,304)**
ත්‍යාග සහ ප්‍රදාන ක්‍රමක්ෂය	134,241	-	-	-	-	-	-	-	(134,241)	-	**-**
ආයෝජන සඳහා පොලිය	-	-	-	-	-	-	-	1,611,389	-	-	**1,611,389**
ජාතික විද්‍යා පදනමෙන් අරමුදලෙන් වියදම්	-	-	-	-	-	-	-	(401,500)	-	-	**(401,500)**
උත්පාදනය කරන අරමුදලෙන් වියදම්				(975,000)		-	-	-	-	-	**(975,000)**
සංවර්ධන අරමුදලෙන් මාරු කිරීම	-	-	-	-	-	-	-	(9,607,784)	-	-	**(9,607,784)**
2020.12.30 දිනට ශේෂය	**188,429,760**	**306,824,679**	**59,387,714**	**36,154,377**	**509,313,767**	**-**	**-**	**25,402,237**	**759,665**	**-**	**1,126,272,198**

වියදම් නොකළ 2019 අයවැය යෝජනා ප්‍රදාන	-	33,713,913		-	-	-	-	-	-	-	**33,713,913**
පෙරවර්ෂ සඳහා ගැලපීම්	-	-	2,159,980	-	-	-	-	-	-	-	**2,159,980**
අමාත්‍යාශයෙන් ලද මෝටර් වාහන	-	-	-	-	-	-	-	-	-	3,050,000	**3,050,000**
රජයෙන් ලැබුණු ප්‍රදාන	-	283,000,000	-	-	-	-	-	-	-	-	**283,000,000**
අතිරික්තය/ඌනතාවය	-	-	9,518,666	-	-	-	-	-	-	-	**9,518,666**
නැවත අගය කිරීම-මෝටර් වාහන අංක KS 5078						3,528,164	-	-	-	-	**3,528,164**
නැවත අගය කිරීම-මෝටර් වාහන අංක CAF 6096						32,000,000	-	-	-	-	**32,000,000**
නැවත අගය කිරීම-මෝටර් වාහන ක්ෂයවීම් ක්‍රමක්ෂය කිරීම						(4,047,630)	-	-	-	-	**(4,047,630)**
නැවත අගය කිරීමේ අතිරික්තය වාහන ඉවත් කිරීම් ගිණුමට මාරු කිරීම						(31,403,836)	-	-	-	-	**(31,403,836)**
නැවත අගය කිරීම්-මෝටර් වාහන						41,375,000	-	-	-	-	**41,375,000**
මෝටර් වාහන හුවමාරු කිරීම ලාභය වාහන අංක KQ 5408						-	42,500,000	-	-	-	**42,500,000**
හුවමාරු කරන ලද වාහනයේ ක්ෂයවීම් ක්‍රමක්ෂය කිරීම							(1,257,534)	-	-	-	**(1,257,534)**
සේවක සංවර්ධන අරමුදල වෙත මාරු කිරීම	-	-	(9,518,666)	-	-	-		9,518,666		-	**-**
වියදම් නොකළ අරමුදලට මාරු කිරීම-අත්පත් කර ගැනීම	35,528,917	(35,528,917)	-	-	-	-	-	-	-	-	**-**
පුනරුත්ථාපන වියදම් ක්‍රමක්ෂය කිරීම	-	(10,971,083)	-	-	-	-	-	-	-	-	**(10,971,083)**
ක්ෂයවීම් ක්‍රමක්ෂය කිරීම	(37,874,265)	-	-	-	-	-	-	-	-	(2,378,164)	**(40,252,429)**
මානව සම්පත් සංවර්ධන අරමුදලෙන් මාරු කිරීම	5,517,411	(270,517,411)	-	-	-	-	-	-	-	-	**(265,000,000)**
මානව සම්පත් සංවර්ධන වියදම් ක්‍රමක්ෂය කිරීම	-	(225,920,985)	-	-	-	-	-	-	-	-	**(225,920,985)**
ත්‍යාග සහ ප්‍රදාන ක්‍රමක්ෂය	234,334	-	-	-	-	-	-	-	(234,334)	-	**-**
ආයෝජන සඳහා පොලිය	-	-	-	-	-	-	-	2,205,946	-	-	**2,205,946**
සංවත්සර සැමරීම් අරමුදලෙන් ලද ස්ථාවර වත්කම්	-	-	-	-	-	-	-	-	17,000	-	**17,000**
සංවර්ධන අරමුදලෙන් වියදම් මාරු කිරීම	-	-	-	-	-	-	-	(11,893,395)	-	-	**(11,893,395)**
2021.12.30 දිනට ශේෂය	**191,836,157**	**80,600,196**	**61,547,694**	**36,154,377**	**509,313,767**	**41,451,699**	**41,242,466**	**25,233,454**	**542,331**	**671,836**	**988,593,976**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021
2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

රු

2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා	**සටහන්**	**2021**	**2020**
ආදායම			
රජයේ ප්‍රදාන	17	2,889,399,479	2,789,612,876
වෙනත් ආදායම්	18	40,301,155	29,677,510
මුළු ආදායම		**2,929,700,634**	**2,819,290,386**
වියදම			
පඩිනඩි, වේතන, සහ සේවක සුභසාධන	19	326,565,301	320,396,652
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	20	122,582,570	86,317,908
ප්‍රදාන හා වෙනත් මාරුකිරීම්	21	2,355,444,772	2,314,606,010
ක්ෂය වෙන් කිරීම් හා ක්‍රමක්ෂය	22	44,730,070	34,655,997
පුනරුත්ථාපන වියදම්	23	10,971,083	2,881,725
වෙනත් වියදම්	24	59,888,172	30,549,447
මුළු වියදම		**2,920,181,968**	**2,789,407,740**
කාල පරිච්ඡේදය තුළ අතිරික්තය/(ඌනතාවය)		**9,518,666**	**29,882,647**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } HED/A/UGC/FA/2021

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ජූනි 16 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් : 1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/UGC/FA/2021 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 ජූනි 16 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 (4) හා (8) උප වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 55 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රත්‍යාගණනය කර තිබුණු සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද මෝටර් රථ 11 කට අදාළ ප්‍රත්‍යාගණිත වටිනාකම මත ගණනය කරන ලද රු.4,047,630 ක ක්ෂය අගය ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් නැවත ආදායමට හඳුනාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ප්‍රත්‍යාගණන අතිරික්තය ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) 2020 වර්ෂයට අදාළ රු.1,086,309 ක් වූ මෝටර් රථ ක්ෂය පෙර වර්ෂයේ ලාභයට ගැළපිය යුතු වුවද, එය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වේ.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හුවමාරු ලාභය රු.42,500,000 ක් වුවද, එය රු.1,257,534 ක් ලෙස ආදායමට හඳුනාගෙන තිබීම හේතුවෙන් රු. 41,242,466 කින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අඩුවෙන් හා වාහන හුවමාරු ලාභය වැඩියෙන් දැක්වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා

කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය

විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තිය සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වසරේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේදී මාසික කුලිය රු.350,000 කට ලබාගෙන තිබුණු වර්ග අඩි 3,337 කින් යුත් ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවීම සහ ප්‍රවාහන අපහසුතා පැවතීම මත එම කල්බදු ගිවිසුම අවලංගු කර අංක 24 A, වෝඩ් පෙදෙස, කොළඹ 07 ලිපිනයේ පිහිටි වර්ග අඩි 7,000 කින් සමන්විත වූ ගොඩනැගිල්ල රු.950,000 ක මාසික කුලියට ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය 2020 නොවැම්බර් 09 දින ලැබී තිබුණි. නමුත් එම අනුමැතියට පටහැනිව මාසික කුලිය රු.350,000 ක් වූ කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව රු.4,200,000 ක අමතර මුදලක් ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවා තිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී කොමිෂන් සභාව විසින් පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ප්‍රදානලාභීන් 416 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 725.6 ක් ලබාදී තිබුණු නමුත් ඉන් ප්‍රදානලාභීන් 143 දෙනෙකු පශ්චාත් උපාධි හැදෑරීම අවලංගු කරවා ගෙන තිබුණි. පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම අවලංගු කර ගෙන තිබුණු කාර්ය මණ්ඩල සාමාජිකයින් 14 දෙනෙකු තනතුරු අතහැර යාම හේතුවෙන් ඔවුන් වෙත රු.මිලියන 24.39 ක ප්‍රදාන ලබාදී වසර 05 සිට වසර 10 දක්වා කාලයක් ගත වී තිබුණු නමුත් නැවත අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත් වී තිබුණි.

(ඇ) 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට 2019/2020 අධ්‍යයන වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීමෙන් පසු 192 සිට 220 අතර පරාසයක පුරප්පාඩු පැවතුණද එම පුරප්පාඩු වෙනුවෙන් නැවත සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සිසුන් 798 කට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි.

(ඈ) 2021 දෙසැම්බර් 08 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී, අධ්‍යාන පොදු සහතික පත්‍ර (උ.පෙළ) සමත් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්කරුවන් වෙත උපරිම අවස්ථාවක් සැලසෙන පරිදි යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වෙන පාඨමාලා ප්‍රමාණය සීමා කිරීමට නිර්දේශ කර තිබුණු නමුත් මෙම වාර්තාවේ දිනය දක්වාම එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

	වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	වර්තමාන තත්වය
1. මූල්‍ය ප්‍රකාශන --- **1.1 තත්ත්වාගණනය කළ මතය** --- **1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම** ---	(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 55 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රත්‍යාගණනය කර තිබුණු සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද මෝටර් රථ 11 කට අදාළ ප්‍රත්‍යාගණිත වටිනාකම මත ගණනය කරන ලද රු. 4,047,630ක ක්ෂය අගය ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් නැවත ආදායමට හඳුනාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ප්‍රත්‍යාගණන අතිරික්තය ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ.	විගණන විමසුමෙන් යෝජිත පරිදි ප්‍රත්‍යාගණිත මෝටර් රථ වලට අදාළ ක්‍රමක්ෂය ලෙස ආදායමට හඳුනාගෙන තිබූ රු. 4,047,630 ක මුදල සමුච්චිත අතිරික්තයට හෝ ඌනතාවයට ගලපා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
	(ආ) 2020 වර්ෂයට අදාළ රු. 1,086,309 ක් වූ මෝටර් රථ ක්ෂය පෙර වර්ෂයේ ලාභයට ගැළපිය යුතු වුවද, එය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වේ.	විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි 2021 වර්ෂයේ දී ක්ෂය ලෙස වියදමට හඳුනා ගෙන තිබූ CAF – 6096 දරන මෝටර් රථයට අදාළ රු. 1,086,309/- මුදල 2022 වර්ෂයේ, සමුච්චිත අතිරික්තයට හෝ ඌනතාවයට ගලපා ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

	වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	වර්තමාන තත්වය
	(ඇ) සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හුවමාරු ලාභය රු. 42,500,000 ක් වුව ද, එය රු.1,257,534 ක් ලෙස ආදායමට හඳුනා ගෙන තිබීම හේතුවෙන් රු. 41,242,466 කින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අඩුවෙන් හා වාහන හුවමාරු ලාභය වැඩියෙන් දැක්වේ.	විගණන විමසුමෙහි සඳහන් හුවමාරුව මගින් ලද වාහනයට අදාල ප්‍රත්‍යාගණිත අතිරික්තය, එම වාහනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ භාවිතය සඳහා වන බැවින් විලම්භීත අයභාර ගිණුමට මාරු කරන ලදී. ප්‍රත්‍යාගණිත වටිනාකම රු. 42,500,000/- වාර්ෂික ක්ෂය වටිනාකම රු. (1,257,534/-) 2021.12.31 දිනට ශේෂය රු. 41,242,466/- ඒ අනුව එම වටිනාකම හුවමාරු ලාභයක් නොව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලද වාහනයේ ප්‍රත්‍යාගණිත අගය වේ. එහෙත් විගණන වාර්තාවේ පෙන්වා දී ඇති පරිදි වඩාත් නිවැරදි ලෙස, මෙම අගය විලම්භීත අයභාර ගිණුමෙන් ප්‍රත්‍යාගණිත අයභාර ගිණුමට මාරු කර ගිණුම් නිවැරදි කිරීමට එකඟ වෙමි.
2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව ----------		
2.3 වෙනත් කරුණු ----------		
	(අ) කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේ දී මාසික කුලිය රු. 350,000 කට ලබා ගෙන තිබුණු වර්ග අඩි 3,337 කින් යුතු ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවීම සහ ප්‍රවාහන අපහසුතා පැවතීම මත එම කල්බදු ගිවිසුම අවලංගු කර අංක 24 A, වෝඩ් පෙදෙස, කොළඹ 07 ලිපිනයේ පිහිටි වර්ග අඩි 7,000 කින් සමන්විත වූ ගෙඩනැගිල්ල රු.950,000 ක මාසික කුලියට ලබා ගැනීම	විශ්වවිද්‍යාල අධ්‍යාපනය පුළුල් කිරීමේ අරමුණින් නගර විශ්වවිද්‍යාල ඇති කිරීම, විශ්වවිද්‍යාල පනත සංශෝධනය, UTEL අංශය පිහිටුවීම වැනි නව ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඒ වන විට නොතිබුණි. ඒ අනුව එවකට රු.350,000.00 මාසික කුලී පදනම මත ලබා ගෙන තිබූ වර්ග අඩි 3,337 කින් යුතු ගොඩනැගිල්ලේ පිහිටි අංශ ද ඇතුළත්ව, ඉහත නව ව්‍යාපෘති ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ආසන්නයේ පිහිටි වර්ග අඩි 7,000 කින් යුත් ගොඩනැගිල්ලක් කුලී පදනම මත

	වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	වර්තමාන තත්වය
	සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය 2020 නොවැම්බර් 09 දින ලැබී තිබුණි. නමුත් එම අනුමැතියට පටහැනිව මාසික කුලිය රු. 350,000 ක් වූ කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව රු.4,200,000 ක අමතර මුදලක් ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවා තිබුණි.	ලබා ගැනීම මගින් ස්ථාපනය කිරීමට මූලික අවසරය ලබා ගන්නා ලදී. ඒ අතරතුර එවකට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විශාල බාධාවක්ව පැවති ප්‍රවේශ ගැටළුවලට අදාලව දෛනිකව ලැබෙන විශාල විමසීම් ගණනකට පිළිතුරු ලබා දීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීමේ ගැටළුවට පිලියමක් ලෙස නව තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී. තව ද ඊට සමගාමීව මහජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබාදීමේ අරමුණින් මහජනතාව සමග සෘජුව සම්බන්ධ වන කළමනාකරණ තොරතුරු අංශය, අධ්‍යයන අංශය හා තැපැල් අංශය ද එකම තැනකට ගැනීම කෙරෙහි අවධානය යොමු විය. එම අංශයන් කුලී පදනම මත ලබාගත් තාවකාලික ගොඩනැගිල්ලේ ස්ථාපනය කිරීමෙන් අනතුරුව ඊට පෙර කුලී පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිල්ලේ පිහිටි අංශයන් නව ගොඩනැගිල්ලේ ස්ථාපනය සඳහා ප්‍රමාණවත් ඉඩක් නොමැති වීම නිසා එම පැරණි කල්බදු ගිවිසුමද අහෝසි කිරීමකින් තොරව පවත්වා ගැනීමට සිදුවිය. කෙසේ නමුත් මෙය ජාතික අවශ්‍යතාව හමුවේ වඩාත් ඵලදායී සේවාවක් ලබා දීමේ අරමුණින් යුතුව සිදුකරන ලද්දකි.
	(ආ) 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුලදී කොමිෂන් සභාව විසින් පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ප්‍රදානලාභීන් 416 දෙනෙකු වෙනුවෙන් රු. මිලියන 725.6 ක් ලබා දී තිබුණු නමුත් ඉන් ප්‍රදානලාභීන් 143 දෙනෙකු පශ්චාත් උපාධි හැදෑරීම අවලංගු කරගෙන තිබුණි. පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම අවලංගු කරවා ගෙන තිබුණු කාර්ය මණ්ඩල සාමාජිකයින් 14 දෙනෙකු තනතුරු අතහැර යාම හේතුවෙන් ඔවුන් වෙත රු. මිලියන 24.39 ක ප්‍රදාන ලබා දී වසර 05 සිට වසර 10 දක්වා කාලයක් ගත වී තිබුණු නමුත් නැවත අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත් වී තිබුණි.	2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පශ්චාත් උපාධි ප්‍රදාන 421 ක් ලබා දී තිබුණ අතර ඒ අතරින් ප්‍රදානලාභීන් 143 දෙනකු පහත හේතූන් මත එම ප්‍රදානයන් අවලංගු කරගෙන තිබුණි. I. වෙනත් මූල්‍ය මූලාශ්‍ර (NCAS, AHEAD, HETC හෝ වෙනත්) මගින් එම පශ්චාත් උපාධිය හැදෑරීමට අවශ්‍ය අරමුදල් ලැබීම. II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ප්‍රදානයන් ලැබීමට සපුරාලිය යුතු මූලික සුදුසුකමක් වන IELTS සුදුසුකම, නියමිත කාලයේදී සපුරාගත නොහැකි වීම. III. නියමිත කාලය තුලදී තම පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා සුදුසු විදේශීය / දේශීය විශ්වවිද්‍යාලයන්හි නිකුත්කල ස්ථාන ගතකිරීමේ ලිපියක් (Placement Letter) නොමැති වීම.

	වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	වර්තමාන තත්වය
		ඒ අනුව 2009 - 2020 වර්ෂය දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන අරමුදල් භාවිත කොට පශ්චාත් උපාධි හැදෑරීම සඳහා යොමුවී ඇත්තේ 273 දෙනකු පමණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පශ්චාත් උපාධි ක්‍රමය යටතේ 2009 - 2020 දක්වා ප්‍රදානයන් ලබාගත් එම 273 දෙනා අතරින් 190 දෙනකු හෙවත් 69% ප්‍රතිශතයක් 2021 දෙසැම්බර් මස 08 වන දින වන විට තම පශ්චාත් උපාධිය සම්පූර්ණ කර තිබුණ බව නිරීක්ෂණය විය. පශ්චාත් උපාධිය සම්පූර්ණ කිරීමට නියමිත ප්‍රදාන ලාභීන් 83 දෙනා අතරින් ප්‍රදානලාභී 32 දෙනකු ප්‍රදාන ලබා පශ්චාත් උපාධිය හැදෑරීම ආරම්භ කර ඇත්තේ 2018 වසරේ හෝ ඉන් පසුව වන අතර ඔවුන් ප්‍රදානය ලබා පශ්චාත් උපාධිය හැදෑරීම අරඹා වසර 3 - 3½ ක් ඉක්මවා ගොස් නැත. 2009 සිට 2016 වර්ෂය දක්වා කාල පරාසය තුල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන ලැබූ අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයන් 14 දෙනකු තනතුරු අතහැර ගොස් ඇත. ඔවුන් 14 දෙනා වෙත පිරිනමා ඇති ප්‍රදාන මුදල නැවත අයකර ගැනීම සඳහා එම ප්‍රදාන ලාභීන් අනුයුක්තව සිටි විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා උපදෙස් මත නීතිමය පියවර ගෙන ඇත.
	(ඇ) 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට 2019/2020 අධ්‍යයන වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීමෙන් පසු 192 සිට 220 අතර පරාසයක පුරප්පාඩු පැවතුණ ද එම පුරප්පාඩු වෙනුවෙන් නැවත සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සිසුන් 798කට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි.	මේ වන විට 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා වන පුරප්පාඩු පිරවීමේ තෙවන අදියර සම්පූර්ණ කරගෙන යනු ලැබේ.

	වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	වර්තමාන තත්වය
	(ඇ) 2021 දෙසැම්බර් 08 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) සමත් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්කරුවන් වෙත උපරිම අවස්ථාවක් සැලසෙන පරිදි යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වෙන පාඨමාලා ප්‍රමාණය සීමා කිරීමට නිර්දේශ කර තිබුණු නමුත් මෙම වාර්තාවේ දිනය දක්වාම එම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.	යෝග්‍යතා/ ප්‍රයෝගික පරීක්ෂණ පැවැත්වෙන අධ්‍යයන පාඨමාලා සඳහා සුදුසුකම් ලැබීමට එකී පරීක්ෂණ නොමැතිව සපුරාලිය යුතු අවම සුදුසුකම් පිළිබඳව අදාළ විශ්වවිද්‍යාල, මණ්ඩප සහ උසස් අධ්‍යාපන ආයතන සමඟ සාකච්ඡා කිරීම් මේ වන විට ආරම්භ කර ඇත. එම සාකච්ඡා කිරීම් තුළින් අදාළ අධ්‍යයන පාඨමාලා සඳහා යෝග්‍යතා/ ප්‍රායෝගික පරීක්ෂණ වෙනුවට සපුරාලිය යුතු අවම සුදුසුකම් පිළිබඳව කඩිනමින් එකඟතාවයන්ට එළැඹීමට බලාපොරොත්තු වේ. එසේ එළැඹෙන එකඟතාවයන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශ කමිටුවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතීන් ලබා ගත් වහාම ඒවා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021
2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2021	2020
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන අයිතම	5	44,859,215	121,490,944
ලැබිය යුතු ආයෝජන ආදායම	6	530,170,681	486,302,981
ලැබිය යුතු දායක මුදල්	7	57,045,488	68,726,222
ආයෝජන	8	3,699,461,278	2,753,971,020
		4,331,536,662	3,430,491,167
ජංගම නොවන වත්කම්			
ආයෝජන	8	12,224,038,623	10,474,754,927
ලැබිය යුතු ආයෝජන ආදායම	6	831,346,849	616,341,514
		13,055,385,473	11,091,096,441
මුළු වත්කම්		**17,386,922,134**	**14,521,587,608**
වගකීම්			
ජංගම වගකීම්			
විවිධ ණයහිමියෝ	9	1,143,138	1,137,214
සාමාජිකයන්ට ගෙවිය යුතු මුදල්	10	9,229,054	9,513,631
අර්:සාධක අරමුදලට ගෙවිය යුතු මුදල්	11	25,391	91,333
ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව	12	31,618	31,618
ගෙවිය යුතු ආදායම් බදු	13	224,338,404	182,854,784
		234,767,606	193,628,580
මුළු ශුද්ධ වත්කම්		**17,152,154,529**	**14,327,959,028**
සාමාජික අරමුදල හා සංචිත			
දායක අරමුදල		16,238,158,170	13,472,992,176
විශ්‍රාම අරමුදල		417,723,204	358,793,633
සමුච්චිත ආදායම		496,273,155	496,173,219
අරමුදලේ ශුද්ධ අගය		**17,152,154,529**	**14,327,959,028**

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		2021	2020
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය			
බදු හා වියදම් පසු ශුද්ධ ආදායම		**1,222,412,486**	**1,129,849,616**
එකතු කළා/ (අඩු කළා):			
භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම/ අධිමිල		24,863,911	15,695,772
විශ්‍රාම අරමුදලේ ගැලපීම		14,711,753	12,147,579
ආදායම් බදු වෙන් කිරීම්		206,023,853	188,753,273
		1,468,012,003	1,346,446,240
කාරක ප්‍රාග්ධනය ක්‍රියාකාරී අරමුදල් වෙනස්වීම්			
ලැබිය යුතු ආයෝජන ආදායම් (වැඩිවීම)/අඩුවීම		(258,873,035)	(365,711,817)
විවිධ ණයහිමියන්ගේ වැඩිවීම/ (අඩුවීම)		5,924	54,183
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල්		**1,209,144,892**	**980,788,606**
අඩු කළා ආදායම් බදු ගෙවීම්		(164,540,233)	(124,599,824)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**1,044,604,659**	**856,188,783**
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය			
ස්ථාවර තැන්පත් කල්පිරීම්		2,304,032,556	1,819,511,250
ස්ථාවර තැන්පත් වල ආයෝජනය		(3,111,355,837)	(2,154,032,556)
ණයකර කල්පිරීම්		400,000,000	-
ණයකර මිලදී ගැනීම්		(800,000,000)	(1,800,000,000)
භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීම්		50,000,000	-
භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම්		(1,562,314,585)	(583,313,123)
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(2,719,637,866)**	**(2,717,834,429)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය			
දායක මුදල් ලැබීම්		1,788,428,306	1,617,121,757
දායක මුදල් ආපසු ගෙවීම්		(83,427,798)	(82,263,214)
විශ්‍රාම වැටුප් ගෙවීම්		(106,599,030)	(92,552,055)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**1,598,401,478**	**1,442,306,487**
මුදල් සහ මුදල් සමාන අයිතම වල ශුද්ධ වැඩිවීම		(76,631,729)	(419,339,159)
ආරම්භක මුදල් සහ මුදල් සමාන අයිතම		121,490,944	540,830,104
අවසාන මුදල් සහ මුදල් සමාන අයිතම		**44,859,215**	**121,490,944**
බැංකු මුදල්			
ලංකා බැංකුව		(1,086,070)	997,561
මහජන බැංකුව		2,000,000	2,000,000
එකතු කළා- අරමුදල් කළමණාකරන ගිණුම් ශේෂ			
අරමුදල් කළමණාකරන ගිණුම	ලංකා බැංකුව	9,075,246	11,605,151
අරමුදල් කළමණාකරන ගිණුම	මහජන බැංකුව	34,870,040	106,888,233
		44,859,215	**121,490,944**

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

	දායකයන්ගේ අරමුදල	විශ්‍රාමිකයන්ගේ අරමුදල	සමුච්චිත අරමුදල	එකතුව
	(රුපියල්)	(රුපියල්)	(රුපියල්)	(රුපියල්)
2020.01.01 දිනට ශේෂය	**10,905,585,546**	**321,402,667**	**494,273,173**	**11,721,261,386**
2020 වර්ෂය සඳහා අතිරික්තය	-	-	1,129,849,616	1,129,849,616
සාමාජික පොළී රඳවා ගැනීම්	(15,896,766)		15,896,766	
වැරදි දායක මුදල් නිවැරදි කිරීම	(75,476)	-	-	(75,476)
හිඟ/නොලැබූ දායක මුදල්	8,511,015	-	-	8,511,015
පවත්නා වර්ෂයේ ආදායමෙන් වන හුවමාරු	-	12,147,579	-	12,147,579
විශ්‍රාමිකයන්ට අදාල දායක මුදල් ලැබීම්	-	177	-	177
පවත්නා වර්ෂයේ දායකත්ව අරමුදල්	1,636,968,067	-	-	1,636,968,067
සම්පූර්ණ දායක මුදල් ආපසු ලබාදීම	(67,908,382)	-	-	(67,908,382)
දායක අරමුදල්/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම්	(89,960,446)	89,960,446	-	-
අර්ථසාධක අරමුදලට මාරු කිරීම්	(20,242,899)	-	-	(20,242,899)
2020 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම	-	(92,552,055)	-	(92,552,055)
විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොළිය	1,116,011,515	27,834,820	(1,143,846,336)	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**13,472,992,175**	**358,793,633**	**496,173,219**	**14,327,959,028**
2021 වර්ෂය සඳහා අතිරික්තය	-	-	1,222,412,486	1,222,412,486
සාමාජික පොළී රඳවා ගැනීම්	(3,580,957)		3,584,904	3,947
වැරදි දායක මුදල් නිවැරදි කිරීම	(115,293)	-	-	(115,293)
හිඟ/නොලැබූ දායක මුදල්	13,705,308	-	-	13,705,308
පවත්නා වර්ෂයේ ආදායමෙන් වන හුවමාරු	-	14,711,753	-	14,711,753
විශ්‍රාමිකයන්ට අදාල දායක මුදල් ලැබීම්	-	2,265	-	2,265
පවත්නා වර්ෂයේ දායකත්ව අරමුදල	1,763,151,345	-	-	1,763,151,345
සම්පූර්ණ දායක මුදල් ආපසු ලබා දීම	(65,527,409)	-	-	(65,527,409)
දායක අරමුදල/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම්	(123,944,405)	123,944,405	-	-
වි.වි. අර්:සාධක අරමුදල වෙත මාරු කිරීම්	(17,549,870)	-	-	(17,549,870)
2021 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම	-	(106,599,030)	-	(106,599,030)
විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොළිය	1,199,027,275	26,870,178	(1,225,897,453)	-
	2,765,165,995	58,929,571	99,937	2,824,195,502
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**16,238,158,170**	**417,723,204**	**496,273,155**	**17,152,154,529**

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

		සටහන්	2021 රු.	2020 රු.
ආදායම				
ආයෝජන ආදායම		14	1,444,990,138	1,332,499,203
අඩු කළා	ආදායම් බදු වෙන්කිරීම		(206,023,853)	(188,753,273)
බදු පසු ශුද්ධ ආදායම			**1,238,966,285**	**1,143,745,931**
අඩු කලා	**වියදම්**			
	විශ්‍රාම අරමුදල් ගැලපීම	15	14,711,753	12,147,579
	මෙහෙයුම් වියදම්	16	1,842,046	1,748,736
			16,553,799	**13,896,315**
වියදම් අඩුකල පසු ශුද්ධ ආදායම			**1,222,412,486**	**1,129,849,616**
එකතු කළා:	ආදායමට ගැළපීම්		3,584,904	15,896,766
	ඉදිරියට ගෙනා රඳවා ගත් ලාභය		496,173,219	494,273,173
බෙදිය හැකි ශුද්ධ ආදායම			**1,722,170,609**	**1,640,019,555**
අඩු කලා	**සාමාජික පොළී**			
	දායක අරමුදල් සඳහා පොළිය		1,199,027,275	1,116,011,515
	විශ්‍රාම අරමුදල් සඳහා පොළිය		26,870,178	27,834,820
			1,225,897,453	**1,143,846,336**
ඉදිරියට ගෙන ගිය රඳවා ගත් ලාභය			**496,273,155**	**496,173,219**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எமது இல. / My No. HFD/A/PNF/FA/2021 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 අප්‍රේල් 20 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 01. ලේකම්- අධ්‍යාපන අමාත්‍යාංශය

02. ලේකම්- මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/PNF /FA/2021

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 අප්‍රේල් 20 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාවට අනුව, එහි විගණන විමසුම් කිසිවක් සඳහන් කර නොමැත. එබැවින් මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් දැක්වීමට නොමැත.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021
2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	2021 වර්ෂය රුපියල්	(ප්‍රති ප්‍රකාශිත) 2020 වර්ෂය රුපියල්
වත්කම්		
ජංගම වත්කම්		
මුදල් හා මුදල් සමාන වත්කම්	76,144,214	225,297,548
ලැබිය යුතු පොළිය	1,991,690,268	1 ,736,137,307
ලැබිය යුතු දායක මුදල්	211,190,152	254,859,438
ලැබිය යුතු අර්ථසාධක ණය වාරික	30,860,266	35,588,693
ලැබිය යුතු අර්ථසාධක ණය	1,462,808,971	1,046,871,791
ආයෝජන	12,489,607,333	11,223,586,114
වෙනත් අත්තිකාරම්	486,611	362,800
තොග	107,612	28,112
	16,262,895,427	14,522,731,803
ජංගම නොවන වත්කම්		
ලැබිය යුතු පොළිය	2,135,210,959	1,687,409,659
දේපළ , පිරියත හා උපකරණ	15,467	27,067
අස්පෘශ්‍ය වත්කම්	720,623	1,205,934
දිගුකාලීන ආයෝජන	39,500,907,720	34,360,934,984
අර්ථසාධක ණය	6,252,393,294	6,384,690,902
	47,889,248,063	42,434,268,547
මුළු වත්කම්	**64,152,143,490**	**56,957,000,350**
වගකීම්		
අඩුකලා : ජංගම වගකීම්		
මුදල් හා මුදල් සමාන දෑ	88,203,527	70,674,137
විවිධ ණයහිමියෝ	35,624,314	2,044,497
ගෙවිය යුතු ජීවන වියදම් දීමනා හිඟ දායක මුදල්	43,575,020	45,849,418
ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ	49,903,091	49,806,648
ගෙවිය යුතු බදු	748,455,782	650,247,608
	965,761,734	818,622,308
මුළු ශුද්ධ වත්කම්	**63,186,381,755**	**56,138,378,042**
මූල්‍යයනය වන්නේ;		
සාමාජික ගිණුම් ශේෂය - ක්‍රියාකාරී	62,988,316,953	56,020,836,691
සාමාජික ගිණුම් ශේෂය - අක්‍රිය	38,134,412	38,153,592
අක්‍රිය ගිණුම් සඳහා වෙන්කිරීම්	8,000,000	8,000,000
ඉල්ලුම් නොකල ප්‍රතිලාභ සංචිත	6,997,078	6,993,398
රඳවා ගත් ලාභ	144,933,312	64,394,361
අරමුදලේ ශුද්ධ වටිනාකම	**63,186,381,755**	**56,138,378,042**

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021 වර්ෂය රුපියල්	(ප්‍රති ප්‍රකාශිත) 2020 වර්ෂය රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය		
බදු සහ වියදම් වලට පසුව ශුද්ධ ලාභය	4,225,026,102	4,063,226,896
ගැලපීම්		
භාණ්ඩාගාර බිල්පත් අව මිල/අධි මිල	90,488,260	73,006,730
භාණ්ඩාගාර බිල්පත් විකිණීමෙන් ලද ලාභය/පාඩුව	-	-
වර්ෂයේ ක්ෂය	11,600	95,325
කපාහැරීම්	485,311	485,311
ආදායම් බදු	703,414,046	673,936,576
මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය	5,019,425,321	4,810,750,839
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම		
තොග වෙනස්වීම	(79,500)	182,543
ලැබිය යුතු ආයෝජන ආදායම් වෙනස්වීම	(703,354,261)	(1,021,525,417)
අත්තිකාරම් වෙනස්වීම	(123,811)	10,906
ලැබිය යුතු ණය වාරික වෙනස්වීම	4,728,427	(12,623,125)
ගෙවිය යුතු ජීවන වියදම් දීමනා වෙනස්වීම	2,274,398)	18,205
විවිධ ණයහිමියන්ගේ වෙනස්වීම	33,579,818	62,057
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල්	4,351,901,595	3,776,876,007
වර්ෂය තුල ගෙවන ලද ආදායම් බදු	(605,205,872)	(471,721,511)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,746,695,723**	**3,305,154,495**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
ස්ථාවර තැන්පතු කල්පිරීම්	9,580,049,064	7,401,682,192
ස්ථාවර තැන්පතු ආයෝජන	(10,844,882,009)	(10,156,731,256)
භාණ්ඩාගාර බැඳුම්කර විකිණීම/කල්පිරීම	50,000,000	-
ණයකර මිලට ගැනීම	1,595,366,700	-
භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීම	(3,300,000,000)	(3,200,000,000)
දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම	(3,577,015,970)	(1,427,757,222)
අර්ථසාධක ණය ලබා දීම් හා පියවීම්	(283,639,572)	(384,967,976)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(6,780,121,787)**	**(7,767,774,262)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
සාමාජික මුදල් ලැබීම්	6,159,907,301	5,808,176,372
සාමාජික මුදල් ගෙවීම්	(3,293,163,961)	(2,708,555,744)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**2,866,743,340**	**3,099,620,628**
මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම	**(166,682,724)**	**(1,362,999,138)**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන වත්කම්	154,623,411	1,517,622,550
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන වත්කම්	**(12,059,313)**	**154,623,411**

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

	සාමාජික ශේෂය ක්‍රියාකාරී	සාමාජික ශේෂය අක්‍රිය	අක්‍රිය සාමාජික ගිණුම් සඳහා වෙන් කිරීම්	ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ සංචිත	රඳවා ගන්නා ලද ලාභ	මුළු ශුද්ධ වත්කම්
2020.01.01 දිනට ශේෂය (ප්‍රති ප්‍රකාශිත)	48,690,885,342	38,208,635	8,000,000	6,981,274	124,221,377	48,868,296,627
වර්ෂයට අදාල සාමාජික මුදල්	5,929,904,394	-	-	-	-	5,929,904,394
සාමාජික පොළී	4,146,785,331	-	-	-	(4,146,785,331)	(0)
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී	-	-	1,951,215	-	(1,951,215)	-
සාමාජික මුදල් නැවත ගෙවීම්	(2,712,351,127)	-	-	-	-	(2,712,351,127)
සප්ත වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම්	(9,942,329)	-	-	-	-	(9,942,329)
ගැළපිලි	(24,444,921)	(55,043)	(1,951,215)	12,124	26,439,054	-
2019 වර්ෂයේ අතිරික්තය (ප්‍රති ප්‍රකාශිත)	-	-	-	-	4,062,470,477	4,062,470,477
2021.12.31 දිනට ශේෂය (ප්‍රති ප්‍රකාශිත)	**56,020,836,691**	**38,153,592**	**8,000,000**	**6,993,398**	**64,394,361**	**56,138,378,042**
වර්ෂයට අදාල සාමාජික මුදල්	6,132,431,980	-	-	-	-	6,132,431,980
සාමාජික පොළී	4,195,276,550	-	-	-	(4,195,276,550)	-
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී	-	-	926,873	-	(926,873)	-
සාමාජික මුදල් නැවත ගෙවීම්	(3,293,260,404)	-	-	-	-	(3,293,260,404)
සප්ත වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම්	(16,193,966)	-	-	-	-	(16,193,966)
ගැළපිලි	(50,773,898)	(19,180)	(926,873)	3,680	51,716,271	(0.00)
2020 වර්ෂයේ අතිරික්තය	-	-	-	-	4,225,026,102	4,225,026,102
2021.12.31 දිනට ශේෂය	**62,988,316,953**	**38,134,412**	**8,000,000**	**6,997,078**	**144,933,312**	**63,186,381,755**

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

	2021 වර්ෂය රුපියල්	(ප්‍රති ප්‍රකාශිත) 2020 වර්ෂය රුපියල්
ආදායම්		
ආයෝජන ආදායම්	4,932,068,135	4,739,946,396
අඩුකලා : මෙහෙයුම් වියදම්	(3,627,986)	(3,662,481)
බදු පෙර ශුද්ධ ආදායම	**4,928,440,149**	**4,736,283,915**
අඩුකලා : ආදායම් බදු	(703,414,046)	(673,813,438)
බදු පසු ශුද්ධ ආදායම	**4,225,026,102**	**4,062,470,477**
එකතුකලා : සංචිත		
ආදායමට ගැලපීම්	51,716,271	26,439,054
පසුගිය වසරේ රඳවාගත් ලාභය	64,394,361	124,221,377
බෙදාහැරීම් සඳහා ශුද්ධ ලාභය	**4,341,136,735**	**4,213,130,908**
සාමාජික ගිණුම් සඳහා පොළිය	(4,195,276,550)	(4,146,785,331)
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළිය	(926,873)	(1,951,215)
ඉදිරියට ගෙන යන රඳවාගත් ලාභ	**144,933,312**	**64,394,361**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/UPF/FA/2021

ඔබේ අංකය உமது இல. Your No

දිනය திகதி Date 2022 අප්‍රේල් 20 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 01. ලේකම්- අධ්‍යාපන අමාත්‍යාංශය

02. ලේකම්- මුදල් අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/A/UPF /FA/2021 මගෙ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 අප්‍රේල් 20 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

නීතිරීති / විධානයට යොමුව		විස්තරය
(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය	(i)	අර්ථසාධක අරමුදලේ දායකයෙකුගේ බැරට ඇති සම්පූර්ණ මුදල ඔහුගේ ගිණුම අවසන් කරනු ලැබූ දින සිට මාස 3ක කාල සීමාවක් ඇතුළත ඔහුට නොගෙවා ඇති අවස්ථාවක ඔහුට ගෙවනු ලබන මාසයට ඉහතින් වූ මාසයේ අන්තිම දිනය දක්වා ඔහුගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල එකතු කර ඔහුට ගෙවිය යුතු වේ. එසේ වුවද සේවය අවසන් කර ප්‍රතිලාභ ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් මාස 3 ක සිට මාස 420 ක් දක්වා කාල ප්‍රමාදයක් ගතවී ඇති අවස්ථා 36 ක් සඳහා රු. 626,716 ක පොලියක් ගෙවා තිබුණි.
	(ii)	ප්‍රමාදය දායකයාගේ වරදින් සිදු වූවක් නම් එම කාලයට පොළිය ගෙවීම සිදු නොකළ යුතු වුවද, ප්‍රතිලාභ ගෙවීමේ දී මාස 1 ක සිට මාස 408 ක් දක්වා පරාසයක ප්‍රමාද ව දායකයන් විසින් අයදුම්පත් ඉදිරිපත් කර තිබූ අවස්ථා 10 ක් සඳහා ඉහත පොළියේ ඇතුලත් රු. 74,201 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ)	1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරන කොමිෂන් සභා චක්‍රලේඛය	දායකයා සේවය අවසන් කර ප්‍රතිලාභ ලබා ගැනීමේ අයදුම්පත අදාළ විශ්වවිද්‍යාලයට භාරදී මාස 02 ක් ඇතුළත කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවද නියමිත කාලය තුළ අදාළ උසස් අධ්‍යාපන ආයතනය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මාස 02ක සිට මාස 36 ක් දක්වා සිදු වී තිබූ ප්‍රමාද අවස්ථා 35 ක් සඳහා රු. 546,862 ක පොළියක්ද දායකයින් වෙත ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

	වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	වර්තමාන තත්වය
3. මෙහෙයුම් සමාලෝචනය **3.1 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම** **(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය**	**(i)**අර්ථසාධක අරමුදලේ දායකයෙකුගේ බැරට ඇති සම්පූර්ණ මුදල ඔහුගේ ගිණුම අවසන් කරනු ලැබූ දින සිට මාස 03 ක කාල සීමාවක් ඇතුළත ඔහුට නොගෙවා ඇති අවස්ථාවක ඔහුට ගෙවනු ලබන මාසයට ඉහතින් වූ මාසයේ අන්තිම දිනය දක්වා ඔහුගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල එකතු කර ඔහුට ගෙවිය යුතු වේ. එසේ වුව ද සේවය අවසන් කර ප්‍රතිලාභ ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් මාස 3ක සිට 420 ක් දක්වා කාල ප්‍රමාදයක් ගත වී ඇති අවස්ථා 36 ක් සඳහා රු. 626,716/- ක පොළියක් ගෙවා තිබුණි.	අර්ථසාධක අරමුදලේ නිදහස් කිරීමේ පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවීමේදී ප්‍රමාදය සඳහා දායකයා වගකිව යුතු නොමැති අවස්ථාවන්හිදී එම ප්‍රමාදය සඳහා වන ප්‍රමාද පොළි අදාල නිළධාරීන්ගෙන් අයකර ගත යුතු වේ. එමෙන්ම අදාල නිළධාරීන්ගෙන් ප්‍රමාද පොළි අයකිරීම පිළිබඳව කටයුතු කළ යුත්තේ ඒ ඒ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මගිනි. මේ පිළිබඳව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සුපරීක්ෂණ කමිටුවේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ මතය වනුයේ ප්‍රමාදයට හේතුව නිලධාරීන්ගේ වරද මතම නොව තොරතුරු සැපයීම හා එක්රැස් කිරීම සඳහා ගතවන කාලය බවයි. ඒ අනුව අර්ථ සාධක අරමුදල් ගෙවීම් පත්‍රිකා එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලකා ගැනීමට අදාළව 2022 පෙබරවාරි 07 වන දිනැති, අංක 03/2022 කොමිෂන් සභා වක්‍රලේඛය නිකුත් කර ඇත. එමෙන්ම පොලී ගෙවීම සමාජිකයන්ගේ බැරට ඇති මුදල මත පදනම්ව සිදුකර ඇති බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාමාජිකයාට හිමි නොවන කිසිදු ප්‍රමාද පොලියක් ගෙවා නොමැත.

	වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු	වර්තමාන තත්වය
	(ii)ප්‍රමාදය දායකයාගේ වරදින් සිදු වූවක් නම් එම කාලයට පොළිය ගෙවීම සිදු නොකළ යුතු වුවද, ප්‍රතිලාභ ගෙවීමේ දී මාස 1 සිට මාස 408 දක්වා පරාසයක ප්‍රමාදව දායකයන් විසින් අයදුම්පත් ඉදිරිපත් කර තිබූ අවස්ථා 10 ක් සඳහා ඉහත පොළියේ ඇතුළත් රු.74,201/- ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.	අර්ථසාධක අරමුදලේ නිදහස් කිරීමේ පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවීමේදී ප්‍රමාදය සඳහා දායකයා වගකිව යුතු නොමැති අවස්ථාවන්හිදී එම ප්‍රමාදය සඳහා වන ප්‍රමාද පොළි අදාල නිළධාරීන්ගෙන් අයකර ගත යුතු වේ. එමෙන්ම අදාල නිළධාරීන්ගෙන් ප්‍රමාද පොළි අයකිරීම පිළිබඳව කටයුතු කළ යුත්තේ ඒ ඒ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මගිනි. මේ පිළිබඳව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සුපරීක්ෂණ කමිටුවේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ මතය වනුයේ ප්‍රමාදයට හේතුව නිලධාරීන්ගේ වරද මතම නොව තොරතුරු සැපයීම හා එක්රැස් කිරීම සඳහා ගතවන කාලය බවයි. ඒ අනුව අර්ථ සාධක අරමුදල් ගෙවීම් පත්‍රිකා එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලකා ගැනීමට අදාළව 2022 පෙබරවාරි 07 වන දිනැති, අංක 03/2022 කොමිෂන් සභා චක්‍රලේඛය නිකුත් කර ඇත. එමෙන්ම පොලී ගෙවීම සමාජිකයන්ගේ බැරට ඇති මුදල මත පදනම්ව සිදුකර ඇති බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාමාජිකයාට හිමි නොවන කිසිදු ප්‍රමාද පොලියක් ගෙවා නොමැත.
(ආ) 1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරන කොමිෂන් සභා චක්‍රලේඛය	දායකයා සේවය අවසන් කර ප්‍රතිලාභ ලබා ගැනීමේ අයදුම්පත අදාළ විශ්වවිද්‍යාලයට භාර දී මාස 2 ක් ඇතුළත කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවද නියමිත කාලය තුල අදාළ උසස් අධ්‍යාපන ආයතනය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මාස 2 ක සිට මාස 36 ක් දක්වා සිදු වී තිබූ ප්‍රමාද අවස්ථා 35 ක් සඳහා රු. 546,862/- ක පොළියක්ද දායකයන් වෙත ගෙවා තිබුණි.	මේ වන විට අර්ථසාධක අරමුදල් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කටයුතු තවදුරටත් විධිමත් කර 03/2022 දරණ කොමිෂන් සභා චක්‍රලේඛය නිකුත් කර ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව

2021

තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව - 2021

වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017.07.25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2017 අවශ්‍ය මාර්ගෝපදේශ හා මඟ පෙන්වීම් සපයනු ලබයි.

අයවැය ක්‍රියාවලිය සඳහා හඳුන්වාදෙන මධ්‍ය කාලීන ඉදිරි දැක්ම තුළින් වඩාත් උපායමාර්ගිකව රජයේ ප්‍රමුඛතාවලට ප්‍රතිචාර දැක්විය හැකි බව ද එහි සඳහන් වේ. ඒ අනුව, අයවැය ක්‍රියාවලිය මඟින් ඇස්තමේන්තුගත සම්පත් ලබා ගැනීම; මධ්‍ය කාලීන සැලසුම, සාර්ව මූල්‍ය රාමුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රමුඛතා මාවත ඔස්සේ සම්බන්ධ කළ හැකි අතර මෙයින් අයවැය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය විනය ශක්තිමත් කිරීම මෙන්ම රජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා සමඟ අයවැය ප්‍රතිපාදන යථා තත්ත්වයට පත් කිරීම සිදු කළ හැකිය.

මේ අතර, අයවැය සැකසීමේ පුළුල් ඉදිරිදැක්මට ඇතුළත් වන්නේ, 2015 දී එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් සම්මත කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක ලැයිස්තුවට අදාළ, 2030 වන විට සාක්ෂාත් කර ගත යුතු තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කළ යුතු ආකාරයයි.

තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් ඇති අතර, එයින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා වඩාත්ම අදාළ ඉලක්කය වන්නේ අංක 4 - ගුණාත්මක අධ්‍යාපනයයි. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තිරසාර සංවර්ධන ඉලක්ක අංක 4 ට අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2019-2023 උපායමාර්ගික සැලැස්මේ හඳුනාගත් ඉලක්ක පෙළගස්වා ඇති අතර ප්‍රධාන අංශ පහක් යටතේ වෙනස්කම් සිදු කළ යුතු බවට ද හඳුනාගෙන ඇත;

- රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා වැඩි කිරීම.
- 21 වන සියවසේ පුරවැසිභාවය සඳහා අවශ්‍ය සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම මඟින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.
- ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුළින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ගුණාත්මක බවින් යුතු මානව සම්පත්, විශිෂ්ට පහසුකම් සහ තිරසාර / හරිත සංකල්ප වලින් සමන්විත වැඩිදියුණු කළ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සහතික කිරීම.
- ආරක්ෂිත, ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායී පාර්ශ්වකරුවන්ගේ සබඳතා තුළින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

ඒ අනුව, රටේ අපේක්ෂාවන් හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කරගත් ආර්ථිකයක් තුළ මානව අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සමඟ තිරසාර සංවර්ධන ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහිත ආයතනික අරමුණු මෙහිදී සැලකිල්ලට ගන්නා ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 01:** රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා වැඩි කිරීම.	1. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂක අධ්‍යයන වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල බඳවාගැනීම් තුළ 15%ක සමුච්චිත වර්ධන වේගයක් (CGR) ලබා ගැනීම.	ඉහළ වෙළඳපල ඉල්ලුමක් ඇති දැනට පවතින අධ්‍යයන පාඨමාලා සඳහා බඳවා ගැනීම් 5% කින් වැඩි කිරීම ශ්‍රම වෙළඳපොළේ ඉල්ලීම් මත පදනම්ව නව අධ්‍යයන පාඨමාලා සැලසුම් කිරීම සහ හඳුන්වා දීම	- රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන් (පවත්නා සහ නව යන දෙකම) සඳහා උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීමේ ප්‍රතිශතය වැඩි වීම.
		2. උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය මාස දෙකකින් අඩු කිරීම.	උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ උසස් අධ්‍යාපන ආයතනවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය අඩු කිරීම.	- උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය මාස 2ක් වැනි අඩු කාල පරාසයක් පවත්වා ගැනීම.
		3. දැනට පවතින අඩු ඉල්ලුමක් සහිත උපාධි (UG) පාඨමාලා, විභවය සහිත සිසුන් අතර ප්‍රවර්ධනය කිරීම.	උසස් අධ්‍යාපන ආයතනවල පුරප්පාඩු ගණන අඩු කිරීම.	- සෑම වසරකම අඩුම ඉල්ලුමක් සහිත යුනිකෝඩ් සඳහා ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩි කිරීම. - අවම ඉල්ලුමක් ඇති පාඨමාලා ඇතුළුව විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලාවල පුරප්පාඩු ප්‍රතිශතය අඩු කිරීම.
		4. ඉදිරි වසර 5 තුළ දැනට පවතින උපාධි අධ්‍යයන පාඨමාලා වල පුරප්පාඩු සංඛ්‍යාව 25% කින් අඩු කිරීම		- අවම ඉල්ලුමක් ඇති පාඨමාලා ඇතුළුව විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලාවල පුරප්පාඩු ප්‍රතිශතය අඩු කිරීම.

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		5. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා සඳහා විදේශීය සුදුසුකම් සහිතව ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව 8% කින් වැඩි කිරීම.	අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට අදාළ විය හැකි නව දේවල් ඉගෙන ගැනීමට සහ හවුල්කාරිත්වයන් ගොඩනැගීම සඳහා විදේශීය විශ්වවිද්‍යාල සමඟ සබඳතා ශක්තිමත් කිරීම. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ අධ්‍යයන වැඩසටහන් විදේශ රටවල් තුළ ප්‍රවර්ධනය කිරීම සහ ලංකාවේ අධ්‍යයන පාඨමාලා සඳහා විදේශීය සුදුසුකම් ඇති සිසුන් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම.	- පවතින ඉල්ලුම සමඟ උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කර ගන්නා විදේශීය සුදුසුකම් ලත් සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩිවීම. - ලොව පුරා සිටින හැකියාවන් සහිත අපේක්ෂකයින් අතර විදේශීය බඳවා ගැනීම් ප්‍රවර්ධනය කිරීමට ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. - පූර්ව ඉල්ලුමක් නොමැති එහෙත් විදේශීය අයදුම්පත් ලැබුණු උපාධි පාඨමාලා සංඛ්‍යාව
		6. රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන සුදුසුකම් ලත් සිසුන්ට පහසුකම් සැලසෙන විශේෂිත කර්මාන්ත ඉලක්ක කරගත් සහ තත්ත්ව නියාමනය කරන ලද බාහිර උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීම.	බාහිර උපාධි සම්බන්ධයෙන් වූ තත්ත්ව ආරක්ෂණ අත්පොත පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලය ඇතුළු සියලුම විශ්වවිද්‍යාල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	- රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන අය වෙනුවෙන් විශේෂයෙන් නිර්මාණය කරන ලද බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන්ගේ ප්‍රතිශතය.

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			UGC නියෝගවලට අනුකූලව සියලුම විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල බාහිර උපාධි වැඩසටහන් සහ ව්‍යාප්ති පාඨමාලාවල ප්‍රමිතීන් සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට එම ආයතන මෙහෙය වීම.	
			බාහිර උපාධි ස්ථාවර කමිටුව හරහා UGC නියෝග සමඟ විවෘත සහ දුරස්ථ ඉගෙනීම් ක්‍රමවේදය හරහා සියලුම විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන බාහිර අධ්‍යයන වැඩසටහන් අඛණ්ඩව සමාලෝචනය කිරීම.	
			බාහිර විභාග අංශ තුළ පාලන සහ කළමනාකරණ ක්‍රියා පටිපාටි අඛණ්ඩව සමාලෝචනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට සියලුම විශ්වවිද්‍යාල මෙහෙය වීම.	
			කණ්ඩායම් වැඩ, රැස්වීම් සහ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම.	
		7. රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන සිසුන් සඳහා, රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන සහ UGC පිළිගත් ආයතන හරහා ලබා දෙන UGC අනුමත	පොලිසිය සඳහා විශ්වවිද්‍යාලයක් / ඇකඩමියක් පිහිටුවීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම පහසුකම් සැලසීම	- විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන UGC අනුමත උපාධි වැඩසටහන් ලබා දීම සඳහා UGC පිළිගත් ආයතන පිහිටුවීම.

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		උපාධි පාඨමාලා හරහා 2023 වන විට තවත් උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.	අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 18ක් පීඨ ලෙස උසස් කිරීමට සහ ඊට අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පහසුකම් සැලසීම.	
			උසස් අධ්‍යාපන ආයතනවලට යටිතල පහසුකම් සහ මානව සම්පත් සපයමින් සිසුන් ඇතුළත් කිරීම වැඩි කිරීම.	
			සමුද්‍ර සේවා ක්ෂේත්‍රයේ උපාධි පිරිනැමීමට පුද්ගලික ආයතන ප්‍රතීතනය කිරීමට පහසුකම් සැලසීම සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම.	
			පෞද්ගලික ආයතනවලට ගුවන් සේවා ක්ෂේත්‍රයේ උපාධි පිරිනැමීමට ප්‍රතීතනය කිරීමට සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීමට පහසුකම් සැලසීම.	
			ඩිප්ලෝමා පාඨමාලා ප්‍රදානය කිරීම සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතන 10ක් පිහිටුවීම.	
			හෙද විද්‍යාල උපාධි පිරිනැමීමේ මට්ටමට උසස් කිරීමට පහසුකම් සැලසීම.	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			ආයුර්වේද විද්‍යාව සඳහා විශ්වවිද්‍යාලයක් පිහිටුවා ආයුර්වේද උපාධි ප්‍රදානය කරන ආයතන පීඨ ලෙස උසස් කිරීම.	-
			ජනමාධ්‍ය සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමට පහසුකම් සැලසීම සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම.	
			උපදේශන කමිටුවක් හරහා විශ්වවිද්‍යාල ව්‍යාපෘති යෝජනාව පිළිබඳ අවසන් තීරණයක් ගැනීම.	
			අවශ්‍ය නීතිමය රාමුව සකස් කිරීම.	
			අවශ්‍ය සම්පත් සුරක්ෂිත කිරීම.	
			අදාළ ජනාධිපති කාර්ය සාධක බළකාය විසින් නිර්දේශ කරන පරිදි හෙද විද්‍යාල උපාධි පිරිනමන ආයතන දක්වා උසස් කිරීමට අදාළ ක්‍රියාකාරකම්.	
			අදාළ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිර්දේශ කර ඇති පරිදි, ක්‍රීඩා අධ්‍යාපනය සඳහා කැප වූ උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීමට අදාළ ක්‍රියාකාරකම්.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		8. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි පාඨමාලාවලට බඳවා ගැනීමේදී 30% ක සමුච්චිත වර්ධන වේගයක් සඳහා පහසුකම් සැලසීම.	ශ්‍රම වෙලඳපොල නිරීක්ෂණයන් තුළින් ලැබෙන ප්‍රක්ෂේපන මත පදනම්ව, නැගී එන වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ නව පශ්චාත් උපාධි වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.	- වසරකට අනුමත කරන නව සහ අදාළ පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව.
			බටහිර වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෛද්‍යවරුන් සඳහා වන පශ්චාත් උපාධි අවස්ථා වැඩි කිරීම.	
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 02:** 21 වන සියවසේ පුරවැසිභාවය සඳහා අවශ්‍ය සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම මඟින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.	1. අවශ්‍ය අරමුදල් වෙන් කිරීම තුළින් 2023 වන විට එක් එක් රාජ්‍ය විශ්වවිද්‍යාලවල විනෝදාත්මක හා සංස්කෘතික පහසුකම් සහ සෞන්දර්යාත්මක පරිසරය වැඩිදියුණු කිරීම.	UGC හි නිලධාරීන්ගේ කෑම කාමරය ප්‍රතිසංස්කරණය කිරීම.	- එකතු කරන ලද / වැඩිදියුණු කළ විනෝදාත්මක / සංස්කෘතික පහසුකම් සහ / හෝ වඩා හොඳ සෞන්දර්යාත්මක පරිසරයක් සහිත රාජ්‍ය විශ්වවිද්‍යාල සංඛ්‍යාව
			ගබඩාව අලුත්වැඩියා කිරීම.	
			UGC ගොඩනැගිලිවල තීන්ත ආලේප කිරීම.	
			UGC සඳහා ඇමතුම් / තොරතුරු මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම.	
			UGC සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අදාළ මූලික කටයුතු සිදු කිරීම.	
			UGC හි ප්‍රධාන රැස්වීම් කාමරයේ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය පද්ධතිය නැවත සකස් කිරීම.	
			UGC පරිශ්‍රයේ නව දුරකතන පද්ධතියක් (PABX) සැපයීම සහ ස්ථාපනය කිරීම.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			UGC හි LAN පද්ධතියේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.	
			විශ්වවිද්‍යාල 15 හි සම්පත් භාවිතය සහ පවතින සම්පත් පිළිබඳ සමීක්ෂණය.	
			රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම.	
		2. විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ ඉගෙනුම් පරිසරය සඳහා අවශ්‍ය භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම	ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය සහ සමාලෝචනය	- රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සඳහා වාර්ෂික අයවැයේ ප්‍රතිශතය වැඩිවීම.
			යටිතල පහසුකම් අවශ්‍යතා සමාලෝචනය කර විශ්ලේෂණය කිරීම	
		3. සියලුම විශ්වවිද්‍යාල සිසුන් සඳහා සාධාරණ සම්පත් ප්‍රවේශයක් ලබාදීම සඳහා වන මූලික පියවර හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.	විශ්වවිද්‍යාල 15 හි සම්පත් භාවිතය සහ සම්පත් ලබා ගැනීම පිළිබඳ සමීක්ෂණය	- සම්පත් ලබා ගැනීමේ/භාවිත කිරීමේ සමීක්ෂණයක් සාර්ථකව නිම කරන ලද රාජ්‍ය විශ්ව විද්‍යාල සංඛ්‍යාව.
			රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම	- විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සම්පත් සැලැස්මේ ඉම් ලකුණු සලකුණු කිරීම.

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		4. උසස් අධ්‍යාපන ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් කාලෝචිත අරමුදල් ගලායාම වැඩිදියුණු කිරීම.	වාර්ෂික අයවැය සඳහා අනුමැතිය	- වසරකට පවත්වනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව. - වසරකට උසස් අධ්‍යාපන ආයතන වෙත සිදු කරන ක්ෂේත්‍ර චාරිකා ගණන. - වසරක් තුළ භාණ්ඩාගාරය / උසස් අධ්‍යාපන අමාත්‍යාංශය / කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන වාර්තා සංඛ්‍යාව - වසරක් තුළ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විශ්වවිද්‍යාල මූල්‍යකරණය පිළිබඳ ප්‍රගති වාර්තා සංඛ්‍යාව
			UGC සඳහා මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය හඳුන්වා දීම	
		5. අභිරුචිකරණය කරන ලද මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියක් (FMIS) හඳුන්වා දීමෙන් මූල්‍ය කාර්යයන් උපාය මාර්ගික කළමනාකරණයට පහසුකම් සැලසීම.	ශක්තිමත් කරන ලද ලේඛන කළමනාකරණ පද්ධතිය	- UGC හි මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියක් (FMIS) තිබීම.
			මූල්‍ය අංශය 5 S ක්‍රමය අනුව සකස් කිරීම.	
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 03:** ගෝලීය පරිසරයක් තුළ	1. වැඩසටහන්වල අදාලත්වය සහතික කිරීම සහ වෙළඳපොළ ඉල්ලුමට ගැලපෙන පරිදි නව අධ්‍යයන පාඨමාලා සංවර්ධනය කිරීම	ශ්‍රම වෙළෙඳපොළ නිරීක්ෂණ අනුව දැනට පවතින අධ්‍යයන පාඨමාලා සංශෝධනය කිරීම.	- වෙළඳපොළ ඉල්ලුම් ප්‍රවණතා සපුරාලීමට අනුමත කරන ලද, නව වෙනස්කම් කරන ලද උපාධි පාඨමාලා

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
	සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුළින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.	සහ දැනට පවතින පාඨමාලාවල විෂයමාලාවන් සංශෝධනය කිරීම.	ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුම මත පදනම්ව නව අධ්‍යයන පාඨමාලා සැලසුම් කිරීම සහ හඳුන්වා දීම.	ප්‍රතිශතය. - නව උපාධි වැඩසටහන් සඳහා මාර්ගගත යෝජනා ඉදිරිපත් කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම සහ නව පීඨ/ අධ්‍යයනාංශ පිහිටුවීම.
			නව සහ පවතින උපාධි පාඨමාලා සඳහා වන යෝජනාවල ගුණාත්මකභාවය පිළිබඳ වාර්තාව.	- ඉල්ලුම වැඩි දියුණු කිරීම සහ වෙළඳපල අදාළත්වය සහතික කිරීම සඳහා දැනට පවතින සංශෝධනය කර ඇති අධ්‍යයන පාඨමාලා සංඛ්‍යාව.
			නව උපාධි වැඩසටහන්, අධ්‍යයනාංශ සහ පීඨ අනුමත කිරීම සඳහා UGC හි මාර්ගගත ක්‍රමය අනුගමනය කිරීමට පහසුකම් සැලසීම.	
		2. උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උපාධි වැඩසටහන් බෙදා හැරීමේ ක්‍රම දෙක හඳුන්වා දීම.	උපාධි පාඨමාලා බෙදාහැරීමේ ක්‍රමවලට අදාළ උසස් අධ්‍යාපන ආයතනයන් හි වර්තමාන තත්ත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීම.	- පාර්ශ්වීය ප්‍රවේශ / ඉගෙනුම් අධ්‍යයන සම්භාර පැවරුම් ප්‍රතිපාදන අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා ගණන
			පාර්ශ්වීය ප්‍රවේශ (lateral entry) සහ පෙර ඉගෙනුම් අධ්‍යයන සම්භාර හුවමාරුව හඳුනාගැනීම සඳහා මාර්ගෝපදේශ.	
			උසස් අධ්‍යාපනයට ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උපාධි වැඩසටහන් බෙදා හැරීමේ ක්‍රම දෙක හඳුන්වා දීම.	
		3. උපාධි අපේක්ෂක සිසුන්ගේ පුද්ගලික සහ අවශ්‍ය කුසලතා සංවර්ධනය සඳහා	විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශ ඒකකවල කාර්ය සාධනය බැලීමට ලකුණු කාඩ්පත් පද්ධතිය සකස් කිරීම.	- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලවල පීඨ වෘත්තීය

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශ ඒකක (CGU) හරහා ව්‍යුහගත සැලසුම් ක්‍රියාත්මක කිරීම.		මාර්ගෝපදේශ ඒකක හරහා උපාධි අපේක්ෂකයන් සඳහා පවත්වන ලද පුද්ගලික හා මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන් ගණන.
			කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුහුණු අවස්ථා සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ඒකක වෙත පුහුණුව ලබා දීම.	- විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශ ඒකක හි උපදේශකයින් / කාර්ය මණ්ඩලය සඳහා UGC විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සහ/හෝ වැඩමුළු ගණන.
			UTEL පරීක්ෂණ සේවාව ස්ථාපිත කිරීම.	- වාර්ෂිකව ශිෂ්‍ය උපදේශකයින් / උපදේශකයින් ලෙස පත් කෙරෙන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය.
				- ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) පවත්වන කුටි සහ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය තුළ පිහිටුවීම.
				- සමස්ත විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂක ශිෂ්‍ය ජනගහනයෙන් වසරකට UTEL පරීක්ෂණවලට පෙනී සිටින සිසුන්ගේ ප්‍රතිශතය.
		4. කියවීමේ පුරුද්දේ වැදගත්කම වැඩි දියුණු කිරීම සහ විශ්වවිද්‍යාල තුළ පවතින විද්‍යුත් පුස්තකාල පද්ධති සහ අනෙකුත් පහසුකම්	විද්‍යුත් පුස්තකාලවලට අදාළව උසස් අධ්‍යාපන ආයතනයන් හි වත්මන් තත්ත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීම.	- පර්යේෂණ දත්ත සමුදායන්, රචනා සොරකම් (plagiarism) පිලිබඳ මෘදුකාංග සහ විද්‍යුත් පොත්වල ශිෂ්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම.	විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා රචනා හිමිකම සොරකම් විරෝධී මෘදුකාංග (Anti-plagiarism Software) සැපයීම	වැඩිදියුණු කිරීම.
		5. කොමිෂන් සභා චක්‍රලේඛ 933 හි සඳහන් පරිදි ශිෂ්‍ය ආධාර සේවා ශක්තිමත් කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිසුන්ගේ ඉගෙනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම	ශිෂ්‍ය සහාය පද්ධතිවල පවතින තත්ත්වය හඳුනාගෙන ශක්තිමත් කිරීමට පහසුකම් සැලසීම.	- ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 933 කොමිෂන් සභා චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම.
			තත්ත්ව ආරක්ෂණ කටයුතු සඳහා සිසුන් සම්බන්ධ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.	
		6. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි ක්‍රියාත්මක කිරීම තුළින් ඵලදායී විශ්වවිද්‍යාල-කාර්මික හවුල්කාරිත්වයක් ඇති කිරීම, ගෝලීය සහ ජාතික අවශ්‍යතා ඇති ක්ෂේත්‍රවල පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හා සිසුන් සවිබල ගැන්වීම.	උපාධිධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා තිරසාර ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමට සහ කුසලතා නොගැලපීම අඩු කිරීමට දායක වීමට UGC හි ස්ථාවර කමිටු වෙත පුද්ගලික අංශයේ නියෝජිතයන් ඇතුළත් කිරීම.	- පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා පහසුකම් සැලසීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පිහිටුවා ඇති ක්‍රියාකාරී විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි සංඛ්‍යාව. - රාජ්‍ය / පෞද්ගලික අංශය සමඟ සහයෝගයෙන් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන දෙකක් හෝ වැඩි ගණනක් එක්ව සංවිධානය කරන ලද UGC පහසුකම් සපයන මහජන දැනුවත් කිරීමේ සැසි සංඛ්‍යාව
			විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.	
			පවතින පශ්චාත් උපාධි පර්යේෂණ යෝජනා ක්‍රම සඳහා අයදුම් කිරීමට විද්වතුන්ට ආරාධනා කිරීම.	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			පශ්චාත් උපාධි පර්යේෂණ ප්‍රදාන ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රසිද්ධ විදේශීය විශ්වවිද්‍යාල හඳුනා ගැනීම.	
			තරුණ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීමට අවස්ථා ලබා දීම සහ දිරිගැන්වීම.	
			කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රතිපාදනවලින් විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතන සඳහා පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරීම.	
		7. රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් සපයනු ලබන උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය ඉහළ නැංවීම.	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ට/ සිසුන්ට අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම.	- 2023 වන විට විශ්වවිද්‍යාල සේවාවන්හි අභ්‍යන්තර පාර්ශවකරුවන්ගේ තක්සේරුවේදී අවම වශයෙන් 80% තෘප්තිමත් ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම.
			විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා හරහා උසස් අධ්‍යාපන ආයතන සමඟ සබඳතා ඇති කර ගැනීමට බාහිර පාර්ශ්වකරුවන්ට අවස්ථා ලබා දීම.	- 2023 වන විට විශ්වවිද්‍යාල ප්‍රතිදානයේ බාහිර පාර්ශ්වකරුවන්ගේ තක්සේරුවෙහි අවම වශයෙන් 75% තෘප්තිමත් ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම.
		8. UGC යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතන සහ ඔවුන් විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් ගෝලීයව සහ දේශීයව	විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව සහතික ක්‍රියාකාරකම් සඳහා සහාය වීම.	- කාර්ය සාධන ලකුණු කාඩ්පත සඳහා 75%කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගත් UGC යටතේ පවතින උසස් අධ්‍යාපන

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල බව අඛණ්ඩව පරීක්ෂා කිරීම, අධීක්ෂණය සහ සංවර්ධනය තුළින් සහතික කිරීම.	පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශයන් සංවර්ධනය කිරීම.	ආයතනවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක (IQAU) ප්‍රතිශතය. - SLQF අනුව සිතියම්ගත කර ඇති උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර උපාධි, බාහිර උපාධි සහ පශ්චාත් උපාධි) උපාධි වැඩසටහන් ප්‍රතිශතය. - ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන (නව සහ 25% 75% 100% උසස් කරන ලද යන දෙකම ඇතුළුව) විෂයයන් සඳහා සකස් කර ඇති අවශය ඉම් ලකුණු ප්‍රකාශවල ප්‍රතිශතය. - වර්ෂය තුළ නිකුත් කරන ලද උසස් අධ්‍යාපන ආයතනයන් හි ආයතනික සමාලෝචන වාර්තා ගණන. - වර්ෂය තුළ නිකුත් කරන ලද උසස් අධ්‍යාපන ආයතනයන් හි වැඩසටහන් සමාලෝචන වාර්තා ගණන.
			ආයතනික සමාලෝචන පැවැත්වීම.	
			වැඩසටහන් සමාලෝචන පැවැත්වීම.	
			ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) අනුව දැනට පවතින සියලුම අධ්‍යයන පාඨමාලා සංශෝධනය කර නැවත නම් කිරීම සහ ඒ අනුව අත්පොත යාවත්කාලීන කිරීම.	
			SLQF 2015 අනුව විශ්වවිද්‍යාල සුදුසුකම් සිතියම්ගත කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම.	
			මනා ලෙස පාලනය කරන ලද සමකාලික අධ්‍යයන දින දර්ශනයක් පවත්වා ගැනීමට විශ්වවිද්‍යාලවලට සහාය වීම.	
			උසස් අධ්‍යාපනයේ තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ජාතික අධ්‍යයන සමුළුවක් ආරම්භ කිරීම	
			UGC යටතේ සුදුසුකම් තහවුරු කිරීම සඳහා ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම.	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			සාගර විශ්වවිද්‍යාලය සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර ප්‍රමිතියට ඉහල නැංවීමට සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම.	
ගුණාත්මක අධ්‍යාපනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානතාව	**ඉලක්ක අංක 04:** කාර්යක්ෂම හා ගුණාත්මක බවින් යුතු මානව සම්පත්, විශිෂ්ට පහසුකම් සහ තිරසාර / හරිත සංකල්ප වලින් සමන්විත වැඩිදියුණු කළ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සහතික කිරීම.	1. ඉදිරි වසර 5 තුළ විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සෑම තරාතිරමකම හැකි උපරිම දක්ෂතා ඇති විවිධ ශ්‍රම බලකායන් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම සහතික කිරීම.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි මානව ප්‍රාග්ධනයේ නිපුණතා සහ විශේෂඥතාව වර්ධනය කිරීම.	- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සපුරාලීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතියේ සියලුම කාර්ය මණ්ඩලවල බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සංශෝධනය කිරීම. - සුදුසුකම් තහවුරු කිරීමේ පළමු උත්සාහයේදීම සේවයේ ස්ථිර කරන ලද විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය
			කාර්ය මණ්ඩල කාණ්ඩ බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සංශෝධනය කිරීම.	
			පවතින පශ්චාත් උපාධි පර්යේෂණ යෝජනා ක්‍රම සඳහා අයදුම් කිරීමට අධ්‍යාන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ආරාධනා කිරීම.	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		2. පුහුණුව හා සංවර්ධනය තුළින් දැනට සිටින විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය තුළ ඇති විභව දක්ෂතා හඳුනාගැනීමට හා ඒවා පෝෂණය කිරීම සඳහා ක්‍රියා කිරීම ආරම්භ කිරීම.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි මානව ප්‍රාග්ධනයේ නිපුණතා සහ විශේෂඥතාව වර්ධනය කිරීම.	- දේශීය රැකියා ආශ්‍රිත පුහුණුව සහිත පරිපාලන නිලධාරීන්ගේ සංචිත ප්‍රතිශතය - විදේශ රැකියා ආශ්‍රිත පුහුණුවක් සහිත පරිපාලන නිලධාරීන්ගේ සංචිත ප්‍රතිශතය. - UGC හරහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට ලබා දෙන ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව ප්‍රතිශතය.
			පශ්චාත් උපාධි/ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට පරිපාලන නිලධාරීන්ට පහසුකම් සැලසීම.	- පරිපාලන කාර්ය මණ්ඩලයට UGC හරහා ලබා දෙන ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව ප්‍රතිශතය. - පශ්චාත් උපාධි සහ/හෝ වෘත්තීය සුදුසුකම් ඇති පරිපාලන නිලධාරීන්ගේ ප්‍රතිශතය.

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		3. අඩු කාර්ය සාධනයක් සහිත කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව වැඩි කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සේවක සුභසාධනය ක්‍රියාකාරී ලෙස වැඩිදියුණු කිරීම.	විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සේවක සුභසාධනය ක්‍රියාශීලීව ඉහළ නැංවීමට සහ ඌන කාර්ය සාධන කාර්ය මණ්ඩලය අඩු කිරීමට පද්ධතිය සමාලෝචනය කිරීම.	- ආචර්තිතා කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම්වල මුළු ලකුණු 5 ක් වූ මිනුමෙන්, අවම වශයෙන් ලකුණු 3ක් ලබා ගන්නා කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය. - සේවක සුභසාධනය සහ තෘප්තිය පිළිබඳ සමීක්ෂණයකදී > 75% ක ලකුණු ලබා ගන්නා විශ්වවිද්‍යාල සංඛ්‍යාව. - UGC හි නීති අංශය විසින් මෙහෙයවනු ලබන සේවකයන් සම්බන්ධ නීති/උසාවි නඩු ගණන.
		4. විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පීඩාවකින් සහ වෙනස් කොට සැලකීමකින් තොරව තම කටයුතු කරගෙන යාමට ඉඩ සලසන සංස්කෘතියක් සහ පරිසරයක් විශ්වවිද්‍යාල තුළ ඇති කිරීමට පහසුකම් සැලසීම.	සියලුම විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය සහ නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සුදුසු ව්‍යුහයන් / පද්ධති පිහිටුවීම / සංවර්ධනය කිරීම සඳහා උපදේශනාත්මකව පහසුකම් සැලසීම.	- නවක වදයෙන් තොර, විශ්වවිද්‍යාල තුළ හිතකර සහ ආරක්ෂිත ඉගෙනුම් පරිසරයක් පිළිබඳව සිසුන් විසින් කළ ඇගයීම්වල තෘප්තිමතභාවයේ ප්‍රතිශතය. - ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන්

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			පර්යේෂණ - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) මර්දනය කිරීම සඳහා මැදිහත්වීම් සහ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම / යෝජනා කිරීම (UNICEF අරමුදල් තුලින්).	(SGBV) නිදහස් විශ්වවිද්‍යාල පරිසරයක් පිළිබඳව සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ තෘප්තිමත් බවේ ප්‍රතිශතය.
			නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ එහි සමාජීය සහ නෛතික ප්‍රතිවිපාක පිළිබඳ මුද්‍රිත සහ / හෝ විද්‍යුත් මාධ්‍ය භාවිතා කරමින් නවක වදයට සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමේ වැඩසටහන් සම්බන්ධ ප්‍රචාරණය.	
			විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම/ශක්තිමත් කිරීම සහ සිසුන් සහ කාර්ය මණ්ඩල ජනතාව අතර නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට අදාලව දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය පිළිබඳව දැනුවත් කිරීම සහ පැමිණිලි / වාර්තා කිරීම ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම.	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			සියලුම උසස් අධ්‍යාපන ආයතන වෙතින් නවක වදය ඉවත් කිරීමට පහසුකම් සැලසීම.	
		5. විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සිටින අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතාව සහ වෘත්තීය සංවර්ධනය සඳහා පැහැදිලි මඟ පෙන්වීමක් සහ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම.	විශ්වවිද්‍යාලවල සිටින සියලුම කායික අශක්නුතාවන් සහිත සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට ප්‍රවේශ ප්‍රතිපාදන සැපයීමට උපදෙස් නිකුත් කිරීම.	- වෘත්තීය සහ කළමනාකරණ කුසලතා සංවර්ධනය ඉලක්ක කරගත් අභිරුචි කළ වැඩසටහන් හරහා වාර්ෂිකව පුහුණු කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව.
			පරිපාලන සහ අනෙකුත් විධායක නිලධාරීන්ට පශ්චාත් උපාධි සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට පහසුකම් සැලසීම.	
			පවතින ක්‍රියා පටිපාටි සමාලෝචනය කර අධ්‍යයන ආයතන කාර්යයන් සඳහා වඩා හොඳ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම.	
		6. විවිධ හැකියාවන් ඇති සිසුන් සඳහා මිත්‍රශීලී පරිසරයක් ඇතුළු පහසුකම් සඳහා වන ප්‍රමිතීන් සහිත දේශන කාමර සහ විද්‍යාගාර ඇතුළු විශ්වවිද්‍යාල පහසුකම් නවීකරණය කිරීම සඳහා පුළුල් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.	විශ්වවිද්‍යාලවල සිටින සියලුම ආබාධිත සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට ප්‍රවේශ්‍යතා ප්‍රතිපාදන සැපයීමට උපදෙස් නිකුත් කිරීම.	- 50% ට වැඩි නවීකරණය කරන ලද සහ විවිධ ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රවේශය සහිත උසස් ප්‍රමිතියෙන් යුත් දේශන කාමර/ රසායනාගාර පහසුකම් සහිත විශ්වවිද්‍යාල සංඛ්‍යාව.
			විවිධ ආබාධ සහිත සිසුන් පොදු විභාගවලට මුහුණ දෙන විට ඔවුන්ට උපකාර කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් පැවැත්වීම.	
			දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රය ජාත්‍යන්තර මට්ටමින් සන්නාමගත කිරීමේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			විශ්වවිද්‍යාල සහ අනෙකුත් ආයතන අතර සංවෘත හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම.	
			නේවාසිකාගාර පහසුකම් ලබා ගැනීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයක් ඇති කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම.	
		7. උසස් අධ්‍යාපන ආයතනවල පහසුකම්, ඉගෙනුම් පරිසරය සහ කාර්ය මණ්ඩල සේවා අවශ්‍ය ප්‍රමිතීන් / මට්ටම්වලින් සාක්ෂාත් කර ගැනීමට සහ පවත්වා ගැනීමට අවශ්‍ය පියවරයන් සමඟින් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ශක්තිමත් තත්ත්ව ආරක්ෂණ සංස්කෘතියක් ගොඩනැගීම.	විශ්වවිද්‍යාල නිරීක්ෂණය කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ මණ්ඩල වෙත විදේශීය තත්ත්ව ආරක්ෂණ විශේෂඥයින් හඳුන්වා දීම.	- උසස් අධ්‍යාපන ආයතනවල පහසුකම් / ඉගෙනුම් පරිසරය / ඉගැන්වීමේ ගුණාත්මකභාවය / උපකාරක සේවා පිළිබඳ ශිෂ්‍ය තෘප්තිමත්බව පිළිබඳ සමීක්ෂණයකින් > 80% ක ලකුණු ලබා ගන්නා විශ්වවිද්‍යාල සංඛ්‍යාව.
			උසස් අධ්‍යාපන ආයතනයන්හි ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් සංස්කෘතිය වැඩිදියුණු කිරීම සඳහා සියලුම ඉගැන්වීම් මොඩියුලවල ගුරු - ශිෂ්‍ය අනුපාතයේ වත්මන් සම්මතයන් සමාලෝචනය කිරීම.	
			විශ්වවිද්‍යාලවල පීඨ හා අධ්‍යයනාංශ තුල දේශන ශාලා / රසායනාගාර බෙදාගැනීමේ යාන්ත්‍රණය. උදාහරණයක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විද්‍යාගාරයේ තාක්ෂණ පීඨය මෙම මූලධර්මය අනුගමනය කළේය.	
			පීඨ / විශ්වවිද්‍යාලවලට වාර්ෂික සිසුන් බඳවා ගැනීම් වැඩි කිරීම.	

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		8. තිරසාර විසඳුම් භාවිතා කරන විශ්වවිද්‍යාල ප්‍රජාවන් සමඟ පාරිසරික වශයෙන් සෞඛ්‍ය සම්පන්න සහ හරිත උසස් අධ්‍යාපන ආයතන ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම.	හරිත සංකල්පය ප්‍රවර්ධනය කරන අතරම අනාගත ව්‍යාපෘති ගොඩනැගීමේදී පරිසර හිතකාමී වීමට උපදෙස් නිකුත් කිරීම.	- විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන පරිශ්‍රයන් තුළ නව ගස් 5,000ක් සිටුවීමට සහ ඒවා රැකබලා ගැනීමට සැලසුම් කිරීම.
			හරිත සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා UGC ලේකම් කාර්යාලයේ ස්ථාන හඳුනා ගැනීම.	- අවම වශයෙන් තම විදුලි පරිභෝජනයෙන් 25%ක් සඳහා පුනර්ජනනීය සූර්ය බලශක්තිය භාවිතා කරන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව
			තාක්ෂණ පීඨ "සුහුරු පීඨ" ලෙස පරිවර්තනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් පැවැත්වීම.	- තම පරිශ්‍රය තුළ ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් භාවිතා කරන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව.
				- රාජ්‍ය පද්ධතිය තුළ ඇති කඩදාසි භාවිතය > 50% අඩු කල විශ්වවිද්‍යාල සංඛ්‍යාව
				- රාජ්‍ය විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවලින් සහභාගිවන්නන් සඳහා UGC විසින් පවත්වනු ලබන වීඩියෝ සම්මන්ත්‍රණ රැස්වීම්වල ප්‍රතිශතය.
				- සිසුන්ගේ / කාර්ය මණ්ඩලයේ පාරිසරික වගකීම පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා UGC විසින් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්වනු ලබන හරිත සංකල්පය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව.

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
				- තිරසාර / හරිත සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා UGC හි මුදල් අංශය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග සංඛ්‍යාව.
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 05:** ආරක්ෂිත, ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායී පාර්ශ්වකරුවන්ගේ සබඳතා තුළින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.	1. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වත්මන් අවශ්‍යතා සහ ප්‍රවණතා සඳහා සහාය වීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මෙන්ම UGC / උසස් අධ්‍යාපන ආයතනවල ආයතනික සංග්‍රහය හා ආයතනික නියමාවලින් සහතික කිරීම.	උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වත්මන් අවශ්‍යතා සහ ප්‍රවණතා සඳහා සහාය වීමට පනත සංශෝධනය කිරීම.	- වර්තමාන හා අනාගත උසස් අධ්‍යාපන අවශ්‍යතාවන්ට සරිලන පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහය සහ ආයතනික නියමාවලීන් සමාලෝචනය කර යාවත්කාලීන කිරීම.
		2. UGC හි විනිවිදභාවය වැඩි දියුණු කරන සහ පරිපාලන / නියාමන භූමිකාවට පහසුකම් සපයන පද්ධති, ප්‍රතිපත්ති සහ තාක්ෂණික ආධාර හඳුන්වා දීම.	පරිගණකගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම. විශ්වවිද්‍යාල පාලක සභා සඳහා සාමාජිකයන් තේරීම පිණිස ඉම් ලකුණු ක්‍රමයක් හෝ සුදුසුකම් නිර්ණායක සකස් කිරීම.	- සියලුම උසස් අධ්‍යාපන ආයතනවල සජීවී දත්ත සමඟ ඒකාබද්ධ සහ ආරක්ෂිත කළමනාකරණ දත්ත පද්ධති සංවර්ධනය කිරීම. - උසස් අධ්‍යාපන ආයතන සඳහා එම ආයතනවල ප්‍රගතිය සහ අනුකූලතාවය UGC සිට දුරස්ථව නිරීක්ෂණය කළ හැකි පරිදි තොරතුරු තාක්ෂණ පදනම් කරගත් වත්කම් සහ යටිතල පහසුකම් නඩත්තු පද්ධතිය ක්‍රියාත්මක කිරීම. - විශ්වවිද්‍යාල පාලක සභා සඳහා පත් කරන ලද සාමාජිකයින් සඳහා ඉම්

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.	ලකුණු ක්‍රමයක් හෝ සුදුසුකම් නිර්ණායක සකස් කිරීම.
		3. යහ කළමනාකරණ භාවිතයන් සහ පාලනය ශක්තිමත් කරන විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විනිවිදභාවය සහ අධ්‍යයන වගවීම සක්‍රීය කිරීම.	අධ්‍යයන වගවීම පිළිබඳ පොදු මාර්ගෝපදේශ සකස් කිරීම.	- අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අවම වැඩ සම්මතයන් සහ ආචාර ධර්ම හඳුන්වා දීම සහ ලේඛනගත කිරීම.
		4. UGC හි විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශය විසින් සකසන ලද අතිශය රහසිගත දත්තවල ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය ශක්තිමත් කිරීම.	මාර්ගගත යෙදවුම් පද්ධතිය උසස් කිරීම.	- UGC හි විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශය සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.
			විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශය සඳහා නව ආරක්ෂක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.	
		5. යහපාලනය වැඩිදියුණු කිරීම සඳහා අද්විතීය මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් සහ ක්‍රියා පටිපාටි හඳුන්වා දීම.	සම්මත ගිණුම්කරණ සහ වාර්තාකරණ ආකෘතිය - පොදු වැටුප් ගෙවීම් පද්ධතිය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.	- UGC / උසස් අධ්‍යාපන ආයතනයන් හි මූල්‍ය කාර්යයන් සඳහා හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලද සම්මත වාර්තාකරණ ආකෘති (SRFs) ගණන. - UGC / උසස් අධ්‍යාපන ආයතනයන් හි මූල්‍ය කාර්යයන් සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) හඳුන්වාදීම.
		6. 2023 වන විට UGC සහ උසස් අධ්‍යාපන ආයතනයන් සඳහා ප්‍රතිචාරාත්මක මූල්‍ය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම.	UGC සඳහා මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය හඳුන්වා දීම.	- පරිගණකගත විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් සහ සේවක අර්ථසාධක අරමුදල් පද්ධතියක වැඩිදියුණු කළ අනුවාදයක්

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
				ක්‍රියාත්මක කිරීම. - විශ්‍රාම වැටුප් අරමුදල සඳහා නියමාවලියක් හඳුන්වා දීම.
		7. එක් එක් විශ්වවිද්‍යාලවල පීඨ මට්ටමින් ආදි ශිෂ්‍ය ප්‍රජාවන් සමඟ ජීවිත කාලය පුරාවටම, අර්ථවත් සහ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් සබඳතා ඇති කර ගැනීම.	විශ්වවිද්‍යාල පද්ධතියේ පාර්ශ්වකරුවන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායක සබඳතා සමඟ සබඳතා ශක්තිමත් කිරීම.	- ජයග්‍රහණ සහ අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගය දක්වන ආදි ශිෂ්‍ය සංගම් සහිත රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ පීඨ ප්‍රතිශතය.

අවුරුදු

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ඨතාවයක් ඇති දැක් වූ සිසුන් සඳහා වන විශේෂ ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාන් සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව

ඇමුණුම I

		විශේෂ		
		නව	පැරණි	එකතුව
1	වෛද්‍ය විද්‍යාව	8	1	9
2	දන්ත ශල්‍ය විද්‍යාව	1	1	2
3	පශු වෛද්‍ය විද්‍යාව	1	0	1
4	කෘෂිකර්මය	3	0	3
5	ආහාර විද්‍යාව හා පෝෂණය	1	0	1
6	ජෛවීය විද්‍යාව	6	1	7
7	ව්‍යවහාරික විද්‍යාව (ජෛවීය විද්‍යා)	2	0	2
8	ඉංජිනේරු විද්‍යාව	10	0	10
9	ඉංජිනේරු විද්‍යාව (EM)	1	0	1
10	ඉංජිනේරු විද්‍යාව ™	1	0	1
11	ප්‍රමාණ සමීක්ෂණය	1	0	1
12	පරිගණක විද්‍යාව	3	0	3
13	භෞතීය විද්‍යාව	11	0	11
14	මිනුම් විද්‍යාව	1	0	1
15	ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යාව)	4	0	4
16	කළමනාකරණය	27	0	27
17	දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය	1	0	1
18	වාණිජ්‍යය	4	0	4
19	කලා	28	1	29
20	කලා (SP) - ජනමාධ්‍ය	1	0	1
21	කලා (SAB) –A	1	0	1
22	කළමනාකරණ අධ්‍යයන (TV) –A	1	0	1
23	වාස්තු විද්‍යාව	1	0	1
24	නිර්මාණවේදය	1	0	1
25	නීතිය	2	0	2
26	තොරතුරු තාක්ෂණය	1	1	2
27	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය	1	0	1
28	කළමනාකරණය (රාජ්‍ය) විශේෂ	1	0	1
29	සන්නිවේදන අධ්‍යයන	1	0	1
30	නගර හා ග්‍රාම නිර්මාණය	1	0	1
31	සාමය හා ගැටුම් නිරාකරණය	0	0	0
32	ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	2	0	2
33	යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	0	0	0
34	විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය	0	0	0

		විශේෂ		
		නව	පැරණි	එකතුව
35	ආහාර විද්‍යාව හා තාක්ෂණය	1	1	2
36	සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	1	0	1
37	භෙද	2	0	2
38	තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය	1	0	1
39	කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය	1	0	1
40	කළමනාකරණ අධ්‍යයන (TV) –B	1	0	1
41	කලා (විශේෂ) - ප්‍රාසංගික කලා	1	0	1
42	කලා (SAB) - B	1	0	1
43	පරිවර්තන අධ්‍යයනය (යාපනය වි.වි.)	0	0	0
44	සංගීතය (ස්වාමී විපුලානන්ද සෞ.අ.ආ.)	0	0	0
45	නර්තනය (ස්වාමී විපුලානන්ද සෞ.අ.ආ.)	1	0	1
46	සංගීතය (සෞන්දර්ය කලා වි.වි.)	11	0	11
47	නර්තනය (සෞන්දර්ය කලා වි.වි.)	11	1	12
48	නාට්‍ය හා රංග කලා (සෞන්දර්ය කලා වි.වි.)	2	0	2
49	සෞඛ්‍ය ප්‍රවර්ධන	0	0	0
50	ඖෂධ විද්‍යාව	1	0	1
51	වෛද්‍ය රසායනාගාර විද්‍යා	1	1	2
52	විකිරණ ශිල්පය	0	0	0
53	භෞත චිකිත්ස	1	1	2
54	පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	1	0	1
55	පහසුකම් කළමනාකරණය	1	0	1
56	ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය	1	0	1
57	අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව	1	1	2
58	කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය	1	0	1
59	සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	1	0	1
60	ධීවර සහ සාගර විද්‍යාව	1	0	1
61	ඉස්ලාම් අධ්‍යයනය	1	0	1
62	විද්‍යාව හා තාක්ෂණය	1	0	1
63	පරිගණක විද්‍යාව හා තාක්ෂණය	1	0	1
64	ව්‍යවසායකත්වය සහ කළමනාකරණය	1	0	1
65	සත්ත්ව පාලන විද්‍යාව	1	0	1
66	සංගීතය (රාමනාදන් ඇකඩමිය)	1	0	1
67	සංගීතය (රාමනාදන් ඇකඩමිය)	1	0	1
68	චිත්‍ර සහ නිර්මාණ (රාමනාදන් ඇකඩමිය)	1	0	1
69	නාට්‍ය හා රංග කලා (ස්වාමී විපුලානන්ද සෞ.අ.ආ.)	0	0	0

		විශේෂ		
		නව	පැරණි	එකතුව
70	දෘශ්‍ය හා තාක්ෂණික කලා (ස්වාමී විපුලානන්ද සෞ.අ.ආ.)	0	0	0
71	අපනයන කෘෂිකර්මය	1	0	1
72	තේ තාක්ෂණය සහ අගය වැඩිකිරීම	1	0	1
73	කාර්මික තොරතුරු තාක්ෂණය	0	0	0
74	ඛනිජ සම්පත් සහ තාක්ෂණය	1	0	1
75	ව්‍යාපාර තොරතුරු පද්ධති (ගෞරව)	1	0	1
76	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (අග්නිදිග වි.වි)	1	0	1
77	ආගනණය සහ තොරතුරු පද්ධති	1	0	1
78	ශාරීරික අධ්‍යාපනය	1	0	1
79	ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	1	0	1
80	කථන ගා ශ්‍රවන විද්‍යා	1	0	1
81	අරාබි භාෂාව	0	0	0
82	දෘශ්‍ය කලා (සෞන්දර්ය කලා වි.වි.)	1	1	2
83	සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව	0	1	1
84	ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය	0	0	0
85	ජලජ සම්පත් තාක්ෂණය	0	0	0
